# 5

# විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

## 5.1 සමස්ත නිරීක්ෂණ


**2012 වසරේ දී ක්‍රියාත්මක කරන ලද පූර්වෝපායික ප්‍රතිපත්තිවල පසුකාලීන බලපෑම පිළිබිඹු කරමින් 2013 වසරේ දී විදේශීය වෙළෙඳ ගිණුමේ සහ ජංගම ගිණුමේ සිදුවූ වර්ධනයන් සහ සංචිත ඉහළ යාම අපේක්ෂා කළ මට්ටමට වඩා යහපත් විය.** අපනයන ආදායමෙහි සතුටුදායක වර්ධනය සහ ආනයන වියදමෙහි පහළ යාම හේතුවෙන් වෙළෙඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩු විය. 2013 වසරේ දී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් සහ සංචාරක ඉපැයුම් වෙළෙඳ හිඟයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ආවරණය කළේය. මෙය, ඉහළ ගිය අනෙකුත් සේවා වෙළෙඳ කටයුතු ලැබීම් සමඟ වසර තුළ දී විදේශීය ජංගම ගිණුමේ හිඟය විශාල වශයෙන් අඩු වීමට උපකාරී විය. මේ අතර, රජය, බැංකු සහ පෞද්ගලික අංශයන් වෙත වූ ලැබීම් හේතුවෙන් මූල්‍ය ගිණුමෙහි ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වීම සහ විනිමය පාලන රෙගුලාසි තවදුරටත් ලිහිල් කිරීම නිසා බැංකු සහ පෞද්ගලික අංශයන් විදේශයන්ගෙන් අරමුදල් රැස්කිරීමට දිරිමත් විය. විදේශීය අංශයේ සිදු වූ මෙම වර්ධනයන් ගෙවුම් තුලනයේ[1] සැලකියයුතු විශාල අතිරික්තයක් ඇති කිරීමට හේතු වූ අතර එමගින්, 2013 වසරේ දී රටෙහි දළ විදේශීය සංචිත හිතකර මට්ටමකට ඉහළ නැංවුණි. ඒ අනුව, ශ්‍රී ලංකා රුපියල 2013 වසර මැද භාගයේ දී යම් උච්චාවචනයකට ලක්වුවද, සාපේක්ෂව ස්ථායීව පැවතුණි.

**ප්‍රධාන අපනයන ගමනාන්තයන්හි ඉල්ලුම ඉහළ යාම හේතුවෙන් විදේශීය වෙළෙඳාම් කටයුතු යහපත් මට්ටමක පැවතුණි.** දියුණු රටවල් ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීමත් සමඟ ගෝලීය වෙළෙඳ කටයුතු, විශේෂයෙන්ම 2013 වසරේ සිව්වන කාර්තුවේ දී යළි ශක්තිමත් විය. ශ්‍රී ලංකාවේ අපනයන ගෝලීය ආර්ථිකයේ හිතකර වර්ධනයන්ට ධනාත්මකව ප්‍රතිචාර දක්වමින් 2013 වසරේ දී සියයට 6.4 ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, මූලිකව ඛනිජ තෙල් ආනයන පහළ යාම හේතුවෙන් ආනයන වියදම සියයට 6.2 කින් අඩු වූ අතර මෙය, වෙළෙඳ ශේෂයෙහි සැලකිය යුතු වර්ධනයක් ඇති කිරීමට හේතු විය.


**විදේශීය ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩුකරමින් සේවා වෙළෙඳාම සහ විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ 2013 වසරේ දී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.** සංචාරක, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශ සඳහා වූ ඉපැයුම් ඉහළ යාමත් සමඟ ශ්‍රී ලංකාව සේවා අපනයනය කිරීම සම්බන්ධයෙන් කලාපය තුළ විශේෂ

[1] මෙම වසරේ සිට ගෙවුම් තුලනයේ ඉදිරිපත් කිරීම, ජා.මූ. අරමුදල විසින් 2009 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද ගෙවුම් තුලනය සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය අත්පොතෙහි හයවන සංස්කරණය (BPM6) ට අනුකූල වේ.

**5.1 රූප සටහන** **ගෙවුම් තුලනය**




**5.2 රූප සටහන** **ප්‍රධාන විදේශ විනිමය ඉපැයීමේ මූලයන්**




ස්ථානයක් අත්පත් කරගැනීමට ඇති ශක්‍යතාව පෙන්නුම් කළේය. ඒ අනුව, දැනුම, නාවික, ගුවන් ගමන්, බලශක්ති, වාණිජ සහ සංචාරක මධ්‍යස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමේ කේන්ද්‍රස්ථාන පහ+1 (Five+1 Hubs) උපාය මාර්ගය ආර්ථික වර්ධනය සඳහා ඉහළ ආයකත්වයක් සපයයි. මෑත වසරවල දී ශීඝ්‍රයෙන් වර්ධනය වූ විදේශ ගමන් හා සංචාරක සේවා අංශය 2013 වසරේ දී තවදුරටත් පුළුල් විය. මේ අතර, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, වඩා විවිධාංගීකරණය වූ සේවක සංක්‍රමණ සංයුතියක් සහිතව තවදුරටත් වර්ධනීය මාවතක පැවතුණි. විදේශීය ණය මත වූ පොලී ගෙවීම් සහ විදේශ ආයෝජකයින් විසින් ලාභ ආපසු ගෙනයාම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය වැඩි වුවද වෙළෙඳ ශේෂයේ හිතකර වර්ධනය සහ සේවා හා ද්විතීයික ආදායම් ගිණුම්වල අතිරික්තය, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස විදේශීය ජංගම ගිණුමේ හිඟය 2012 වසරේ දී වාර්තා වූ සියයට 6.7 ක සිට 2013 වසරේ දී සියයට 3.9 ක් දක්වා අඩු කිරීමට උපකාරී විය.

**2013 වසරේ දී ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය සහ ජාත්‍යන්තර සංචිත සැලකිය යුතු ලෙස වර්ධනය විය.** ජංගම ගිණුමේ සැලකිය යුතු වර්ධනය සහ මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ඉහළ යාම සමඟ ගෙවුම් තුලනයේ සමස්ත ශේෂය 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 151 ක අතිරික්තයට සාපේක්ෂව 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 985 ක අතිරික්තයක් වාර්තා කළේය. මෙම සමස්ත අතිරික්තය හේතුවෙන් දළ නිල සංචිත, 2013 වසර අවසානය වනවිට එ.ජ.ඩොලර් බිලියන 7.5 ක් දක්වා වර්ධනය වූ අතර, එය මාස 5 ක ආනයන වියදම හා සමාන විය. දළ නිල සංචිත, කෙටිකාලීන ණය සහ වගකීම්වල අනුපාතයක් ලෙස ගැනීමෙන් මනිනු ලබන සංචිත ප්‍රමාණාත්මකභාවය 2013 වසර අවසානයේ දී සියයට 63 ක් ලෙස වාර්තා වූ අතර, කෙටිකාලීන ණයවලින් භාණ්ඩාගාර බැඳුම්කර ඉවත් කර එහි අනුපාතයක් ලෙස ගැනීමේ දී සියයට 85 ක් ලෙස වාර්තා විය. ඉහළ ගිය ගෙවුම් තුලන තත්ත්වය සහ සංචිත ඉහළ යාම, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තවදුරටත් ස්ථාවර කළ අතර, රටෙහි විදේශීය අංශයේ ඉදිරි දැක්ම වැඩිදියුණු කළේය. මේ අතර, විදේශයන් සමඟ පවතින ශ්‍රී ලංකාවේ මූල්‍ය වත්කම් සහ වගකීම් තත්ත්වය වාර්තා කරන 'අන්තර්ජාතික ආයෝජන තත්ත්වය', විදේශීය සෘජු ආයෝජන, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජන, රජය සහ පෞද්ගලික ආයතන වෙත වූ දිගුකාලීන ණය ලැබීම් සහ බැංකු අංශයේ ජාත්‍යන්තර බැඳුම්කර නිකුතු තුළින් ලද විදේශීය ලැබීම් යනාදියෙහි ඉහළයාම් පිළිබිඹු කරමින් 2013 වසර අවසානයේ දී ශුද්ධ වගකීම්වල ඉහළ යාමක් පෙන්නුම් කළේය.

**එක්සත් ජනපදයේ ප්‍රමාණාත්මක ලිහිල්කරණ වැඩසටහන සීමාකරනු ඇතැයි යන අපේක්ෂාව හමුවේ තියුණු ලෙස අවප්‍රමාණය වූ කලාපීය ව්‍යවහාර මුදල් සමඟ සැසඳීමේ දී ශ්‍රී ලංකා රුපියල සාපේක්ෂව ස්ථාවරව පැවතුණි.** ඉහළ ගිය අපනයන ඉල්ලුම සහ වසර තුළ දී එක්සත් ජනපද බැඳුම්කර මිල දී ගැනීමේ වැඩසටහන සීමාකිරීමේ ඉඩ ප්‍රස්ථාව මත විදේශීය ආයෝජකයින් රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළෙන් ඉවත්ව යනු ඇතැයි යන අපේක්ෂාව හේතුවෙන් 2013 වසර මැද භාගයේ දී රුපියල යම් පීඩනයකට ලක්වුවද, බොහෝ කලාපීය ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල, එ.ජ.ඩොලරයට එරෙහිව අවප්‍රමාණය වූයේ සුළු වශයෙනි. ඒ අනුව, 2013 වසර අවසානය වනවිට ශ්‍රී ලංකා රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 2.75 කින් අවප්‍රමාණය වූ අතර ඉන්දියානු රුපියල සහ ජපන් යෙන් වැනි අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව විශාල වශයෙන් අධිප්‍රමාණය විය.

**5.1 සංඛ්‍යා සටහන — ගෙවුම් තුලන විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් මිලියන | | රුපියල් මිලියන | |
|---|---|---|---|---|
| | 2012(අ) | 2013 (ආ) | 2012 (අ) | 2013 (ආ) |
| **ජංගම ගිණුම** | **-3,982** | **-2,607** | **-501,869** | **-332,580** |
| **වෙළෙඳ ගිණුම** | **-9,417** | **-7,609** | **-1,196,348** | **-979,074** |
| අපනයන | 9,774 | 10,394 | 1,245,531 | 1,344,054 |
| ආනයන | 19,190 | 18,003 | 2,441,879 | 2,323,128 |
| **සේවා (ශුද්ධ)** | **1,262** | **1,180** | **160,755** | **152,630** |
| ලැබීම් | 3,800 | 4,685 | 484,936 | 605,213 |
| ගෙවීම් | 2,538 | 3,505 | 324,181 | 452,583 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-1,219** | **-1,817** | **-154,889** | **-234,814** |
| ලැබීම් | 142 | 148 | 18,137 | 19,100 |
| ගෙවීම් | 1,361 | 1,965 | 173,027 | 253,914 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **5,392** | **5,639** | **688,613** | **728,678** |
| ද්විතීයික ආදායම් : ලැබීම් | 6,038 | 6,428 | 770,879 | 830,407 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 5,985 | 6,407 | 763,980 | 827,689 |
| රජයේ සංක්‍රාම | 53 | 21 | 6,899 | 2,718 |
| ද්විතීයික ආදායම් : ගෙවීම් | 646 | 788 | 82,266 | 101,728 |
| **ප්‍රාග්ධන ගිණුම** | **130** | **71** | **16,951** | **9,188** |
| ප්‍රාග්ධන ගිණුම : ලැබීම් | 146 | 90 | 18,884 | 11,596 |
| ප්‍රාග්ධන ගිණුම : ගෙවීම් | 15 | 19 | 1,933 | 2,409 |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම** | **-3,851** | **-2,536** | **-484,918** | **-323,392** |
| **මූල්‍ය ගිණුම** | **4,263** | **3,126** | **525,889** | **394,785** |
| **සෘජු ආයෝජන : වත්කම්** | **64** | **65** | **8,157** | **8,399** |
| **සෘජු ආයෝජන : වගකීම්** | **941** | **916** | **119,813** | **118,607** |
| **විවිධ ආයෝජන : වත්කම්** | **-10** | **...** | **-1,295** | **-29** |
| ණය සුරැකුම්පත් | -10 | ... | -1,295 | -29 |
| **විවිධ ආයෝජන : වගකීම්** | **2,116** | **2,106** | **272,691** | **273,175** |
| හිමිකම් සුරැකුම්පත් | 272 | 263 | 34,493 | 36,499 |
| ණය සුරැකුම්පත් | 1,844 | 1,843 | 238,198 | 236,676 |
| මූල්‍ය ව්‍යුත්පන්න | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන : වත්කම්** | **363** | **-222** | **47,384** | **-28,468** |
| මුදල් සහ තැන්පතු | 162 | -459 | 22,178 | -58,839 |
| වෙළෙඳ ණය සහ අත්තිකාරම් | 90 | 195 | 11,769 | 25,190 |
| අනෙකුත් ගිණුම් ලැබිය යුතු | 111 | 42 | 13,437 | 5,181 |
| **අනෙකුත් ආයෝජන : වගකීම්** | **2,384** | **1,060** | **319,695** | **137,965** |
| මුදල් හා තැන්පතු | 447 | 108 | 61,447 | 14,960 |
| ණය | 3,070 | 949 | 389,956 | 122,747 |
| මහ බැංකුව | 780 | -453 | 100,493 | -57,683 |
| තැන්පතු භාරගන්නා ආයතන | 579 | 124 | 69,170 | 15,940 |
| රජය | 992 | 821 | 127,434 | 105,707 |
| අනෙකුත් අංශයන් | 719 | 456 | 92,860 | 58,783 |
| වෙළෙඳ ණය සහ අත්තිකාරම් | -571 | -54 | -70,629 | -8,089 |
| අනෙකුත් ගිණුම් ගෙවිය යුතු | -563 | 58 | -61,078 | 8,348 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි) | - | - | - | - |
| **සංචිත වත්කම්** | **760** | **1,112** | **132,063** | **155,060** |
| මූල්‍ය රත්‍රන් | 178 | 351 | 22,679 | 44,862 |
| විශේෂ ගැනුම් හිමිකම් | -0.5 | 12 | -88 | 2,440 |
| ජා.මූ.අරමුදල. සංචිත මට්ටම | - | - | - | - |
| අනෙකුත් සංචිත වත්කම් | 583 | 749 | 109,473 | 107,758 |
| මුදල් හා තැන්පතු | -801 | 1,297 | -67,194 | 179,394 |
| සුරැකුම්පත් | 1,384 | -548 | 176,666 | -71,636 |
| **ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** | **-412** | **-590** | **-40,957** | **-71,394** |
| **සමස්ත ශේෂය** | **151** | **985** | **72,638** | **229,692** |
| **මූල්‍ය වෙනස්වීම්** | **-151** | **-985** | **-72,638** | **-229,692** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස (ඇ)** | | | | |
| වෙළෙඳ ගිණුම | -15.9 | -11.3 | -15.8 | -11.3 |
| භාණ්ඩ හා සේවා | -13.7 | -9.6 | -13.7 | -9.5 |
| ජංගම ගිණුම | -6.7 | -3.9 | -6.6 | -3.8 |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුම | -6.5 | -3.8 | -6.4 | -3.7 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්නා වෙළෙඳ මිල අනුව ගණනය කරන ලද ද.දේ.නි මත පදනම් වේ. වසර තුළ දී විනිමය අනුපාතිකයේ සිදුවූ වෙනස්වීම් හේතුවෙන් රුපියල් සහ එ.ජ.ඩොලර් අගයන්ගෙන් ගණනය කරන ලද අනුපාතිකයන් සුළු වශයෙන් වෙනස් විය හැකිය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**2014 වසරේ දී සහ ඉන් ඉදිරියට ශ්‍රී ලංකාවේ විදේශීය අංශය බාහිර කම්පනයන්ට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නංවමින් තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ගෝලීය ආර්ථිකයේ අපේක්ෂිත යථාතත්ත්වයට පත්වීම සහ දේශීය ආර්ථිකයේ ඉහළ වර්ධන අපේක්ෂාවන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශයේ සුබවාදී දැක්ම තහවුරු කරයි. වෙළෙඳ භාණ්ඩ අපනයන ප්‍රවර්ධනය කිරීම කෙරෙහි ඉලක්කගත වූ ක්‍රියාමාර්ගයන් සහ තෝරාගත් ආනයන අධෛර්යමත් කිරීම මගින් වෙළෙඳ ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන්ම, සංචාරක, වරාය හා ගුවන්තොටුපොළ සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ ව්‍යාපාර යන අංශයන්හි සිදුවන විශාල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රතිලාභ ලබමින් රටෙහි ආර්ථික කේන්ද්‍රස්ථානවල ඇතිවන වැඩිදියුණුවීම තුළින් සේවා අපනයන මැදි කාලීනව වැඩි වේගයකින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සේවක සංක්‍රමණික සංයුතිය විවිධාංගීකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වැඩිදියුණු කිරීමට හේතුවනු ඇති අතර, එම ප්‍රේෂණ ශ්‍රී ලංකාවේ ශක්තිමත් විදේශ විනිමය මූලයක් ලෙස මැදි කාලීන වශයෙන් තවදුරටත් පවතිනු ඇත. මේ අතර, මෑතකදී හඳුන්වා දුන් විනිමය පාලනයන් ලිහිල් කිරීමේ ක්‍රියාමාර්ග සහ වැඩිදියුණු වූ ව්‍යාපාර පවත්වාගෙන යාමේ පරිසරය යනාදිය තුළින් ආර්ථිකය කෙරෙහි ආයෝජක විශ්වාසය ඉහළ නංවනු ඇතැයි අපේක්ෂා කරන අතර, එමගින් විශේෂයෙන්ම විදේශීය සෘජු ආයෝජන සහ ණය නොවන මූල්‍ය ප්‍රවාහ වැනි ආයෝජන ප්‍රවාහ වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කරගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 5.2 විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති සහ ආයතනික සහය

**වෙළෙඳ සාකච්ඡා තුළින් ශ්‍රී ලංකාව ලෝක ආර්ථිකය වෙත ඇති සබඳතාවය වැඩි දියුණු කිරීමත් ජාත්‍යන්තර වෙළෙඳපොළ වෙත ඇති විවෘතභාවය ඉහළ නැංවීම තුළින් දේශීය ආර්ථික කටයුතු පුළුල් කිරීමත් කෙරෙහි, 2013 වසර සඳහා වූ විදේශ වෙළෙඳ ප්‍රතිපත්තිය තවදුරටත් යොමුවිය.** ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සඳහා විදේශීය වෙළෙඳපොළට පිවිසීමේ අවස්ථාවන් තවදුරටත් ශක්තිමත් වීම, විදේශීය සෘජු ආයෝජන ශ්‍රී ලංකාව වෙත ආකර්ෂණය වීම සහ ආනයන වඩා ඵලදායී අන්දමින් සිදුකිරීමට හැකිවීම යනාදිය කෙරෙහි, ශ්‍රී ලංකාව හා ජාත්‍යන්තරය අතර පවතින සබඳතාවය වැඩිදියුණු වීම උපකාරී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ස්ථාවර සාර්ව ආර්ථික වාතාවරණයක් පවත්වා ගැනීම

තහවුරු කරන අතරතුර, තාක්ෂණික නවෝත්පාදනය, රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය දිරිමත් කිරීම සහ යටිතල පහසුකම් හා අනෙකුත් අවශ්‍ය සේවාවන් වර්ධනය කිරීම යනාදිය තුළින් කාර්මික අංශය සඳහා ජාත්‍යන්තර වශයෙන් පවතින තරගකාරිත්වය වැඩිදියුණු කිරීම කෙරෙහි ආයතනික සහය තවදුරටත් යොමුවිය.

**දේශීය නිෂ්පාදනයට සහ වෙළෙඳාමට පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව ප්‍රධානතම වෙළෙඳ ප්‍රතිපත්ති උපකරණය වන අනුපාතික හතරකින් සමන්විත තීරු බදු ව්‍යුහය, තවදුරටත් සරල කරන ලදී.** එතෙක් පැවැති සියයට 0, 5, 15 සහ 30 යන තීරු බදු අනුපාත, 2013 නොවැම්බර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි සියයට 0, 7.5, 15 සහ 25 වශයෙන් සංශෝධනය කරන ලදී. ආනයනික අමුද්‍රව්‍ය සහ යන්ත්‍රෝපකරණ සඳහා අදාළ වන පරිදි කලින් පැවැති තීරු බදු ව්‍යුහයෙහි වූ සියයට 5 යන අනුපාතය අහෝසි කර එම අනුපාතය අදාළ වූ භාණ්ඩ බොහොමයක් සියයට 0 තීරු බදු ගණයට වර්ගීකරණය කළ අතර, සෙසු ආනයන කිහිපය සියයට 7.5 තීරු බදු ගණය මත පිහිටුවන ලදී. ඒ අනුව, තීරු බදු කාණ්ඩ 6,577 ක් අතුරින් කාණ්ඩ 3,379 ක් සියයට 0 ක බදු අනුපාතය මත පිහිටුවන ලදී. බදු ව්‍යුහය තවදුරටත් සරල කිරීමේ හා බදු අනුපාතය පහළ දැමීමේ ප්‍රතිපත්තියට අනුගාමීව නිමි ද්‍රව්‍ය සඳහා අදාළව පැවැති සියයට 30 ක් වූ තීරු බදු අනුපාතය සියයට 25 ක් දක්වා පහළ දමන ලදී.

**අපනයන ඉලක්ක කරගත් කර්මාන්ත ශක්තිමත් කිරීම සඳහා 2013 වසරේ දී ඉතා වැදගත් ප්‍රතිපත්ති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** පෙර පැවති මූල්‍ය පනත සංශෝධනය කර 2013 අංක 12 දරන මූල්‍ය පනත බලාත්මක කිරීම තුළින් 'නිදහස් වරායන්' සහ 'බන්ධිත ප්‍රදේශ' පිහිටුවීමට අවශ්‍ය පහසුකම් තවදුරටත් සපයන ලදී. ඒ අනුව, කොළඹ සහ හම්බන්තොට වරායන් නිදහස් වරායන් ලෙස නම් කළ අතර කටුනායක, කොග්ගල හා මත්තල පිහිටි අපනයන සැකසුම් කලාප බන්ධිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලදී. මෙම කලාපයන්හි මෙහෙයුම් කටයුතු සිදුකරන කර්මාන්ත දේශීය බදුවලින් නිදහස් කර ඇත. තවද, අන්තරාල වෙළෙඳාමෙහි නිරතවන අපනයනකරුවන්, එනම් ප්‍රති අපනයනය සඳහා ආනයනික භාණ්ඩ සුළු වශයෙන් සකස් කිරීමෙහි නිරතවන්නන් සහ සැපයුම් සේවා හෝ විවිධ රටවල නිෂ්පාදනය කළ කොටස් එකලස් කිරීමෙහි නිරත වන අපනයනකරුවන් මෙම නිදහස් කලාපයන්හි තම මෙහෙයුම් ක්‍රියාත්මක කිරීමෙන් ප්‍රතිලාභ රැසක් භුක්ති විඳිනු ලබයි. තවද, මූල්‍ය පනත සංශෝධනය කිරීම තුළින්, ජාත්‍යන්තර නාවික වෙළෙඳාමෙහි ඒකාධිකාරී මිල ක්‍රමයක් ඇතිවීම වැළැක්වීමේ අරමුණින් යුතුව ජාත්‍යන්තරව නිර්දේශිත නැව් ගාස්තුවලට අමතරව පර්යන්ත මෙහෙයුම් හා වෙනත් ගාස්තු අයකිරීම අහෝසි කළ අතර සියලු ගාස්තු ඇතුළත් එක් නව ගාස්තුවක් නිර්දේශ කරන ලදී. ඇඟළුම් කර්මාන්තය සලකා බැලීමේදී, වසර 2020 දී ජාත්‍යන්තර වශයෙන් උසස් තත්ත්වයේ ඇඟළුම් නිපදවන ඉහළම නිෂ්පාදකයින් දසදෙනා අතරට ශ්‍රී ලංකා ඇඟළුම් කර්මාන්තය ගෙන ඒම රජයේ ඉලක්කයයි. මෙම අරමුණ ළඟා කර ගැනීම උදෙසා, ඇඟළුම් කර්මාන්තය තුළ සිදු කරන පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා සියයට 300 ක බදු දීමනාවක් ලබාදීමට යෝජනා කර ඇත. දේශීය නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සන්නාම වැනි බුද්ධිමය දේපොළ අත්පත් කර ගැනීම දිරිමත් කිරීමේ අරමුණින් යුතුව එම බුද්ධිමය දේපොළ අත්පත් කරගැනීමේ වියදම් මෙන්ම එම බුද්ධිමය දේපොළ මගින් ලබන විදේශ පුරස්කාර ආදායම් සඳහා බදු අඩු කිරීම් ලබා දී ඇත. රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සඳහා අමු කපු රෙදි සහ අනෙකුත් රෙදි ආනයනය මත වූ සෙස් බද්ද පිළිවෙළින් කිලෝ ග්‍රෑමයකට රු. 75 ක් සහ කිලෝ ග්‍රෑමයට රු. 100 ක් ලෙස අඩු කරන ලදී. තවද, රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය හා විවිධ සේවාවන් සැපයීම දිරිමත් කිරීම පිණිස, ඇඟළුම් අපනයනකරුවන්ට සපයන යම් යම් සේවාවන්ගෙන් ලැබෙන ලාභ හා ආදායම් සඳහා දැනට අදාළ වන සියයට 12 සහනදායී බදු අනුපාතය තවදුරටත් පවත්වා ගැනීමට තීරණය කරන ලදී. ප්‍රාථමික වෙළෙඳ ද්‍රව්‍ය මත පනවා තිබූ ඉහළ සෙස් බද්ද තවදුරටත් පවත්වාගෙන යාම තුළින් ඉහළ වටිනාකමකින් යුත් තේ සහ රබර් නිෂ්පාදිත අපනයන දිරිමත් වනු ඇත. තවද, විවිධ තේ වර්ග මිශ්‍ර කොට සකස් කරනු ලබන විවිධ රසයන්ගෙන් යුත් තේ සඳහා සම්ප්‍රදායික නොවන වෙළෙඳපොළවල ඇති ඉල්ලුම වැඩිවෙමින් පවතින බැවින් එසේ මිශ්‍ර කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ විශේෂිත තේ වර්ග ආනයනය කිරීම සඳහා තිබූ සීමාවන් 2014 වසර සඳහා වූ අයවැය මගින් ඉවත් කරන ලදී. එමගින් තේ කර්මාන්තයෙහි අගය එකතු කිරීම දිරිමත් කිරීමට අපේක්ෂා කෙරේ.

**ආනයන වියදම් තාර්කීකරණය කිරීමට සහ දේශීය නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය පියවර කිහිපයක් ගන්නා ලදී.** දේශීය ධීවර කර්මාන්තය රැකගැනීමේ අරමුණින් යුතුව කරවල, වියළි හාල්මැස්සන්, උම්බලකඩ, ටින් මාළු හා මාළු කෑම සඳහා වූ ඉහළ ආනයන බදු තවදුරටත් පවත්වා ගත් අතර, දේශීය කිරි කර්මාන්තය ධෛර්යමත් කිරීම සඳහා දැනට පවතින ඉහළ සෙස් බද්දට අමතරව 2014 වසර සඳහා වූ අයවැය මගින් බටර්, යෝගට් සහ කිරි නිෂ්පාදිත ආනයන මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද (SCL) හඳුන්වා දෙන ලදී. තවද, දේශීය පොල් කර්මාන්තය තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින්

පොල්තෙල් හා පාම් මද ආනයනය මත සීමා පැනවීමටත්, පොල්තෙල් නිෂ්පාදනය සඳහා පනවා තිබූ ජාතිය ගොඩනැගීමේ බද්ද (NBT) වසර තුනක කාලයක් සඳහා ඉවත් කිරීමටත් කටයුතු කරන ලදී. වාහන ආනයනය කිරීම වඩාත් තාර්කීකරණය කිරීමේ අරමුණින් යුතුව පාවිච්චි කරන ලද වාහන ආනයනය කිරීමේ දී ක්ෂය කිරීමේ ක්‍රියාදාමය 2013 නොවැම්බර් මාසයේ දී සංශෝධනය කරන ලදී. දේශීය බෝට්ටු නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා බෝට්ටු ආනයනය සඳහා අදාළ වන බදු තවදුරටත් ඉහළ මට්ටමක තබාගැනීමට තීරණය කළ අතර, බෝට්ටු නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමතර කොටස් ආනයනයේදී සහ සැපයීමේදී අදාළ වූ එකතු කළ අගය මත වූ බදු (VAT) ඉවත් කරන ලදී. ධීවර කර්මාන්තය දිරිමත් කිරීම පිණිස ශීත කළ මාළු ඇම, බිලී පිති, බිලී කොකු සහ මාළු බාන යොත් වැනි ධීවර උපකරණ ආනයනයේ දී හෝ සැපයීමේ දී එකතු කළ අගය මත වූ බදුවලින් (VAT) නිදහස් කරන ලදී. දේශීය කෘෂිකාර්මික අංශය සහ ධීවර කර්මාන්තය දිරිමත් කිරීමේ අරමුණින් ඇතැම් ආහාර වර්ග මත එතෙක් පැවැති සෙස් බද්ද සහ විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද තවදුරටත් පවත්වාගෙන යන ලදී.

**අපනයනකරුවන් හට තියුණු ගෝලීය තරගකාරිත්වයට සාර්ථකව මුහුණදීමට හා නව වෙළෙඳපොළවල් හා තාක්ෂණයන් වෙත ප්‍රවේශ වීමට හැකිවන පරිදි ආයතනික සහය ලබාදෙන ලදී.** රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තයෙහි වෙළෙඳපොළ ග්‍රහණය පුළුල් කිරීමේ අරමුණින් යුතුව ඒකාබද්ධ ඇඟළුම් සංගමයෙහි (JAAF) නියෝජිතයින් පිරිසක් විසින් එසේ වෙළෙඳපොළ පුළුල් කිරීමේ හැකියාවක් පවතින චීනය, ජපානය, රුසියාව සහ බ්‍රසීලය වැනි රටවල සංචාරය කළ අතර, එහිදී එම රටවල් සමඟ වරණීය වෙළෙඳ පිවිසුම් ඇති කරගැනීමට ඇති සක්‍යතාව පිළිබඳව සලකා බලන ලදී. විදේශ වෙළෙඳාමට පහසුකම් සැලසීමේ අරමුණින් අපනයන සංවර්ධන මණ්ඩලය විසින් (EDB), 1979 අංක 40 දරණ අපනයන සංවර්ධන පනත යටතේ උපදේශන කමිටු 26 ක් පිහිටුවන ලදී. තවද, බ්‍රසීලය, රුසියාව, ඉන්දියාව සහ චීනය යන රටවලට (BRIC Countries) මෙන්ම අප්‍රිකාව, ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් (CIS) සහ තුර්කිය වැනි මෙතෙක් විශාල ලෙස වෙළෙඳ ගනුදෙනු නොකළ යුරෝපා සංගමයට අයත් රටවල්වලට ශ්‍රී ලංකාවේ අපනයන ව්‍යාප්ත කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් පියවර ගෙන ඇත. වසර තුළ දී, අපනයන සංවර්ධන මණ්ඩලය විසින් යුරෝපා සංගමය, ඇමෙරිකා එක්සත් ජනපදය, ආසියාව, මැදපෙරදිග, අප්‍රිකාව සහ පොදු රාජ්‍ය මණ්ඩලීය ස්වාධීන රටවල්වල අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් පැවැත් වූ අතර, ශ්‍රී ලංකාව වෙත පැමිණි වෙළඳ දූත කණ්ඩායම් කිහිපයක කටයුතු ද සාර්ථක අන්දමින් නිමා කරන ලදී. කෘෂිකාර්මික, ධීවර සහ කාර්මික අංශයන්හි වර්ධනය සඳහා 2013 වසර තුළ දී අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වැඩසටහන් මාලාවක් දියත් කරන ලදී. ඒ අනුව, ‘Pure Ceylon Cinnamon’ යන වෙළෙඳ නාමය ජාත්‍යන්තරව පිළිගත් වෙළෙඳ නාමයක් ලෙස ස්ථාපිත කළ අතර, එය ඇමෙරිකා එක්සත් ජනපදය, යුරෝපා සංගමය වැනි ප්‍රධාන වෙළෙඳපොළවල්හි ලියාපදිංචි කරන ලදී. ලෝක බුද්ධිමය දේපළ කාර්යාලයෙහි මෙම වෙළෙඳ නාමය ලියාපදිංචි කිරීමට අයදුම් පත් ඉදිරිපත් කර ඇත. අපනයන සංවර්ධන මණ්ඩලය හා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ලාංකික මැණික් ගල්වලටම ආවේණික වූ ආකර්ෂණීයත්වය ඉස්මතු කරමින් මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සන්නාමයන් සඳහා රබර් නිෂ්පාදන සපයනු ලබන රටක් ලෙස ශ්‍රී ලංකාව ඉදිරියට පැමිණ ඇති බැවින් එම නිෂ්පාදනයන්හි තත්ත්වය සහ විශ්වාසනීයත්වය ඉහළ මට්ටමක පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. ශ්‍රී ලංකාවේ රබර් අපනයනකරුවන් හට පහසුකම් සලසමින් ශ්‍රී ලංකාවේ දී දැනට ලබාගත නොහැකි තත්ත්ව සහතික ලබාගැනීම සඳහා යෝජනා ක්‍රමයක් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් හඳුන්වා දී තිබේ. තරගකාරී වෙළෙඳපොළ හමුවේ ලෝක වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාවේ අපනයන කොටස ඉහළ නංවා ගැනීමේ ඇති වැදගත්කම හඳුනා ගනිමින්, ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ සංගමය විසින් ‘මීළඟ වසර 05 තුළ දී ශ්‍රී ලංකාවේ අපනයන කුමන දිශාවටද?’ (Whither Export In the Next 5 Years?) යන තේමාව යටතේ සමුළුවක් පවත්වන ලදී. මෙහිදී, ප්‍රධාන අපනයනකරුවන් හට ඉදිරි වසර 05 තුළ දී තම ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය වන්නාවූ උපායමාර්ග හඳුනාගැනීමට අවස්ථාව ලැබුණි. සාර්ක් කලාපයේ ප්‍රමිතීන් අතර අනුකූලතාවයක් ඇති කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) දකුණු ආසියානු කලාපීය ප්‍රමිති ආයතනය (South Asian Regional Standards Organisation) සමඟ එක්ව සක්‍රීය ලෙස කටයුතු කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිති සහතිකකරණය යටතේ ශ්‍රී ලංකාවේ කුරුඳු අපනයනය කිරීමට අවශ්‍ය විධානයන් වසර තුළ දී නිකුත් කරන ලදී. විදේශ වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් යුතුව, ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් කිහිපයක් වන බ්‍රිතාන්‍යය, ජර්මනිය, ඕස්ට්‍රේලියාව, නවසීලන්තය, පෝලන්තය, මාලදිවයින යන රටවල සම්මන්ත්‍රණ, වෙළෙඳ ප්‍රදර්ශන, රැස්වීම් සහ ව්‍යාපාර සමුළු කිහිපයක් ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ අනුග්‍රහය යටතේ පවත්වන ලදී.

**ශ්‍රී ලංකාවේ මෙතෙක් පැවති විශාලතම ව්‍යාපාරික සමුළුව වන පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සමුළුවට සත්කාරත්වය දැක්වීමේ වරප්‍රසාදය 2013 වසරේ දී ශ්‍රී ලංකාවට හිමි විය.** මෙම සමුළුවේ තේමාව ලෙස 'පොදුරාජ්‍ය මණ්ඩලයේ, ඉන්දියන් සාගරයේ සහ සාර්ක කලාපයේ පිහිටි රටවල ධන උත්පාදනය සඳහා හවුල්කාරිත්වය සහ සමාජ සංවර්ධනය' යන්න යොදා ගැනුණි. පොදුරාජ්‍ය මණ්ඩලීය නායක සමුළුවට සමගාමීව මෙම ව්‍යාපාරික සමුළුව පැවැත්වූ අතර, ඒ සඳහා රාජ්‍ය නායකයින්, අමාත්‍යවරුන් සහ ලොවපුරා විහිදුනු ව්‍යාපාරික ප්‍රජාවේ ප්‍රමුඛයින් රැසක් සහභාගි වූහ. මෙම සමුළුව මඟින් දේශීය ව්‍යාපාරික ප්‍රජාවට විදේශීය නියෝජිතයින් හමුවී ඔවුන් සමඟ බද්ධ ව්‍යාපාරවලට එකතුවීමේ අවස්ථාවන් පිළිබඳව සාකච්ඡා කිරීමට අනගි අවස්ථාවක් සැලසීම සහ ශ්‍රී ලංකාව විදේශීය ආයෝජන සඳහා යෝග්‍ය රටක් ලෙස ප්‍රවර්ධනය කිරීමට හැකිවීම හේතුවෙන් මෙම සමුළුව ශ්‍රී ලංකාවට බෙහෙවින් ප්‍රතිලාභ ගෙන දෙන්නක් විය. එම සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන්, හෝටල් අංශයේ සහ මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් සඳහා විදේශ ආයෝජන යෙදවීමට අදාළ පාර්ශ්වයන් විසින් අවබෝධතා ගිවිසුම් රැසකට අත්සන් තබන ලදී. තවද, මෙම සමුළුව මගින් විදේශීය ව්‍යාපාරිකයින්ට වෙනත් රටවලින් පැමිණි වෙළෙඳ හවුල්කරුවන් හමුවී ආයෝජන අවස්ථා පිළිබඳව සාකච්ඡා කිරීමට ද අවස්ථාව සලසන ලදී.

**වරණීය සහ නිදහස් වෙළෙඳ ගිවිසුම් තුළින් වෙළෙඳ ප්‍රවේශය පුළුල් කරගැනීමේ අරමුණෙන් යුතුව ශ්‍රී ලංකාව ද්වීපාර්ශ්වීය, කලාපීය සහ බහුපාර්ශ්වීය සාකච්ඡාවල අඛණ්ඩව නිරත විය.** වෙළෙඳ බාධක අවම කිරීම සහ වෙළෙඳ නීති සංශෝධනය කිරීම මගින් ජාත්‍යන්තර වෙළෙඳ ක්‍රමය තුළ ප්‍රධාන ප්‍රතිසංස්කරණයන් ඇති කිරීම අරමුණු කරගත් ලෝක වෙළෙඳ සංවිධානයේ වෙළෙඳ සාකච්ඡා පිළිබඳ නවතම වටය වූ දෝහා වටය මෙම වසර තුළ දී සැලකිය යුතු ප්‍රගතියක් නොපෙන්වීය. මේ අනුව, දෝහා වටයේ වූ පුළුල් සාකච්ඡාවල දී තෝරාගත් ගැටලු තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා 2013 දෙසැම්බර් මාසයේ දී ලෝක වෙළෙඳ සංවිධානයේ බාලි අමාත්‍ය මණ්ඩල සම්මන්ත්‍රණය පවත්වන ලදී. සංවර්ධනය වෙමින් පවතින රටවල්වල ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම සඳහා විවිධ විකල්පයන් ලබා දීම සහ ඌන සංවර්ධිත රටවල වෙළෙඳාම නඟා සිටුවීම වැනි විදේශීය වෙළෙඳාම පහසු කිරීම සඳහා විසඳුම් මාලාවක් සැලසුම් කිරීමේ එකඟතාවය ඇතිව මෙම සම්මන්ත්‍රණය නිමා විය. අපනයන ගමනාන්තයන්වල සම්බාධක සහ දැඩි ක්‍රියාපටිපාටීන් අඩු වීම හරහා වෙළෙඳ ගනුදෙනු පිරිවැය අඩුවීම, ගනුදෙනු සිදු කිරීම සඳහා ගතවන කාලසීමාව අඩුවීම සහ ගනුදෙනුවල පැහැදිලි බව කාර්යක්ෂමතාවය සහ විනිවිදභාවය වැඩිවීම යනාදිය සිදුවන බැවින්, වෙළෙඳ පහසුකම් සැලසීම මගින් වෙළෙඳපොළ වෙත ප්‍රවේශවීමේ හැකියාව වර්ධනය කරයි. 2016 දී නිමකිරීමට නියමිත දකුණු ආසියානු නිදහස් වෙළෙඳ වරණයෙහි (SAFTA) වෙළෙඳාම් ලිහිල් කිරීම් යටතේ කලාපය තුළ නිෂ්පාදන සඳහා වන රේගු බදු ක්‍රමයෙන් අඩු කරනු ඇත. අනෙකුත් සාමාජික රටවල නිෂ්පාදන සඳහා වන රේගු බදු 2014 වන විට දී සමාන වාරික හයකින් සියයට 0-5 දක්වා අඩු කිරීමට ශ්‍රී ලංකාව එකඟ වී ඇත. ශ්‍රී ලංකාව තවදුරටත් ඌන සංවර්ධිත රටක් නොවුව ද, ආර්ථිකයේ ප්‍රමාණය සහ අවදානම් සහගත බව අනුව දකුණු ආසියානු නිදහස් වෙළෙඳ වරණයේ සාකච්ඡාවල දී තවදුරටත් සහන ලබාගැනීම සඳහා සහ බදු ලිහිල් කිරීමේ කාලපරිච්ඡේදය තවදුරටත් දීර්ඝ කරගැනීම සඳහා බලපෑම් කිරීමට හැකිවිය. ආසියානු පැසිෆික් වෙළෙඳ ගිවිසුමේ (APTA) සාකච්ඡා තවදුරටත් පවත්වා ගනිමින් එහි හතරවන වටයේ සාකච්ඡා 2014 වසරේ මැද භාගයේ දී තායිලන්තයේ දී පැවැත්වීමට නියමිතය. බදු සහන, මූලාරම්භය පිළිබඳ නීති රීති ලිහිල් කිරීම සහ, වෙළෙඳාම පහසු කිරීම හා සේවා වෙළෙඳාම මත ආයෝජනය කිරීම පිළිබඳ ගිවිසුම් කෙටුම්පත, යනාදිය පිළිබඳව මෙම සාකච්ඡාවල දී අවධානය යොමු කරනු ඇත. මොන්ගෝලියාව සහ අනෙකුත් ආසියානු පැසිෆික් වෙළෙඳ ගිවිසුමේ සාමාජික රටවල් අතර පැවති සාකච්ඡා සාර්ථක ලෙස නිමා වූ බැවින් මොන්ගෝලියාව එම ගිවිසුමේ සාමාජිකයෙකු ලෙස 2013 වසරේ දී නීත්‍යානුකූලව පිළිගන්නා ලදී.


**ශ්‍රී ලංකාව විසින් බහුල ලෙස භාවිතා කරන්නා වූ වෙළෙඳ ගිවිසුම් වන, ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (ISFTA) සහ පකිස්ථානු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම (PSFTA) හරහා ද්වීපාර්ශ්වීය වෙළෙඳාම තවදුරටත් පුළුල් කිරීම සඳහා වසර තුළ දී කටයුතු කරන ලදී.** ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ද්වීපාර්ශ්වීය වෙළෙඳාම සහ ආයෝජන තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සඳහා නව මාවත් සෙවීම පිණිස ඉන්දු-ශ්‍රී ලංකා ඒකාබද්ධ කාර්ය බලකාය (JTF) ස්ථාපිත කරන ලද අතර, එහි ප්‍රථම හමුව 2013 ජූනි මාසයේ දී පවත්වන ලදී. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ ඇඟළුම් අපනයනය සඳහා වූ කෝටාව වන නිමි ඇඳුම් අයිතම මිලියන 8 ක ප්‍රමාණයෙන්, මිලියන 5 ක අයිතම ප්‍රමාණයක් මත පැවති රෙදිපිළි මූලාශ්‍රය පිළිබඳව වූ කොන්දේසි ඉන්දියාව විසින් ඉවත් කර ගන්නා ලදී. ඒ අනුව, කෝටාව යටතේ වූ සියලුම අයිතම කොන්දේසිවලින් තොරව තීරු බදුවලින් නිදහස්ව අපනයනය කළ හැකිය. නොවිසඳුනු ගැටලු

කිහිපයක් සාකච්ඡා කිරීම සඳහා පාකිස්ථානු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුමේ තාක්ෂණික මට්ටමේ පස්වන හමුව පැවැත්විණි. ඒ අනුව, මදුරු විකර්ෂක දඟර, බෝතල් ශීතකරණ යන්ත්‍ර, පිරිපහදු නොකළ පොල්තෙල්, බුලත් සහ ශාකසාර රූපලාවන්‍ය නිමැවුම් යන නිෂ්පාදන වර්ග පහට අදාළ වෙළෙඳපොළ කොටස රැකගැනීමට ශ්‍රී ලංකාව සමත්විය. චීනය සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළඹීමට ඇති හැකියාව පිළිබඳ ශ්‍රී ලංකාව සොයා බලමින් සිටියි. ඒ අනුව, ශ්‍රී ලංකාව සහ චීනය අතර නිදහස් වෙළෙඳ ගිවිසුමකට එළඹීමට ඇති ශක්‍යතාව පිළිබඳව ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයනයක් මේ වන විට සිදු කෙරෙමින් පවතී. පිළිගත් සන්නාම සහිත රෙදිපිළි හා ඇඟළුම්, තේ, මැණික් සහ ස්වර්ණාභරණ වැනි තත්ත්වයෙන් උසස් නිෂ්පාදන, යෝජිත නිදහස් වෙළෙඳ ගිවිසුම භාවිතා කර ඒ සඳහා යෝග්‍ය වෙළෙඳපොළ කොටස් වෙත සැපයීම සඳහා ශ්‍රී ලංකාවට හැකි වනු ඇති අතර, එමගින් චීනය වෙත ශ්‍රී ලංකාවෙන් කරනු ලබන අපනයන ඉහළ නැංවීම හරහා ශ්‍රී ලංකාව සහ චීනය අතර පවතින වෙළෙඳ හිඟය අඩුකර ගැනීමට හැකිවනු ඇත. පසුගිය වසරට සාපේක්ෂව 2013 වසරේ දී වෙළෙඳ ගිවිසුම්හි සමස්ත උපයෝජනයේ වැඩිවීමක් දක්නට ලැබිණි.

## 5.3 භාණ්ඩ වෙළෙඳාම, වෙළෙඳ ශේෂය, වෙළෙඳ මිල අනුපාතය සහ වෙළෙඳ දිශාව

### 5.3.1 අපනයන ක්‍රියාකාරිත්වය

**ගෝලීය ආර්ථිකය මධ්‍යස්ථ ලෙස වර්ධනය වීමත් සමඟ 2013 වසරේ දී අපනයන යථා තත්ත්වයට පත් විය.** මාස පහළොවක් මුළුල්ලේ පැවති අඛණ්ඩ පහත වැටීමෙන් අනතුරුව 2013 ජුනි මාසයේ සිට අපනයන ආදායමෙහි වර්ධනයක් වාර්තා විය. 2012 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 9,774 ක් දක්වා සියයට 7.4 කින් පහත වැටුණු අපනයන ආදායම 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 10,394 ක් දක්වා සියයට 6.4 කින් වර්ධනය විය. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වෙළෙඳපොළවල් වන යුරෝපා සංගමය හා ඇමෙරිකා එක්සත් ජනපදය මධ්‍යස්ථ ලෙස යථාතත්ත්වයට පත්වීම හේතුවෙන්, 2013 වසරේ දෙවන භාගයේ සිට අපනයන ආදායම යහපත් වර්ධනයක් වාර්තා කළේය. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් පුළුල් වීම, සුහදායී ආයෝජන පරිසරය සහ හිතකර විදේශ වෙළෙඳ ප්‍රතිපත්ති ද 2013 වසරේ දී අපනයන වර්ධනය සඳහා දායකත්වය ලබාදුණි.




**මුළු අපනයන ආදායමෙන් හතරෙන් තුනක් පමණ වන කාර්මික අපනයන මගින් අපනයන ආදායමේ වර්ධනය සඳහා විශාලතම දායකත්වය ලැබුණි.** 2013 වසරේ දී කාර්මික අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 7,749 ක් දක්වා සියයට 5.1 කින් වර්ධනය වූ අතර, 2013 වසරේ මුළු අපනයන ආදායමෙන් සියයට 43.4 කට දායකත්වය ලබාදුන් රෙදිපිළි හා ඇඟළුම් අපනයනවල යහපත් ක්‍රියාකාරිත්වය මේ සඳහා හේතු විය. ඇඟළුම් කර්මාන්තය අපේක්ෂා කළ එ.ජ.ඩොලර් බිලියන 4 ක ඉලක්කය අභිබවා යමින්, 2013 වසරේ දී රෙදිපිළි හා ඇඟළුම් අපනයන ආදායම එ.ජ.ඩොලර් බිලියන 4.5 ක් දක්වා සියයට 13 කින් වර්ධනය විය. ශ්‍රී ලංකාවේ අපනයනයන් සිදු කරන ප්‍රධාන ආර්ථිකයන් වන, යුරෝපා සංගමය සහ ඇමෙරිකා එක්සත් ජනපදය යථාතත්ත්වයට පත්වෙමින් පැවතීමේ ප්‍රතිලාභ අත්කර ගනිමින් එම රටවල් වෙත 2013 වසරේ දී කළ ඇඟළුම් අපනයනයන් පිළිවෙළින් සියයට 6.8 කින් සහ සියයට 21 කින් වර්ධනය විය. වෙළෙඳපොළ විවිධාංගීකරණය, විශේෂඥ දැනුම අත්පත් කර ගැනීම, පූර්ව සහ සිරස් නිෂ්පාදන ක්‍රියාවලින් සම්බන්ධීකරණය කිරීම සහ වටිනාකම් ක්‍රියාවලියෙහි ඉහළ අගයක් ගෙන දෙන ක්‍රියාවලීන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම යනාදිය රෙදිපිළි හා ඇඟළුම් කර්මාන්තයෙහි ශීඝ්‍ර වර්ධනය සඳහා හේතු විය. 2013 වසරේ දී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන අඩු වීම රෙදිපිළි හා ඇඟලුම් කර්මාන්තයේ එකතු කළ අගය ඉහළ යෑම පෙන්නුම් කළ අතර ඒ හේතුවෙන් ආනයනය මත යැපීම අඩු වී ඇත. ඒ අනුව, සමස්ත ඇඟළුම් කර්මාන්තයේ ආනයන මත රැඳියාවේ සාමාන්‍ය අනුපාතය 2012 වසරේ දී පැවති සියයට 57 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී සියයට 45 ක් දක්වා අඩු විය.

**අනෙකුත් කාර්මික අපනයන ආදායම 2013 වසරේ දී මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් වාර්තා කරන ලදී.** කාර්මික අපනයනයන්හි වර්ධනයට දෙවන විශාලතම දායකත්වය ලබාදෙමින් රබර් නිෂ්පාදිත අපනයන

**5.2 සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය**

| කාණ්ඩය | 2012 | | 2013 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ.ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස් වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,331.5** | **23.9** | **2,581.1** | **24.8** | **249.6** | **10.7** | **40.2** |
| තේ | 1,411.9 | 14.4 | 1,542.2 | 14.8 | 130.3 | 9.2 | 21.0 |
| රබර් | 125.1 | 1.3 | 71.3 | 0.7 | -53.8 | -43.0 | -8.7 |
| පොල් | 208.9 | 2.1 | 204.6 | 2.0 | -4.3 | -2.0 | -0.7 |
| කුළු බඩු | 256.1 | 2.6 | 355.4 | 3.4 | 99.3 | 38.8 | 16.0 |
| එළවළු | 13.3 | 0.1 | 24.9 | 0.2 | 11.6 | 86.8 | 1.9 |
| සකස් නොකළ දුම්කොළ | 42.2 | 0.4 | 47.6 | 0.5 | 5.4 | 12.9 | 0.9 |
| සුළු කෘෂිකාර්මික අපනයන | 76.0 | 0.8 | 101.3 | 1.0 | 25.3 | 33.3 | 4.1 |
| මුහුදු ආහාර | 198.0 | 2.0 | 233.7 | 2.2 | 35.7 | 18.1 | 5.8 |
| **කාර්මික අපනයන** | **7,371.2** | **75.4** | **7,749.4** | **74.6** | **378.3** | **5.1** | **60.9** |
| රෙදිපිළි හා ඇඟළුම් | 3,991.1 | 40.8 | 4,508.3 | 43.4 | 517.2 | 13.0 | 83.3 |
| රබර් නිෂ්පාදිත | 859.4 | 8.8 | 887.8 | 8.5 | 28.4 | 3.3 | 4.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 463.0 | 4.7 | 427.7 | 4.1 | -35.2 | -7.6 | -5.7 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 558.9 | 5.7 | 445.5 | 4.3 | -113.4 | -20.3 | -18.3 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 284.3 | 2.9 | 235.2 | 2.3 | -49.1 | -17.3 | -7.9 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 297.5 | 3.0 | 312.3 | 3.0 | 14.8 | 5.0 | 2.4 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 41.8 | 0.4 | 36.3 | 0.3 | -5.5 | -13.1 | -0.9 |
| ප්‍රවාහන උපකරණ | 164.9 | 1.7 | 146.3 | 1.4 | -18.6 | -11.3 | -3.0 |
| සම්, ගමන් මලු හා පාවහන් | 55.4 | 0.6 | 76.8 | 0.7 | 21.5 | 38.7 | 3.5 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 35.8 | 0.4 | 40.4 | 0.4 | 4.6 | 13.0 | 0.7 |
| අනෙකුත් කාර්මික අපනයන | 619.2 | 6.3 | 632.7 | 6.1 | 13.5 | 2.2 | 2.2 |
| **ඛනිජ අපනයන** | **61.3** | **0.6** | **51.6** | **0.5** | **-9.7** | **-15.9** | **-1.6** |
| **වර්ග නොකළ අපනයන** | **9.6** | **0.1** | **12.2** | **0.1** | **2.6** | **26.6** | **0.4** |
| **මුළු අපනයන (ආ) (ඇ)** | **9,773.5** | **100.0** | **10,394.3** | **100.0** | **620.7** | **6.4** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඈ)** | **127.60** | | **129.11** | | | | |

(අ) තාවකාලික
(ආ) ගලපන ලද
(ඇ) ප්‍රති අපනයන ඇතුළත් නොවේ
(ඈ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ආදායම 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 888 ක් දක්වා සියයට 3.3 කින් වර්ධනය විය. ස්වභාවික රබර් මිල ගණන් පහත වැටීම සහ ඇමෙරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය වැනි දියුණු ආර්ථිකයන් වෙතින් පැවති ඉල්ලුම ඉහළ යාමත් සමඟ ශල්‍ය හා අනෙකුත් අත්වැසුම් සහ ටයර් අපනයන වර්ධනය වීම, රබර් නිෂ්පාදිත අපනයනය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2013 වසරේ දී සම් භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 77 ක් දක්වා සියයට 38.7 කින් වර්ධනය වූ අතර, පාවහන් අපනයනය දෙගුණයකට වඩා වැඩි වේගයකින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. අපනයන සංවර්ධන මණ්ඩලය, කර්මාන්ත සංවර්ධන මණ්ඩලය සහ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය මගින් ලබා දෙන්නා වූ අඛණ්ඩ සහයෝගයට අමතරව, රජය මගින් සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා අවශ්‍ය වන යන්ත්‍රෝපකරණ තීරු බදු රහිතව ආනයනය කිරීම සඳහා පහසුකම් සලසා දෙමින් මෙම ක්ෂේත්‍රයට අනුග්‍රහය දක්වන ලදී. පරිණාමක, ස්ථිතික පරිවර්තක, සංචායක, බර මනින යන්ත්‍ර සහ අනෙකුත් ගෘහ උපකරණ ඇතුළත් වූ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයනය, 2013 වසරේ දී වර්ධනය විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් ගෝලීය ඉල්ලුම අඩුවීම හේතුවෙන් මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ අපනයන ආදායම 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 446 ක් දක්වා සියයට 20.3 කින් අඩු විය. අන්තර්ජාතික වෙළෙඳපොළෙහි රත්‍රන් මිල තියුණු ලෙස පහත වැටීමද, මෙම අගය අඩුවීම සඳහා හේතු විය. කලාපීය වරායන් මගින් වූ තරගකාරිත්වය ඉහළ යාම සහ ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි නැව් සඳහා භාවිතා කරන ඉන්ධන මිල ගණන් පහත වැටීම හේතුවෙන් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 428 ක් දක්වා සියයට 7.6 කින් පහත වැටුණි. ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවෙකු විසින් තිරිඟු පිටි ආනයනයේ දී සීමාවන් පැනවීමත් සමඟ

තිරිඟු පිටි අපනයනය පහත වැටීම, ආහාර, පාන හා දුම්කොළ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 235 ක් දක්වා සියයට 17.3 කින් පහත වැටීම සඳහා මූලික වශයෙන් හේතු විය. වසර තුළදී රුවල් බෝට්ටු සහ සෙසු ජලයේ පාවෙන යන්ත්‍රෝපකරණ අපනයන සැලකිය යුතු ලෙස වර්ධනය වුවද, බයිසිකල් සහ කාර් වැනි රථවාහන අපනයනය පහත වැටීම හේතුවෙන් ප්‍රවාහන උපකරණ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 146 ක් දක්වා සියයට 11.3 කින් පහත වැටුණි.


**මුළු අපනයන ආදායමෙන් ආසන්න වශයෙන් හතරෙන් එකක් පමණ වන කෘෂිකාර්මික අපනයන 2013 වසරේ අපනයන ආදායමේ සමස්ත වර්ධනයට සියයට 40 ක පමණ දායකත්වයක් ලබාදුණි.** 2013 වසරේ කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 2,581 ක් දක්වා සියයට 10.7 කින් වර්ධනය විය. 2013 වසරේ තේ අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 9.2 කින් වර්ධනය වෙමින් එ.ජ.ඩොලර් මිලියන 1,542 ක් ලෙස මෙතෙක් වාර්තා වූ ඉහළම වාර්ෂික ආදායම අත්කර ගත් අතර, ශ්‍රී ලංකා තේවල (Ceylon Tea) ඉහළ ගුණාත්මකභාවය සහ සාම්ප්‍රදායික තේ සඳහා පැවැති ඉහළ ජාත්‍යන්තර ඉල්ලුම හේතුවෙන් ශ්‍රී ලංකා තේ මිල ගණන් ඉහළ යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල 2012 වසරේ දී වූ එ.ජ.ඩොලර් 4.41 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් 4.82 ක් දක්වා සියයට 9.3 කින් වර්ධනය විය. කෙසේ වුවද, 2013 වසරේ තේ අපනයන පරිමාව 2012 වසරේ පැවති කිලෝග්‍රෑම් මිලියන 320 මට්ටමේම පැවතුණි. 2013 වසරේ දී ද මැද පෙරදිග ශ්‍රී ලංකාවේ ප්‍රධාන තේ අපනයනය කරන කලාපය ලෙස තවදුරටත් පැවතුණි. 2013 වසරේ දී රබර් අපනයන ආදායම සියයට 43 කින් පහත වැටුණු අතර, එකතු කළ අගය සහිත අපනයන නිෂ්පාදනය සඳහා දේශීය වෙළෙඳපොළේ රබර් භාවිතය ඉහළ යාම මේ සඳහා බොහෝ සෙයින් හේතු විය. කෙසේ වුවද, ස්වභාවික රබර් නිෂ්පාදනය කරන රටවල නිෂ්පාදන පරිමාවන් ඉහළ යාම වසර පුරාම රබර් මිල ගණන් පහත වැටීමට බලපාන ලදී. රබර් කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල 2012 දී පැවති එ.ජ.ඩොලර් 3.35 සිට 2013 දී එ.ජ.ඩොලර් 3.02 දක්වා සියයට 9.7 කින් පහත වැටුණි. 2013 වසරේ දී පොල් මද ආශ්‍රිත නිෂ්පාදන අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 86 ක් දක්වා සියයට 7.6 කින් වර්ධනය වුවද, පොල්කෙඳි සහ පොල් කටු වැනි අනෙකුත් පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම පහළ යාම හේතුවෙන් පොල් අපනයනයෙන් ලද මුළු ආදායම එ.ජ.ඩොලර් මිලියන 205 ක් දක්වා සියයට 2 කින් පහත වැටුණි.

**කෘෂිකාර්මික අපනයනයන්ගේ සමස්ත වර්ධනයට දායකත්වය ලබාදෙමින්, කුළුබඩු, එළවළු, සකස් නොකළ දුම්කොළ, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ මුහුදු ආහාර වැනි අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදිතයන්ගෙන් ලද අපනයන ආදායම 2013 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** 2013 වසරේ දී කුළුබඩු අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 355 ක් දක්වා සියයට 38.8 කින් ඉහළ යන ලදී. ගම්මිරිස් අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 128 ක් දක්වා සියයට 82.9 කින් ද කරාබුනැටි අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 50 දක්වා සියයට 169.4 කින් ද වර්ධනය වීම මේ සඳහා මූලික වශයෙන් හේතු විය. කුළු බඩු සඳහා පවතින ඉහළ මිල සහ 'ගම නැගුම' වැඩසටහන හරහා කරන ලද දිරිමත් කිරීම් තුළින් කුළු බඩු වර්ග වගා කිරීම ඉහළ යාම මෙන්ම, කෘෂිකාර්මික අපනයන දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ව්‍යාප්ති සේවාවන්, වසර තුළ දී කුළු බඩු අපනයන සැලකිය යුතු ලෙස ඉහළ යාම සඳහා දායක විය. මේ අතර, 2013 වසරේ දී සකස් නොකළ දුම්කොළ සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයනයෙන් ලද ආදායම් පිළිවෙළින් සියයට 12.9 කින් සහ සියයට 33.3 කින් ඉහළ ගිය අතර, හිතකර කාලගුණික තත්ත්වයන් මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. අලුත් මාළු, සකස් කරන ලද මාළු, ශීත කළ මාළු මෙන්ම සමුද්‍ර මෘදුවංශීන්ගේ අපනයන ආදායම ඉහළයාමත් සමඟ මෙම වසර තුළ දී මුහුදු ආහාර අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 234 ක් දක්වා සියයට 18.1 කින් වර්ධනය විය.

### 5.3.2 ආනයන ක්‍රියාකාරිත්වය

**පෙර වසරේ අනුරූප කාලය සමඟ සැසඳීමේ දී 2012 වසරේ අප්‍රේල් මාසයේ සිට අඛණ්ඩව පහත වැටුණු ආනයන වියදම, 2013 වසරේ බොහෝ මාසයන්හි දී ද පහත වැටුණි.** ආනයන වඩාත්

**5.4 රූප සටහන** භාණ්ඩ අනුව ආනයන - 2013



**5.3 සංඛ්‍යා සටහන**

## ආනයන සංයුතිය

| කාණ්ඩය | 2012 (අ) වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | 2012 (අ) දායකත්වය % | 2013 (ආ) වටිනාකම එ.ජ.ඩොලර් මිලියන | 2013 (ආ) දායකත්වය % | වටිනාකමේ වෙනස එ.ජ.ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස්වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | **2,995.2** | **15.6** | **3,182.5** | **17.7** | **187.3** | **6.3** | **-15.8** |
| ආහාර හා පාන වර්ග | 1,304.4 | 6.8 | 1,368.1 | 7.6 | 63.7 | 4.9 | -5.4 |
| සහල් | 24.4 | 0.1 | 17.9 | 0.1 | -6.5 | -26.6 | 0.5 |
| සීනි සහ රසකැවිලි | 346.7 | 1.8 | 290.6 | 1.6 | -56.0 | -16.2 | 4.7 |
| කිරි නිෂ්පාදිත | 307.3 | 1.6 | 291.0 | 1.6 | -16.4 | -5.3 | 1.4 |
| පරිප්පු | 69.0 | 0.4 | 104.1 | 0.6 | 35.1 | 51.0 | -3.0 |
| වෙනත් | 557.0 | 2.9 | 664.4 | 3.7 | 107.4 | 19.3 | -9.0 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 1,690.8 | 8.8 | 1,814.4 | 10.1 | 123.6 | 7.3 | -10.4 |
| රථවාහන | 495.1 | 2.6 | 582.2 | 3.2 | 87.1 | 17.6 | -7.3 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 372.2 | 1.9 | 378.3 | 2.1 | 6.1 | 1.6 | -0.5 |
| ගෘහ උපකරණ | 218.5 | 1.1 | 192.2 | 1.1 | -26.2 | -12.0 | 2.2 |
| රෙදිපිළි සහ උපාංග | 174.5 | 0.9 | 201.7 | 1.1 | 27.2 | 15.6 | -2.3 |
| වෙනත් | 430.5 | 2.2 | 460.0 | 2.6 | 29.5 | 6.9 | -2.5 |
| **අන්තර් භාණ්ඩ** | **11,577.6** | **60.3** | **10,553.7** | **58.6** | **-1,023.8** | **-8.8** | **86.2** |
| ඉන්ධන | 5,044.6 | 26.3 | 4,308.2 | 23.9 | -736.4 | -14.6 | 62.0 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,266.4 | 11.8 | 2,045.8 | 11.4 | -220.5 | -9.7 | 18.6 |
| දියමන්ති සහ අගනා ලෝහ | 587.7 | 3.1 | 482.9 | 2.7 | -104.9 | -17.8 | 8.8 |
| රසායනික නිෂ්පාදිත | 669.7 | 3.5 | 734.3 | 4.1 | 64.6 | 9.6 | -5.4 |
| තිරිඟු සහ ඉරිඟු | 363.8 | 1.9 | 323.2 | 1.8 | -40.6 | -11.2 | 3.4 |
| පොහොර | 311.0 | 1.6 | 238.7 | 1.3 | -72.3 | -23.3 | 6.1 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 2,334.4 | 12.2 | 2,420.8 | 13.4 | 86.4 | 3.7 | -7.3 |
| **ආයෝජන භාණ්ඩ** | **4,589.8** | **23.9** | **4,252.7** | **23.6** | **-337.1** | **-7.3** | **28.4** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,237.4 | 6.4 | 1,357.2 | 7.5 | 119.8 | 9.7 | -10.1 |
| ප්‍රවාහන උපකරණ | 991.9 | 5.2 | 667.8 | 3.7 | -324.1 | -32.7 | 27.3 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 2,356.0 | 12.3 | 2,221.9 | 12.3 | -134.1 | -5.7 | 11.3 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 4.5 | ... | 5.8 | ... | 1.3 | 28.5 | -0.1 |
| **වර්ග නොකළ ආනයන** | **27.7** | **0.1** | **13.9** | **0.1** | **-13.8** | **-50.0** | **1.2** |
| **මුළු ආනයන (ඇ) (ඈ)** | **19,190.2** | **100.0** | **18,002.8** | **100.0** | **-1,187.4** | **-6.2** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතය (ඉ)** | **127.60** | | **129.11** | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ගලපන ලද
(ඈ) ප්‍රති ආනයන ඇතුළත් නොවේ
(ඉ) විනිමය අනුපාතය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන් : ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම
සීමාසහිත සෙරන්ඩිබ් ෆ්ලාර් මිල්ස් පුද්ගලික සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ඵලදායී ලෙස සිදු කිරීම සඳහා 2012 වසරේ දී ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්හි බලපෑම මෙන්ම, ඉන්ධන ආනයන වියදම අඩුවීම සහ අන්තර්ජාතික වෙළෙඳපොළේ වෙළෙඳ භාණ්ඩයන්හි මිල ගණන් පහළයාම, 2013 වසරේ දී ආනයන වියදම පෙර වසර හා සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 18,003 දක්වා සියයට 6.2 කින් පහත වැටීමට හේතුවිය. පාරිභෝගික භාණ්ඩ හැර අනෙකුත් ප්‍රධාන කාණ්ඩ සියල්ලකම ආනයන සැලකිය යුතු ලෙස පහත වැටුණි. ලොව පුරා ප්‍රධාන ආර්ථිකයන් මන්දගාමී අයුරින් යථා තත්ත්වයට පත්වීම තෙල් මිල ද ඇතුළුව වෙළෙඳ භාණ්ඩයන්හි ජාත්‍යන්තර මිල ගණන් අඩුවීමට හේතු වූ අතර, එය සමස්ත ආනයන වියදම පහත වැටීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. 2013 වසරේ දී ඉන්ධන හැර අනෙකුත් ආනයන සඳහා වූ වියදම එ.ජ.ඩොලර් මිලියන 13,695 ක් දක්වා සියයට 3.2 කින් පහත වැටුණි.

**ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, පොහොර සහ දියමන්ති හා වටිනා ගල් වර්ග ඇතුළත් අන්තර් භාණ්ඩ ආනයන වියදම පහත වැටීම, සමස්ත ආනයන වියදම පහත වැටීම සඳහා වැඩි වශයෙන් හේතු විය.** අගයන් අනුව සැලකීමේ දී, මුළු ආනයනයන්ගෙන් සියයට 59 ක් පමණ වන අන්තර් භාණ්ඩ ආනයන වියදම 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 10,554 ක්

**5.4 සංඛ්‍යා සටහන** **ප්‍රධාන ආනයනයන්හි පරිමාවන්**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2009 | 2010 | 2011 | 2012 | 2013 (අ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **52** | **126** | **28** | **36** | **23** |
| 1 වන කාර්තුව | 3 | 121 | 8 | 15 | 9 |
| 2 වන කාර්තුව | 3 | 2 | 2 | 7 | 6 |
| 3 වන කාර්තුව | 2 | 2 | 9 | 10 | 4 |
| 4 වන කාර්තුව | 44 | 1 | 9 | 4 | 4 |
| **තිරිඟු (ආ)** | **1,026** | **1,051** | **1,242** | **1,084** | **895** |
| 1 වන කාර්තුව | 288 | 352 | 322 | 353 | 197 |
| 2 වන කාර්තුව | 229 | 171 | 455 | 235 | 326 |
| 3 වන කාර්තුව | 220 | 292 | 254 | 291 | 170 |
| 4 වන කාර්තුව | 289 | 236 | 211 | 205 | 201 |
| **සීනි** | **466** | **548** | **606** | **569** | **548** |
| 1 වන කාර්තුව | 123 | 145 | 163 | 158 | 126 |
| 2 වන කාර්තුව | 110 | 145 | 170 | 135 | 175 |
| 3 වන කාර්තුව | 142 | 154 | 124 | 114 | 118 |
| 4 වන කාර්තුව | 92 | 104 | 149 | 162 | 129 |
| **බොර තෙල් (ආ)** | **2,066** | **1,819** | **2,070** | **1,486** | **1,743** |
| 1 වන කාර්තුව | 559 | 332 | 557 | 558 | 482 |
| 2 වන කාර්තුව | 417 | 541 | 555 | 413 | 545 |
| 3 වන කාර්තුව | 416 | 541 | 410 | 137 | 315 |
| 4 වන කාර්තුව | 673 | 405 | 547 | 379 | 401 |
| **පිරිපහදු ඛනිජ තෙල් (ආ)** | **2,162** | **2,882** | **3,501** | **3,961** | **3,201** |
| 1 වන කාර්තුව | 411 | 789 | 702 | 1,036 | 673 |
| 2 වන කාර්තුව | 607 | 881 | 807 | 903 | 756 |
| 3 වන කාර්තුව | 567 | 507 | 1,022 | 997 | 791 |
| 4 වන කාර්තුව | 577 | 705 | 970 | 1,025 | 981 |
| **පොහොර** | **462** | **649** | **801** | **640** | **600** |
| 1 වන කාර්තුව | 46 | 88 | 131 | 129 | 61 |
| 2 වන කාර්තුව | 83 | 238 | 207 | 176 | 139 |
| 3 වන කාර්තුව | 110 | 165 | 266 | 226 | 187 |
| 4 වන කාර්තුව | 223 | 158 | 197 | 108 | 214 |

(අ) තාවකාලික
(ආ) ගලපන ලද

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි. ඕ. සී. සමාගම
සීමාසහිත ප්‍රීමා ලංකා සමාගම
සීමාසහිත සෙරෙන්ඩිබ් ෆ්ලාර් මිල්ස් පුද්ගලික සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

දක්වා සියයට 8.8 කින් පහත වැටුණි. මුළු ආනයන වියදමෙන් හතරෙන් එකක් පමණ වන ඉන්ධන ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 4,308 දක්වා සියයට 14.6 කින් පහත වැටුණු අතර, අන්තර්ජාතික වෙළෙඳපොළේ ඛනිජ තෙල් මිල ගණන් පහත වැටීම සහ වසර තුළ විදුලිබල උත්පාදනය සඳහා තාප විදුලි බලය භාවිතය අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයනික මිල 2012 වසරේ දී එ.ජ.ඩොලර් 114.00 ක්ව පැවති අතර, 2013 වසරේ දී එය එ.ජ.ඩොලර් 109.84 ක් දක්වා පහත වැටුණි. දේශීය නිෂ්පාදනය වර්ධනය වීමේ ප්‍රතිඵලයක් ලෙස ඇඟළුම් කර්මාන්තයෙහි එකතු කළ අගය ඉහළ නංවමින්, 2013 වසරේ දී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයනය එ.ජ.ඩොලර් මිලියන 2,046 ක් දක්වා සියයට 9.7 කින් පහත වැටුණි. පොහොර ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 239 ක් දක්වා සියයට 23.3 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. පැවැති පොහොර තොග භාවිතයට ගැනීමත්, අනවශ්‍ය අන්දමින් සිදුවන පොහොර භාවිතය අඩු කිරීමට සහ කෘෂිකාර්මික නිෂ්පාදිතයන් සඳහා කාබනික පොහොර භාවිතය දිරිමත් කිරීමට රජය විසින් ගෙන ඇති ප්‍රයත්නයත්, පොහොර ආනයන පරිමාව පහත වැටීම සඳහා තරමක් දුරට හේතුවිය. මේ අතර, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයන පහත වැටීමට සමගාමීව දියමන්ති සහ වටිනා ගල් හා ලෝහ වර්ග ආනයන වියදම ද සියයට 17.8 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. කෙසේ වුවද, දියමන්ති, වටිනා ගල් වර්ග හා ලෝහ වර්ග කාණ්ඩයේ ප්‍රධානතම උප කාණ්ඩය වන රත්‍රන් ආනයනය 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 200 ක් දක්වා සියයට 17.5 කින් වර්ධනය වූ අතර, වසරේ මුල් භාගයේ දී රත්‍රන් ආනයන වියදම සියයට 47.1 කින් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. රත්‍රන් ආනයනය සීමා කිරීම සඳහා 2013 ජූනි මාසයේ දී ආනයනික රත්‍රන් මත සියයට 5 ක රේගු බද්දක් ද, රේගු බද්ද මත සියයට සියයක අධිභාරයක් ද පනවන ලදී. එසේ වුවද, 2013 නොවැම්බර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි එම අධිභාරය ඉවත් කළ අතර, රේගු බද්ද සියයට 7.5 දක්වා ඉහළ නංවන ලදී. රසායනික නිෂ්පාදිත, ප්ලාස්ටික්, කඩදාසි හා කඩදාසි පුවරු, කෘෂිකාර්මික යෙදවුම්, ආහාර සැකසුම් සහ ඛනිජ නිෂ්පාදිත වැනි අනෙකුත් අන්තර් භාණ්ඩයන්හි ආනයන වියදම් ද වසර තුළ දී වර්ධනය විය.

**ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 4,253 ක් දක්වා සියයට 7.3 කින් පහත වැටුණු අතර, ප්‍රවාහන උපකරණ සහ යන්ත්‍රසූත්‍ර හා උපකරණ ආනයන වියදම් අඩුවීම මේ සඳහා මූලික වශයෙන් හේතු විය.** 2012 වසරේ දී ආනයනයන් ඵලදායී ලෙස සිදු කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයන්ට ප්‍රතිචාර දක්වමින් 2013 වසරේ දී ප්‍රවාහන උපකරණ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 668 ක් දක්වා සියයට 32.7 කින් පහත වැටුණි. නැව්, බෝට්ටු සහ ගුවන් යානා හැර ප්‍රවාහන උපකරණ යටතේ ඇති අනෙකුත් සියලුම කාණ්ඩයන්හි ආනයන වියදම් මෙම කාලපරිච්ඡේදය තුළ දී අඩුවිය. ඉංජිනේරු උපකරණ, විද්‍යුත් උපකරණ, විදුලි සංදේශ උපකරණ, කාර්යාලයීය යන්ත්‍රසූත්‍ර, වෛද්‍ය හා රසායනාගාර උපකරණ සහ යන්ත්‍ර හා උපකරණ කොටස් යන කාණ්ඩ ඇතුළත් වන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයන වියදම 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 2,222 ක් දක්වා සියයට 5.7 කින් පහත වැටුණි.


කෙසේ වුවද, මූලික වශයෙන් සිමෙන්ති, යකඩ හා වානේ, ඇළුමිනියම් උපාංග සහ ඛනිජ නිෂ්පාදිත ඇතුළත් වන ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,357 ක් දක්වා සියයට 9.7 කින් වැඩි වූ අතර, රජය සහ පෞද්ගලික අංශය විසින් සිදුකරනු ලබන මහා පරිමාණ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා වන ඉල්ලුම සපුරාලීමට අවශ්‍ය ද්‍රව්‍ය ආනයනය කිරීම මෙයට හේතු විය.

**පාරිභෝගික භාණ්ඩ ආනයන කාණ්ඩය යටතේ, ආහාර හා පාන මෙන්ම ආහාරමය නොවන භාණ්ඩයන්ගේ ආනයන වියදම් 2013 වසරේ දී සැලකිය යුතු ලෙස වර්ධනය විය.** මුළු ආනයනයන්ගෙන් සියයට 18 කට පමණ දායකත්වය ලබාදෙන පාරිභෝගික භාණ්ඩයන්ගේ සමස්ත ආනයන වියදම 2012 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 2,995 ක් වූ අතර, 2013 වසරේ දී එය එ.ජ.ඩොලර් මිලියන 3,182 ක් දක්වා සියයට 6.3 කින් වර්ධනය විය. එළවළු, මුහුදු ආහාර මෙන්ම තෙල් හා මේද ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන් ආහාර හා පාන ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,368 ක් දක්වා සියයට 4.9 කින් වර්ධනය විය. කෙසේ වුවද, සීනි හා රසකැවිලි නිෂ්පාදිත, කිරි නිෂ්පාදිත, පාන වර්ග හා ධාන්‍ය සහ ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත යනාදියෙහි ආනයන වියදම් මෙම කාලපරිච්ඡේදය තුළ දී පහත වැටුණි. දේශීය කිරි නිෂ්පාදිත දිරිමත් කිරීම සඳහා බටර්, යෝගට් සහ කිරි නිෂ්පාදිත ආනයන සඳහා පනවන ලද සෙස් බද්ද වැඩි කිරීම, කිරි නිෂ්පාදිත ආනයන වියදම සියයට 5.3 කින් අඩුවීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. ඒ අතරම, ප්‍රධාන වශයෙන් මෝටර් රථ ආනයනය සියයට 17.6 කින් වර්ධනය වීම හේතුවෙන් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,814 ක් දක්වා සියයට 7.3 කින් වර්ධනය විය. ඖෂධ හා වෛද්‍ය නිෂ්පාදිත, රෙදිපිළි හා උපාංග, විදුලි සංදේශ උපකරණ හා රබර් නිෂ්පාදිත වැනි ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩයන්ට අයත්වන අනෙකුත් කාණ්ඩයන්ගේ ආනයන ද මෙම කාලපරිච්ඡේදය තුළ දී වර්ධනය විය.

### 5.3.3 වෙළෙඳ ශේෂය

**අපනයන ආදායම වැඩිවීම සහ ආනයන වියදම අඩුවීම හේතුවෙන් 2013 වසරේ දී වෙළෙඳ හිඟය තියුණු ලෙස අඩු විය.** ඒ අනුව, 2012 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 9,417 ක්ව පැවැති වෙළෙඳ හිඟය 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 7,609 ක් දක්වා සියයට 19.2 කින් අඩු විය. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ දී සියයට 15.9 ක් වූ වෙළෙඳ ගිණුමේ හිඟය 2013 වසරේ දී සියයට 11.3 ක් දක්වා අඩු විය.

**5.5 රූප සටහන** අපනයන, ආනයන සහ වෙළෙඳ ශේෂය





### 5.3.4 වෙළෙඳ මිල අනුපාතය

**ආනයන මිල ගණන් සැලකිය යුතු ලෙස අඩුවීමේ හා අපනයන මිල ගණන් සුළු වශයෙන් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේ දී වෙළෙඳ මිල අනුපාතය වර්ධනය විය.** අපනයන මිල දර්ශකය, දර්ශක අංක 103.5 ක් දක්වා සියයට 0.4 කින් සුළු වශයෙන් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය, දර්ශක අංක 108.4 ක් දක්වා සියයට 5.9 කින් සැලකිය යුතු ලෙස අඩු විය. ඒ අනුව, වෙළෙඳ මිල අනුපාත දර්ශකය 2012 වසරේ දී දර්ශක අංක 89.5 ක සිට 2013 වසරේ දී දර්ශක අංක 95.5 ක් දක්වා සියයට 6.7 කින් වර්ධනය විය.

**ප්‍රධාන වෙළෙඳ භාණ්ඩයන්හි ජාත්‍යන්තර මිල ගණන් සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළ ද සමස්ත අපනයන මිල දර්ශකය සුළු වශයෙන් ඉහළ ගියේය.** මුළු අපනයනවලින් සියයට 58 කට වඩා වැඩි ප්‍රමාණයකට දායකත්වය ලබා දෙන ප්‍රධාන අපනයනයන් වන රෙදිපිළි හා ඇඟළුම් සහ තේ යන භාණ්ඩයන්හි සාමාන්‍ය මිල

**5.6 රූප සටහන** වෙළෙඳ මිල අනුපාතය සහ වෙළෙඳ දර්ශක



**5.5 සංඛ්‍යා සටහන**

**වෙළෙඳ දර්ශක (අ)**

2010 = 100

| කාණ්ඩය | වටිනාකම් දර්ශකය | | | පරිමා දර්ශකය | | | ඒකක වටිනාකම් දර්ශකය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2012 | 2013 (ආ) | වර්ධනය % | 2012 (ඇ) | 2013 (ආ) | වර්ධනය % | 2012 (ඇ) | 2013 (ආ) | වර්ධනය % |
| **අපනයන** | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **101.1** | **112.0** | **10.7** | **92.0** | **97.4** | **5.9** | **109.9** | **115.0** | **4.6** |
| තේ | 98.1 | 107.1 | 9.2 | 93.5 | 95.0 | 1.6 | 104.9 | 112.8 | 7.5 |
| රබර් | 72.2 | 41.2 | -43.0 | 69.6 | 45.5 | -34.6 | 103.9 | 90.5 | -12.9 |
| පොල් | 126.1 | 123.5 | -2.0 | 110.0 | 112.7 | 2.4 | 114.6 | 109.6 | -4.3 |
| කුළු බඩු | 123.6 | 171.5 | 38.8 | 84.1 | 115.2 | 37.0 | 147.0 | 148.9 | 1.3 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 106.4 | 141.8 | 33.3 | 132.9 | 162.6 | 22.3 | 80.0 | 87.2 | 9.0 |
| **කාර්මික අපනයන** | **121.0** | **127.2** | **5.1** | **120.2** | **127.4** | **6.0** | **100.7** | **99.8** | **-0.8** |
| රෙදිපිළි හා ඇඟළුම් | 119.0 | 134.4 | 13.0 | 109.8 | 121.1 | 10.3 | 108.4 | 111.0 | 2.4 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 175.9 | 162.5 | -7.6 | 115.3 | 116.9 | 1.4 | 152.6 | 139.0 | -8.9 |
| රබර් නිෂ්පාදිත | 154.4 | 159.5 | 3.3 | 112.6 | 109.0 | -3.2 | 137.1 | 146.3 | 6.7 |
| **ඛනිජ ද්‍රව්‍ය අපනයන** | **252.9** | **212.8** | **-15.9** | **106.7** | **81.0** | **-24.0** | **237.0** | **262.6** | **10.8** |
| **මුළු අපනයන** | **113.4** | **120.6** | **6.4** | **110.0** | **116.4** | **5.9** | **103.1** | **103.5** | **0.4** |
| **ආනයන** | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **121.0** | **128.6** | **6.3** | **111.9** | **119.2** | **6.6** | **108.2** | **107.9** | **-0.3** |
| ආහාර හා පාන වර්ග | 98.6 | 103.4 | 4.9 | 100.1 | 105.4 | 5.3 | 98.5 | 98.1 | -0.4 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 146.8 | 157.6 | 7.3 | 125.3 | 135.1 | 7.8 | 117.2 | 116.7 | -0.4 |
| **අන්තර් භාණ්ඩ** | **143.8** | **130.8** | **-9.1** | **118.3** | **113.6** | **-4.0** | **121.6** | **115.1** | **-5.3** |
| පොහොර | 129.5 | 99.4 | -23.3 | 97.0 | 88.4 | -8.8 | 133.5 | 112.3 | -15.9 |
| ඉන්ධන | 165.9 | 140.8 | -15.1 | 120.8 | 110.0 | -8.9 | 137.4 | 128.0 | -6.8 |
| රසායනික නිෂ්පාදිත | 128.8 | 141.2 | 9.6 | 116.9 | 128.1 | 9.6 | 110.2 | 110.3 | 0.1 |
| තිරිඟු සහ ඉරිඟු | 137.1 | 121.8 | -11.2 | 102.0 | 84.8 | -16.9 | 134.4 | 143.6 | 6.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 125.3 | 113.1 | -9.7 | 114.3 | 104.7 | -8.4 | 109.6 | 108.0 | -1.5 |
| ප්ලාස්ටික් | 114.7 | 121.8 | 6.2 | 116.9 | 116.9 | 0.1 | 98.1 | 104.2 | 6.2 |
| දියමන්ති සහ අගනා ලෝහ | 155.7 | 127.9 | -17.8 | 134.4 | 131.7 | -2.0 | 115.8 | 97.1 | -16.2 |
| **ආයෝජන භාණ්ඩ** | **166.6** | **154.4** | **-7.3** | **156.1** | **157.6** | **1.0** | **106.7** | **97.9** | **-8.2** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 150.6 | 165.2 | 9.7 | 137.6 | 153.9 | 11.9 | 109.5 | 107.3 | -1.9 |
| ප්‍රවාහන උපකරණ | 167.4 | 112.7 | -32.7 | 147.6 | 103.5 | -29.9 | 113.4 | 108.9 | -4.0 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 176.2 | 166.1 | -5.7 | 171.4 | 183.9 | 7.3 | 102.8 | 90.3 | -12.1 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 135.4 | 174.0 | 28.5 | 131.0 | 161.8 | 23.5 | 103.3 | 107.5 | 4.1 |
| **මුළු ආනයන** | **143.1** | **134.3** | **-6.2** | **124.2** | **123.8** | **-0.3** | **115.2** | **108.4** | **-5.9** |
| **වෙළෙඳ මිල අනුපාතය** | | | | | | | **89.5** | **95.5** | **6.7** |

(අ) එ.ජ.ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව


ගණන් ඉහළ යාම අපනයන මිල දර්ශකය ඉහළයාමට හේතු විය. රෙදිපිළි හා ඇඟළුම් අපනයන මිල ගණන් සියයට 2.4 කින් ඉහළ ගිය අතර තේ අපනයනයන්හි සාමාන්‍ය මිල සියයට 7.5 කින් වැඩි විය. නවීන තාක්ෂණය භාවිතය සහ නව සොයාගැනීම් තුළින් ඇඟළුම් කර්මාන්තයේ එකතු කළ අගය ඉහළ නැංවීම මෙන්ම වඩා යෝග්‍ය කුඩා වෙළෙඳපොළවල් වෙත කළ සැපයුම් වැඩිවීම, රෙදිපිළි හා ඇඟළුම්හි ඒකක මිල වැඩිවීමට හේතු විය. 2013 වසරේ දී කල්කටා සහ මුම්බාසා යන තේ වෙන්දේසිවල මිල ගණන් සැලකිය යුතු ලෙස අඩු වුවද, තත්ත්වයෙන් උසස් ශ්‍රී ලංකාවේ තේ සඳහා ඇති ඉල්ලුම වැඩිවීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ තේ අපනයනයන්හි සාමාන්‍ය මිල ගණන් ඉහළ ගියේය. කෙසේ වුවද, කාර්මික අපනයන යටතේ වර්ග කර ඇති ඛනිජ තෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සහ මූල ලෝහ අපනයන මිල ගණන් සහ කෘෂිකාර්මික නිෂ්පාදන යටතේ වර්ග කර ඇති රබර්, පොල්, මුහුදු ආහාර සහ එළවළු අපනයන මිල ගණන්, 2013 වසරේ දී පහත වැටුණි. ඒ අනුව, කෘෂිකාර්මික සහ ඛනිජ අපනයනයන්හි සාමාන්‍ය අපනයන මිල දර්ශක පිළිවෙළින් සියයට 4.6 කින් සහ සියයට 10.8 කින් වැඩි වූ අතර, කාර්මික අපනයනයන්හි අපනයන මිල දර්ශකය සියයට 0.8 කින් අඩු විය.

දියුණු ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීම අපේක්ෂිත මට්ටමට වඩා සෙමින් සිදුවීම සහ නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන්හි වර්ධනය මන්දගාමීවීම හේතුවෙන් ජාත්‍යන්තර වෙළෙඳපොළ භාණ්ඩ මිල ගණන්හි ඇති වූ පහත වැටීම පිළිබිඹු කරමින්, ප්‍රධාන ආනයන කාණ්ඩ සියල්ලෙහිම ආනයන මිල ගණන් පෙර වසරට සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි. ඛනිජ තෙල් සහ පොහොර ආනයන මිල ගණන්හි වාර්තා වූ සැලකිය යුතු අඩුවීම් සමස්ත ආනයන මිල දර්ශකයේ අඩුවීමට ප්‍රධාන ලෙස දායක විය. 2013 වසරේ දී ඛනිජ තෙල් සහ පොහොර ආනයනයන්හි සාමාන්‍ය මිල පිළිවෙළින් සියයට 6.8 කින් සහ සියයට 15.9 කින් පහත වැටුණි. සාම්ප්‍රදායික නොවන තෙල් නිෂ්පාදනය ශීඝ්‍ර ලෙස ඉහළ යාම මෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදයේ සහ යුරෝපා කලාපයේ වූ ඉල්ලුම අඩුවීම, තෙල් මිල අඩුවීමට හේතු විය. ආහාර හා පාන කාණ්ඩයෙහි සීනි මිල සියයට 12.3 කින් පහත වැටුණු අතර, බ්‍රසීල රියාලය දුර්වල වීම සහ අතිරික්ත සීනි නිෂ්පාදනය මේ සඳහා හේතු විය. ආයෝජන භාණ්ඩයන්හි සෑම උප කාණ්ඩයකම පාහේ මිල ගණන් අඩුවීම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන මිල ගණන් පහත වැටුණි. ඒ අනුව, 2013 වසරේ දී පාරිභෝගික, අන්තර් සහ ආයෝජන භාණ්ඩ යන කාණ්ඩයන්හි සාමාන්‍ය ආනයන මිල දර්ශකයන් පිළිවෙළින් සියයට 0.3 කින්, සියයට 5.3 කින් සහ සියයට 8.2 කින් පහත වැටුණි.


### 5.3.5 වෙළෙඳ දිශාව

2013 වසරේ දී ශ්‍රී ලංකාවේ අපනයනයන් සිදු කරන ප්‍රධාන රටවල් ලෙස කාර්මික රටවල් තවදුරටත් පැවති අතර, ආනයනවලින් සැලකිය යුතු කොටසක් ආසියානු රටවලින් සිදු කරන ලදී. 2013 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය තවදුරටත් ප්‍රධාන තැනක් ගත් අතර, අනතුරුව එක්සත් රාජධානිය සහ ඉන්දියාව අනෙකුත් ප්‍රධාන අපනයන වෙළෙඳපොළවල් විය. විශාලතම ආනයන ප්‍රභවය ලෙස ඉන්දියාවත් අනතුරුව චීනය සහ සිංගප්පූරුවත් ප්‍රධාන තැනක් ගන්නා ලදී. 2013 වසරේ දී ඉන්දියාව සමග සිදුකළ ද්විපාර්ශ්වීය වෙළෙඳ

**5.7 රූප සටහන — අපනයන වෙළෙඳ දිශාව**




**5.8 රූප සටහන — ආනයන වෙළෙඳ දිශාව**



ගනුදෙනුවල සම්පූර්ණ වටිනාකම එ.ජ.ඩොලර් බිලියන 3.7 ඉක්ම වූ අතර, ඉන්දියාව ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරු ලෙස තවදුරටත් පැවතුණි.

**ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළෙඳපොළ වන ඇමෙරිකා එක්සත් ජනපදය මුළු අපනයනවලින් ආසන්න වශයෙන් සියයට 24 කට දායක වූ අතර, අනතුරුව එක්සත් රාජධානිය සියයට 10.4 කට ද, ඉන්දියාව සියයට 5.2 කටද ලෙස දායක විය.** ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය වෙත කළ අපනයන අතුරින් රෙදිපිළි හා ඇඟළුම් අපනයන තවදුරටත් ප්‍රධාන තැනක් ගත්තා ලදී. මෙම ආර්ථිකයන් යථාතත්ත්වයට පත්වීමත් සමඟ ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය වෙත කළ මුළු අපනයන පිළිවෙළින් සියයට 17.3 කින් සහ සියයට 1.8 කින් වර්ධනය විය. කුළුබඩු, ප්‍රවාහන උපකරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ සත්ත්ව ආහාර ඉන්දියාව වෙත කළ ප්‍රධාන අපනයනයන් විය. 2013 වසරේ දී එක්සත් රාජධානිය හැර සෙසු යුරෝපා රටවල් අතරින් ඉතාලිය, ජර්මනිය සහ බෙල්ජියම - ලක්සම්බර්ග් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන වෙළඳපොළවල් වූ අතර, මුළු අපනයන සඳහා ඔවුන්ගේ දායකත්වය පිළිවෙළින් සියයට 4.9 ක්, සියයට 4.5 ක් සහ සියයට 4.3 ක් විය. ඉතාලියට සහ ජර්මනියට කරනු ලැබූ අපනයන අතුරින් ඇඟළුම් අපනයන ප්‍රධාන තැනක් ගත්තා ලද අතර, එය සමස්ත ඇඟළුම් අපනයනයෙන් සියයට 14 ක් පමණ විය. ශ්‍රී ලංකාවේ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ අපනයනවලින් සියයට 42 ක් පමණ දියමන්ති සඳහා ලොව ප්‍රමුඛ වෙළෙඳ මධ්‍යස්ථානයක් වන බෙල්ජියමට අපනයනය කරන ලදී. 2013 වසරේ දී ද ශ්‍රී ලංකාවේ ප්‍රධානතම තේ අපනයන ගැනුම්කරුවන් බවට පත් වූ මැද පෙරදිග හා ස්වාධීන පොදු රාජ්‍යමණ්ඩලීය රටවල් මුළු තේ අපනයනවලින් පිළිවෙළින් සියයට 46.3 කට සහ සියයට 24.1 කට දායක විය.

**2013 වසරේ දී ද අඛණ්ඩව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආනයන ප්‍රභවය වූ ඉන්දියාව මුළු ආනයනවලින් සියයට 17.6 කට පමණ දායකත්වය සැපයීය.** කෙසේ වුවද, 2013 වසරේ දී ඉන්දියාවෙන් කරන ලද ආනයන එ.ජ.ඩොලර් මිලියන 3,171 ක් දක්වා සියයට 12.9 කින් අඩු විය. ඛනිජ තෙල් නිෂ්පාදිත, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ඉන්දියාවෙන් සිදු කළ ප්‍රධාන ආනයනයන් විය. මෙම භාණ්ඩ අතුරින් බහුතරයකට ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ තීරුබදු රහිත පහසුකම් හිමි නොවුව ද, මිල තරගකාරිත්වය තුළින් සැලකිය යුතු වෙළෙඳපොළ කොටසක් රැකගැනීමට ඉන්දියාවට හැකි විය. චීනය සහ සිංගප්පූරුව පිළිවෙළින් දෙවන හා තෙවන ප්‍රධාන ආනයන මූලාශ්‍ර වූ අතර, එම රටවල්වල ආනයන දායකත්වය මුළු ආනයනයන්ගෙන් පිළිවෙළින් සියයට 16.4 ක් හා සියයට 9.3 ක් විය. චීනයෙන් කරන ලද ආනයන එ.ජ.ඩොලර් මිලියන 2,953 ක් දක්වා සියයට 10.7 කින් වර්ධනය වූ අතර, සිංගප්පූරුවෙන් කරන ලද ආනයන එ.ජ.ඩොලර් මිලියන 1,682 ක් විය. යන්ත්‍රසූත්‍ර හා උපකරණ, රෙදිපිළි හා උපාංග සහ ගොඩනැගිලි ද්‍රව්‍ය චීනයෙන් කරන ලද ප්‍රධාන ආනයනයන් විය. සිංගප්පූරුවෙන් කරන ලද ප්‍රධාන ආනයන, ඛනිජ තෙල් නිෂ්පාදිත හා යන්ත්‍රසූත්‍ර හා උපකරණවලින් සමන්විත විය. මුළු ආනයනවලින් සියයට 6.6 කට දායකත්වය ලබා දෙමින් හතරවන ප්‍රධාන ආනයන මූලාශ්‍රය ලෙස එක්සත් අරාබි එමීර් රාජ්‍යය තවදුරටත් පැවැතුණි. ඉරානයෙන් වෙනුවට ඕමානයෙන් බොරතෙල් ආනයනය සිදුකිරීම හේතුවෙන් 2013 වසරේ දී ඕමානයෙන් සිදුකළ ආනයන පෙර වසරට සාපේක්ෂව හය ගුණයකටත් වඩා ඉහළ අගයකින් වර්ධනය වූ අතර, ඕමානය පස්වන ප්‍රධාන ආනයන මූලාශ්‍රය බවට පත්විය.

## 5.4 ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

### 5.4.1 සේවා වෙළෙඳාම

**ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම්හි ඇති වූ වර්ධනයත් සමඟ 2013 වසර තුළ දී සේවා වෙළෙඳාමෙහි ඉහළ ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය.** 2013 වසරේ දී සේවා ගිණුමෙහි දළ ලැබීම් පසුගිය වසරට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 4,685 ක් දක්වා සියයට 23.3 කින් වර්ධනය විය. විදේශ ගමන් හා සංචාරක, ප්‍රවාහන, විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා උප අංශයන් වෙත වූ ඉහළ ලැබීම්, සේවා ගිණුමෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය. කලාපය තුළ මූලික සේවා අපනයන ආර්ථිකයක් ලෙස ශ්‍රී ලංකාවට නැගී ඒමට ඇති ශක්‍යතාවය පිළිබිඹු කරමින් වසර තුළ දී අනෙකුත් සේවා වෙත ද සැලකිය යුතු විදේශීය ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය.

#### ප්‍රවාහන සේවා

**සේවා ගිණුමෙහි ප්‍රධාන අංශය වන ප්‍රවාහන සේවා වසර තුළ දී ශීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කළේය.** මගී ගාස්තු, නැව් කුලී, වරාය සහ ගුවන් තොටුපොළ ආශ්‍රිත සේවාවන්ගෙන් සමන්විත ප්‍රවාහන සේවා සඳහා වූ දළ ලැබීම්, 2012 වසර තුළ දී ලද එ.ජ.ඩොලර් මිලියන 1,634 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,784 ක් දක්වා සියයට 9.2 කින් වර්ධනය විය. මේ අතර, ජාත්‍යන්තර වෙළෙඳ ක්‍රියාකාරකම් සහ විදේශගතවන ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙන්, 2013 වසර තුළ දී ප්‍රවාහන සේවා යටතේ වූ ගෙවීම් පසුගිය වසර සමඟ සැසඳීමේදී එ.ජ.ඩොලර් මිලියන 1,382 ක් දක්වා සියයට 17.9 කින් වර්ධනය විය.

**5.6 සංඛ්‍යා සටහන**

**ජංගම සහ ප්‍රාග්ධන ගිණුම**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන

| ශීර්ෂය | 2012 (අ) | | | 2013 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **භාණ්ඩ හා සේවා** | **13,573** | **21,729** | **-8,155** | **15,079** | **21,508** | **-6,429** |
| **භාණ්ඩ** | **9,774** | **19,190** | **-9,417** | **10,394** | **18,003** | **-7,609** |
| වෙළෙඳ භාණ්ඩ | 9,759 | 19,020 | -9,261 | 10,392 | 17,802 | -7,410 |
| මූල්‍ය නොවන රත්‍රන් | 14 | 170 | -156 | 2 | 201 | -199 |
| **සේවා** | **3,800** | **2,538** | **1,262** | **4,685** | **3,505** | **1,180** |
| ප්‍රවාහන | 1,634 | 1,172 | 462 | 1,784 | 1,382 | 402 |
| මුහුදු ප්‍රවාහන | 825 | 597 | 229 | 893 | 686 | 208 |
| නැව් කුලී | 825 | 597 | 229 | 893 | 686 | 208 |
| ගුවන් ප්‍රවාහන | 808 | 576 | 233 | 890 | 696 | 194 |
| මගී ගාස්තු | 717 | 509 | 207 | 791 | 620 | 171 |
| ගුවන් කුලී | 92 | 66 | 25 | 99 | 76 | 23 |
| සංචාරක (ඇ) | 1,039 | 710 | 328 | 1,715 | 1,188 | 527 |
| ඉදිකිරීම් | 50 | 9 | 41 | 55 | 26 | 29 |
| රක්ෂණ හා විශ්‍රාම වැටුප් සේවා | 107 | 64 | 43 | 109 | 85 | 24 |
| මූල්‍ය සේවා | 232 | 279 | -46 | 235 | 328 | -93 |
| විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා | 673 | 207 | 466 | 719 | 368 | 351 |
| විදුලි සන්දේශ | 109 | 68 | 41 | 114 | 87 | 27 |
| පරිගණක සේවා | 564 | 139 | 425 | 604 | 281 | 324 |
| වෙනත් ව්‍යාපාරික සේවා | 39 | 46 | -8 | 39 | 55 | -15 |
| රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන) | 27 | 51 | -24 | 28 | 73 | -45 |
| **ප්‍රාථමික ආදායම්** | **142** | **1,361** | **-1,219** | **148** | **1,965** | **-1,817** |
| සේවක වැටුප් | 14 | 34 | -20 | 15 | 66 | -51 |
| ආයෝජන ආදායම් | 128 | 1,327 | -1,199 | 133 | 1,899 | -1,767 |
| සෘජු ආයෝජන | 15 | 446 | -431 | 22 | 774 | -751 |
| ලාභාංශ | 15 | 200 | -185 | 22 | 422 | -400 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | - | 246 | -246 | - | 352 | -352 |
| විවිධ ආයෝජන | - | 408 | -408 | - | 576 | -576 |
| පොලී ආදායම් | - | 408 | -408 | - | 576 | -576 |
| කෙටි කාලීන | - | 46 | -46 | - | 48 | -48 |
| දිගු කාලීන | - | 362 | -362 | - | 528 | -528 |
| අනෙකුත් ආයෝජන | 23 | 473 | -450 | 20 | 550 | -530 |
| සංචිත වත්කම් | 90 | - | 90 | 91 | - | 91 |
| **ද්විතියික ආදායම්** | **6,038** | **646** | **5,392** | **6,428** | **788** | **5,639** |
| රජය | 53 | - | 53 | 21 | - | 21 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 5,985 | 646 | 5,339 | 6,407 | 788 | 5,619 |
| **ජංගම ගිණුම** | **19,754** | **23,736** | **-3,982** | **21,655** | **24,262** | **-2,607** |
| **ප්‍රාග්ධන ගිණුම** | **146** | **15** | **130** | **90** | **19** | **71** |
| ප්‍රාග්ධන සංක්‍රාම | 146 | 15 | 130 | 90 | 19 | 71 |
| රජය | 98 | - | 98 | 39 | - | 39 |
| සංස්ථා සහ කුටුම්භ | 47 | 15 | 32 | 51 | 19 | 32 |
| **ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම** | **19,900** | **23,751** | **-3,851** | **21,745** | **24,281** | **-2,536** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංචාරක පැමිණීම් ඉහළ යාම හේතුවෙන් 2013 වසරේ දී මගී ගාස්තු මත වූ දළ ලැබීම් පසුගිය වසරට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 791 ක් දක්වා සියයට 10.3 කින් වර්ධනය විය. වසර තුළ දී ශ්‍රී ලංකන් ගුවන් සමාගමට අයත් ගුවන් යානා මගින් ගමන් කළ මගීන් සංඛ්‍යාව ඉහළ යාම සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් ගමන් ගාස්තු ඉහළ අගයකට සංශෝධනය කිරීම මේ සඳහා උපකාරී විය. මේ වනවිට, ශ්‍රී ලංකන් ගුවන් සමාගම ලොවපුරා රටවල් 35 ක් තුළ ගමනාන්ත 65 ක් දක්වා ක්‍රියාත්මක වේ. මේ අතර, කලාපය තුළ වැඩි මගීන් පිරිසක් ගෙනයාමට ඉඩකඩ සලසාදෙමින්, 2013 වසරේ නොවැම්බර් මස මිහින් ලංකා ගුවන් සමාගම විසින් එහි එකොළොස්වන ගමනාන්තය ලෙස සීෂෙල්ස් (Seychelles) දක්වා සෘජු ගුවන් සේවා ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

2013 වසරේ දී නැව් කුලී, වරාය සහ ගුවන් තොටුපොළ ආශ්‍රිත සේවාවන්හි ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 993 ක් දක්වා සියයට 8.3 කින් වර්ධනය විය. වසර තුළ දී වරායන්හි භාණ්ඩ තොග සහ බහලුම් මෙහෙයවීම් වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. පවත්නා පද්ධතියට අඩි විස්සට සමාන බහලුම් ඒකක (TEUs) මිලියන 2.4 ක් එක් කරමින් 2013 වසරේ අගෝස්තු මාසයේ දී කොළඹ දකුණ වරායේ නවතම බහලුම් පර්යන්තය නිම කෙරිණි. මීට අමතරව, වරාය සහ ගුවන් තොටුපොළ ආශ්‍රිත ක්‍රියාකාරකම් තවදුරටත් පුළුල් කිරීමේ අරමුණ ඇතිව රජය විසින් කොළඹ සහ හම්බන්තොට වරායන් නිදහස් වරායන් (Free Ports) ලෙසත්, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළ බන්ධිත ප්‍රදේශයක් (Bonded Area) ලෙසත් ප්‍රකාශයට පත්කරන ලදී. දැනට ක්‍රියාත්මක වන වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන ව්‍යාපෘති නිම කිරීමත් සමඟ ඉදිරි වසරවල දී ඉහළ විදේශ විනිමය ලැබීම් ප්‍රමාණයක් අපේක්ෂා කෙරේ.

### විදේශ ගමන් සහ සංචාරක සේවා

රටේ පවතින සාමකාමී වාතාවරණයත් සමඟ සංචාරක අංශයෙහි දැනට සිදුකෙරෙමින් පවතින උපායමාර්ගික ආයෝජන, නවතම සංචාරක ආකර්ෂණයන් සහ මහා පරිමාණ ප්‍රවර්ධන වැඩසටහන් යානාදිය 2013 වසරේ දී ශ්‍රී ලංකාව වෙත සැලකිය යුතු සංචාරක පිරිසක් ආකර්ෂණය කර ගැනීම සඳහා හේතු විය. 2013 වසරේ දී සංචාරක පැමිණීම්, මූලික ඉලක්කය වූ මිලියන 1.2 අභිබවා යමින් මිලියන 1.27 ක් ලෙස පසුගිය වසරට සාපේක්ෂව සියයට 26.7 ක වර්ධනයක් වාර්තා කළේය. බටහිර යුරෝපය තවදුරටත් ප්‍රමුඛ සංචාරක ප්‍රභවය ලෙස අඛණ්ඩව පැවතිය ද, නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් වෙතින් වූ

**5.7 සංඛ්‍යා සටහන** **සංචාරක ව්‍යාපාරයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2009 | 2010 | 2011 | 2012 | 2013 (අ) | වාර්ෂික වෙනස්වීම % 2013 (අ) |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් (සංඛ්‍යාව) | 447,890 | 654,476 | 855,975 | 1,005,605 | 1,274,593 | 26.7 |
| විනෝදාස්වාදය | 358,188 | 516,538 | 663,343 | 748,436 | 980,162 | 31.0 |
| ව්‍යාපාර | 38,473 | 83,270 | 68,097 | 90,040 | 94,320 | 4.8 |
| වෙනත් | 51,229 | 54,668 | 124,535 | 167,129 | 200,111 | 19.7 |
| සංචාරක රාත්‍රී ගණන (දහස්) | 4,076 | 6,548 | 8,559 | 10,056 | 10,961 | 9.0 |
| කාමර උපයෝජන අනුපාතය (%) | 48.4 | 70.2 | 77.1 | 71.2 | 71.7 | 0.7 |
| දළ සංචාරක ලැබීම් (රු. මිලියන) | 40,133 | 65,018 | 91,926 | 132,427 | 221,720 | 67.4 |
| ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.) | 89,605 | 99,344 | 107,393 | 131,688 | 173,954 | 32.1 |
| මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) | 124,970 | 132,055 | 138,685 | 162,869 | 270,150 | 65.9 |
| සෘජු සේවා නියුක්තිය | 52,071 | 55,023 | 57,786 | 67,862 | 112,550 | 65.9 |
| ඇස්තමේන්තු කළ වක්‍ර සේවා නියුක්තිය | 72,899 | 77,032 | 80,899 | 95,007 | 157,600 | 65.9 |


(අ) තාවකාලික

මූලයන් : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව


සංචාරක පැමිණීම් 2013 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, පෙර වසරට සාපේක්ෂව බටහිර යුරෝපයෙන් වූ සංචාරක පැමිණීම් 2013 වසරේ දී සියයට 12.9 කින් වර්ධනය වුවද, 2012 වසරේ දී මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 37.1 ක් ලෙස පැවැති මෙම කලාපයෙන් වූ සංචාරක පැමිණීම් 2013 වසරේ දී සියයට 33 දක්වා අඩු විය. අනෙක් අතට, නැගෙනහිර ආසියාව, දකුණු ආසියාව, නැගෙනහිර යුරෝපය සහ මැදපෙරදිග යනාදී කලාප ඉලක්ක කොට ක්‍රියාත්මක කරන ලද ඵලදායී හා උපායමාර්ගික ප්‍රවර්ධන වැඩසටහන් හේතුවෙන් සමස්ත සංචාරක පැමිණීම් සඳහා එම වෙළෙඳපොළවල දායකත්වය ඉහළ ගියේය. දෙවන ප්‍රධානතම වෙළෙඳපොළ වූ දකුණු ආසියානු කලාපයෙන් වූ සංචාරක පැමිණීම් 2012 වසරේ දී මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 24.6 ක් වූ අතර, 2013 වසරේ දී එය සියයට 25.6 ක් විය. ලොව සියලුම කලාපවලින් පෙර වසරට සාපේක්ෂව 2013 වසරේ දී සංචාරක පැමිණීම්හි වර්ධනයක් වාර්තා වීම සැලකිය යුතු තත්ත්වයකි. මේ අතර, ශ්‍රී ලංකාවට වැඩිම සංචාරකයින් සංඛ්‍යාවක් පැමිණි රට ලෙස තවදුරටත් ඉන්දියාව පැවැති අතර, එක්සත් රාජධානිය, ජර්මනිය, මාලදිවයින හා ප්‍රංශය සෙසු ප්‍රධාන රටවල් විය. 2013 දී ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින් ප්‍රමාණයෙන් සියයට 45.2 ක් මෙම රටවල් පහෙන් පැමිණි සංචාරකයින්ගෙන් සමන්විත විය. සංචාරකයන් පැමිණීමේ අරමුණු සැලකීමේ දී, බහුතරයක් (සියයට 76.9 ක්) නිවාඩු ගතකිරීම සඳහා පැමිණ ඇති අතර, සියයට 7.4 ක් ව්‍යාපාරික කටයුතු සඳහා පැමිණ ඇත.

**2013 වසරේ දී සංචාරක ඉපැයුම් සැලකිය යුතු ලෙස අඛණ්ඩව වර්ධනය විය.** සංචාරක පැමිණීම් අඛණ්ඩව ඉහළ යාම සහ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස සංචාරක ඉපැයුම් ප්‍රමාණය 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,039 සමග සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,715 ක් ලෙස වාර්තා විය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අනුව, 2012 වසරේ දී එ.ජ.ඩොලර් 103 ක් ලෙස වාර්තා වූ සංචාරකයෙකුගේ සාමාන්‍ය දෛනික වියදම 2013 වසරේ දී එ.ජ.ඩොලර් 156.5 ක් දක්වා ඉහළ ගිය අතර, සංචාරකයෙකු මෙරට ගතකරන සාමාන්‍ය දින ගණන 2012 වසරේ දී වාර්තා වූ දින 10 සිට 2013 වසරේ දී දින 8.6 ක් දක්වා පහළ ගියේය. තවද, හෝටල් සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් වැඩිදියුණු වීම සහ ඉහළ ක්‍රයශක්තියක් සහිත සංචාරකයින්ගේ පැමිණීම් ඉහළ යාම 2013 වසරේ දී සංචාරක ඉපැයුම් ඉහළ යාමට දායක විය.

**5.9 රූප සටහන** **රටවල් අනුව සංචාරක පැමිණීම් - 2013**



**5.10 රූප සටහන** **සංචාරක පැමිණීම් සහ ඉපැයීම්**




මේ අතර, අධ්‍යාපනය, විනෝදාස්වාදය, ව්‍යාපාරික කටයුතු සහ සෞඛ්‍ය අවශ්‍යතා සඳහා විදේශ ගතවන ශ්‍රී ලාංකිකයින් සංඛ්‍යාව ඉහළ යාම හේතුවෙන් 2013 වසරේ දී විදේශ ගමන් හා සම්බන්ධ ගෙවීම් සැලකිය යුතු ලෙස වර්ධනය විය.

**ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගේ සංඛ්‍යාව මිලියන 2.5 ක් දක්වා ඉහළ නැංවීමේ අරමුණ ඇතිව, ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය සහ සෙසු බලධාරී ආයතන කටයුතු කරන ලදී.** විවිධ වූ තේමාවන් යටතේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කිරීමේ අරමුණෙන් යුතුව කල්පිටිය, කුච්චවේලි සහ යාල යන සංචාරක ප්‍රවර්ධන කලාපයන්හි ආයෝජන දිරිමත් කරන ලදී. ඉප්පන්තිවූ, වෙල්ලායි සහ උච්චමුනි දූපත් ආයෝජකයින් තිදෙනෙකුට බදු දී ඇති අතර, නියමු ව්‍යාපෘතියක් ලෙස වෙල්ලායි දූපතෙහි ජලාශ්‍රිත නවාතැන් හතරක් ඉදිකිරීමට වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත. ආසියා පැසිෆික් කලාපයේ සුඛෝපභෝගී හෝටල් ජාලයක් වන ෂැන්ග්‍රිලා (Shangri-La) මෙන්ම හයට් (Hyatt), මුවන්පික් (Movenpick), මැරියට් (Marriott) සහ ෂෙරටන් (Sheraton) වැනි වෙනත් ජාත්‍යන්තර හෝටල් කිහිපයක ඉදිකිරීම් වැඩකටයුතු සිදු කෙරෙමින් පවතින අතර, නුදුරු අනාගතයේ දී එම හෝටල්වල මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. තවද, වසර තුළ දී එ.ජ.ඩොලර් මිලියන 372 ක ආයෝජනයක් යටතේ කාමර 2,547 ක් ඉදිවන පරිදි නව හෝටල් ව්‍යාපෘති 36 ක් සඳහා අනුමැතිය ලබාදී ඇත. අම්පාර, ගම්පහ සහ පුත්තලම යන දිස්ත්‍රික්කවල මෙතෙක් අවධානයට ලක් නොවූ ආකර්ෂණීය ස්ථාන හඳුනාගෙන ඇති අතර, එම ස්ථාන සංචාරක ආගමනය ඉහළ නැංවීම, ආයෝජන දිරිමත් කිරීම සහ ඍජු හා වක්‍ර රැකියා අවස්ථා උත්පාදනය කිරීම යන අරමුණු ඇතිව ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. විවිධ ප්‍රජාවන් මුණ ගැසීම, වගා කටයුතු, මසුන් ඇල්ලීම, උත්සව, ආගමික හා සංස්කෘතික වැඩසටහන්, ක්‍රීඩා, කුරුල්ලන් සහ වන සතුන් නැරඹීම වැනි නව ක්‍රියාවලින් සක්‍රීය ලෙස ප්‍රවර්ධනය කරන ලදී. ඊට අමතරව 'පුර නැගුම' සහ කටුනායක අධිවේගී මාර්ගය වැනි යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතීන් රට තුළට පැමිණෙන සංචාරකයින් තුළ ශ්‍රී ලංකාව පිළිබඳව යහපත් හැඟීම් ගොඩනැංවීමට උපකාරී වී තිබේ.

**සංචාරකයින් ආකර්ෂණය කරගැනීම සඳහා ප්‍රවර්ධන කටයුතුවල ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් 2013 වසරේ දී ප්‍රවර්ධන කටයුතු කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** 'Get SriLankan'ed' යන තේමාව යටතේ රාජ්‍ය සහ පෞද්ගලික අංශය ඒකාබද්ධව සිදුකළ පළමු මහා පරිමාණ ප්‍රවර්ධන වැඩමුළුව ඉන්දියාවේ දී පැවැත්වූ අතර, එම වැඩමුළුව අවසානයේ දී ඉහළ පෙළේ මාධ්‍යකරුවන් සහභාගි වූ සමුළුවක් මෙන්ම සංචාරක හා වෙළෙඳ අංශයේ ව්‍යාපාරිකයින් අතර රැස්වීමක් ද පැවැත්වුණි. මෙම ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ නැගී එන වෙළෙඳපොළ ආර්ථිකයන් අතරින් ශ්‍රී ලංකාව වඩාත්ම චිත්තාකර්ෂණීය සංචාරක පුරවරය බවට පත්කිරීමයි. මීට අමතරව, රුසියාව සහ අනෙකුත් ස්වාධීන පොදුරාජ්‍ය මණ්ඩලයට අයත් රටවල මෙන්ම චීනය වැනි සංචාරකයන් ගෙන්වා ගැනීමේ ඉහළ විභවයක් පවතින වෙළෙඳපොළවල ද ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදී. චාරිකා සහ සංචාරක සේවා කර්මාන්තයේ නියෝජිතයන් සමඟ එක්ව ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විදේශයන්හි පැවැති සංචාරක පොළවල් සහ ප්‍රදර්ශන 35 කට වසර තුළදී සහභාගි විය. සංචාරක ව්‍යාපාරය ජන මාධ්‍ය හරහා ජනප්‍රිය කරවීමේ අරමුණින් යුතුව 'Visiting Journalists' වැඩසටහන යටතේ විදේශීය රටවල් 30 ක ජනමාධ්‍යකරුවන් සඳහා සංචාර 72 ක් සංවිධානය කළ අතර, එය ප්‍රවර්ධන වැඩසටහනක් ලෙස වඩාත් සාර්ථක විය. මීට අමතරව, පෞද්ගලික අංශය ද ප්‍රවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කළ අතර, ජාත්‍යන්තර සංචාරක ප්‍රදර්ශනවලට සහභාගිවීම සහ 2014 වසරේ ප්‍රංශ කුමරිය තරගයේ අවසන් වටයට තෝරාගත් 33 දෙනෙකුට මෙරටට පැමිණීම සඳහා අනුග්‍රහය දැක්වීම ආදිය මේ අතර විය. තවද, පොදු රාජ්‍ය මණ්ඩලීය නායක සමුළුවට පැමිණි අමුත්තන්ට විවිධ ස්ථාන, ආකර්ෂණයන් සහ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදාය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වන පරිදි 'Reflection of Sri Lanka' නමින් ප්‍රදර්ශනයක් ද, ඔවුන් වෙනුවෙන්ම සංවිධානය කරන ලද සංචාරයන් කිහිපයක් ද සූදානම් කරන ලදී. ජාත්‍යන්තර උත්සව පැවැත්විය හැකි ස්ථානයක් ලෙස ශ්‍රී ලංකාව වෙත සම්මන්ත්‍රණ සංවිධායකයන්ගේ අවධානය යොමු කරවීම සහ පොදු රාජ්‍ය මණ්ඩලීය රටවල් අතර සංචාරක ගමනාන්තයක් ලෙස

ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම මින් අපේක්ෂා කෙරුණි. විවිධ තරාතිරම්වල සංචාරකයින්ගේ අවශ්‍යතාවයන් සපුරාලිය හැකි පරිදි සංචාරක නිෂ්පාදිත විවිධාංගීකරණය කිරීම සංචාරක අංශයේ ඉදිරිය සුරක්ෂිත කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

### විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා

**සන්නිවේදන, පරිගණක සහ තොරතුරු සේවා මත වූ දළ ලැබීම් 2012 වසරේ දී පැවැති එ.ජ.ඩොලර් මිලියන 673 ට සාපේක්ෂව 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 719 ක් ලෙස වාර්තා විය.** විදුලි සන්දේශ සේවා උප අංශය 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 114 ක දළ ලැබීම් ප්‍රමාණයක් ලබා ගනිමින් මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කළේය. පසුගිය වසරවල දී විදුලි සන්දේශ ක්ෂේත්‍රයෙහි පැවති ඉහළ තරඟකාරිත්වය මගින් ජාත්‍යන්තර දුරකථන ඇමතුම් සඳහා වන දේශීය ගාස්තු සැලකිය යුතු මට්ටමින් පහළ ගිය ද 2012 වසරට සාපේක්ෂව 2013 වසරේ දී අන්තර්ජාල පහසුකම් භාවිතය ඇඩි ලෙස වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස මෙරටට ලැබෙන සහ මෙරටින් ලබාගන්නා ජාත්‍යන්තර ඍජු දුරකථන ඇමතුම් මිනිත්තු ප්‍රමාණය සුළු වශයෙන් අඩු විය. කලාපීය සම මට්ටමේ රටවල් සමඟ සැසඳීමේ දී ශ්‍රී ලංකාවෙහි විදුලි සන්දේශ කර්මාන්තය පුළුල් වෙමින් පවතින අතර විදුලි සන්දේශ සැපයුම්කරුවන් දෙදෙනෙකු සිව්වන පරම්පරාවේ දිගුකාලීන විකාශන (Fourth Generation Long Term Evolution) (4G LTE) සේවා දැනටමත් ආරම්භ කර ඇති අතර නුදුරු අනාගතයේ දී තවත් සැපයුම්කරුවන් වෙළෙඳපොළට පැමිණීමට නියමිතය.

**2013 වසර තුළ දී පරිගණක සහ තොරතුරු සේවාවන්හි වැඩිදියුණු වූ ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කෙරිණි.** 2013 වසරේ දී පරිගණක හා තොරතුරු සේවා උප අංශය වෙත වූ දළ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 604 ක් දක්වා සියයට 7.2 කින් වර්ධනය විය. ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) වැනි මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවා (ITES) පසුගිය වසර සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී සැලකිය යුතු ලැබීම් ප්‍රමාණයක් වාර්තා කරමින් ශ්‍රී ලංකාව තුළ ඉහළ වර්ධන ශක්‍යතාවයක් ඇති ක්ෂේත්‍රයක් ලෙස නැගී එමින් පවතී. එහි ප්‍රතිඵලයක් ලෙස 2013 වසරේ ඔක්තෝබර් මාසයේ දී එක්සත් රාජධානියේ National Outsourcing Association (NOA) මගින් ශ්‍රී ලංකාවට 'Outsourcing Destination of the Year' සම්මානය පිරිනමන ලදී. ශ්‍රී ලංකාවට තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශයන්ට අවශ්‍ය පුහුණු මානව සම්පත් බිහිකිරීමේ හැකියාව ඇති අතර, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීමේ සේවාවන්ට සම්බන්ධ සංස්ථාපිත ආයතනයන්ට පහසුකම් සැලසීම සඳහා රජය විසින් යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර නව ආයතන ආරම්භ කිරීමේ දී අවුරුදු පහක අර්ධ බදු විරාම පිරිනැමෙනු ඇත. තවද, දකුණු ආසියාවේ නැගී එන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ (ICT) කේන්ද්‍රස්ථානය ලෙස හම්බන්තොට ප්‍රදේශයේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කලාපයක් ප්‍රවර්ධනය කිරීමේ යෝජනාවක් ද ඉදිරිපත් කර ඇත.

### 5.4.2 ප්‍රාථමික ආදායම්

**බැංකු සහ පෞද්ගලික අංශය ලබාගත් නොපියවා ඉතිරිව ඇති ණය සහ රාජ්‍ය සුරැකුම්පත් සඳහා පොලී ගෙවීම් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය වැඩිවිය.**[2] 2012 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,219 ක් වූ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය, 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,817 ක් දක්වා වර්ධනය විය. ශ්‍රී ලංකා මහ බැංකුව සතු විදේශ සංචිත ආයෝජනය කිරීම මගින් ඉපැයූ ආදායම (වෙළෙඳ ලාභ ඉවත් කර), විශාල ලෙස නොවෙනස්ව පැවතුන අතර එය 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 90 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 91 ක් විය. ප්‍රාථමික ආදායම් ගිණුමේ අනෙකුත් ආයෝජන යටතේ වර්ගීකරණය කර ඇති වාණිජ බැංකු සතු වත්කම් මගින් ඉපැයූ ආදායම 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 23 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 20 ක් දක්වා සුළු වශයෙන් අඩු විය. ගෝලීය මූල්‍ය වෙළෙඳපොළෙහි පොලී අනුපාතික පහළ මට්ටමක පැවතීම හේතුවෙන් මහ බැංකුව සහ වාණිජ බැංකු සතු වත්කම් මගින් ඉපැයූ පොලී ආදායම 2012 සහ 2013 වසර තුළ දී සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි.

**නොපියවා ඉතිරිව ඇති ණය සඳහා පොලී ගෙවීම් වැඩි වීම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම් සැලකිය යුතු ලෙස වැඩි විය.** ප්‍රාථමික ආදායම් ගිණුමේ 'අනෙකුත් ආයෝජන' යටතේ ඇතුළත් වන රජය, බැංකු අංශය, පෞද්ගලික අංශය සහ රාජ්‍ය සංස්ථා ලබාගත් දිගුකාලීන ණය සඳහා පොලී ගෙවීම් මෙන්ම මහ බැංකුව විසින් ලබාගත් දිගුකාලීන ණය සඳහා වූ පොලී ගෙවීම් (ජා.මූ.අරමුදලේ සම්පස්ථ ණය පහසුකමට අදාළ පොලී ගෙවීම්) 2012 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 473 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 550 ක් දක්වා සියයට 16.2 කින් ඉහළ ගියේය.

---


[2] BPM6 ආකෘතිය අනුගමනය කිරීමත් සමඟ පෙර ආකෘතියේ දැක් වූ 'ආදායම් ගිණුම' වෙනුවට 'ප්‍රාථමික ආදායම් ගිණුම' යොදාගනු ලැබේ. පෙර ආකෘතියේ අන්තර්ගත වූ සියලුම තක්සේරු වෙනස්කම් (උදා: මහ බැංකුවේ විදේශීය සංචිත මගින් උපයන වෙළෙඳ ලාභ) ප්‍රාථමික ආදායම් ගිණුමෙහි අන්තර්ගත නොවේ.

## විශේෂ සටහන 6
## විදේශීය ගිණුම් සම්පාදනය කිරීමේ දී නවතම ගෙවුම් තුලනය අත්පොත අනුගමනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ යොමුවීම

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ. අරමුදල) විසින් ප්‍රකාශිත ගෙවුම් තුලනය අත්පොත්වල විදේශීය අංශයේ සංඛ්‍යාලේඛන පිළියෙළ කිරීමේ දී අදාළ වන අන්තර්ජාතික පිළිගැනීම් සහ සම්මතයන් පිළිබඳව සඳහන් වේ. 1948 සිට, ජා.මූ. අරමුදල ගෙවුම් තුලනය අත්පොත් සංස්කරණයන් හයක් නිකුත් කර ඇති අතර මෙම සෑම නව සංස්කරණයක්ම හඳුන්වා දී ඇත්තේ ගෝලීය ආර්ථික සහ මූල්‍ය වර්ධනයන්, දත්ත සහ සංඛ්‍යාලේඛන විශ්ලේෂණ රාමු තුළ වූ වෙනස්කම් සහ සම්පාදකයින් වසර ගණනක් මුළුල්ලේ අත්පත් කරගෙන ඇති අත්දැකීම් සමඟ අනුකූල වන පරිද්දෙනි.

ගෙවුම් තුලන ලේඛනය, අන්තර්ජාතික ආයෝජන තත්ත්වය සහ මූල්‍ය වත්කම් හා වගකීම්වල අනෙකුත් වෙනස්වීම් ගිණුම විදේශීය අංශයේ ගිණුම් ලේඛනවල මූලිකාංග වේ. වි.ස.6.1 රූප සටහන මගින් මෙම ගිණුම් කාණ්ඩ තුන අන්තර් සම්බන්ධ වන ආකාරය පෙන්නුම් කරයි.

ගෙවුම් තුලනය අත්පොත්වල නවතම සංස්කරණය වන 'ගෙවුම් තුලනය සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳ හයවන සංස්කරණය (BPM6)' ප්‍රධාන ක්ෂේත්‍ර ගණනාවක් කෙරෙහි අවධානය යොමු කර ඇත. ඒ අනුව, BPM6 සංස්කරණය මගින් විදේශීය අංශයේ සංඛ්‍යාලේඛන සමඟ අනෙකුත් සාර්ව ආර්ථික සංඛ්‍යා ලේඛනවල ඇති සංකලනයන් ශක්තිමත් කිරීමට අපේක්ෂා කෙරෙන අතර එමගින් විශේෂිත අත්පොත් සහ වර්ගීකරණ පද්ධතීන් (උදා. 2008 ජාතික ගිණුම්කරණ පද්ධතිය) සලකා බැලේ. එසේම BPM6 සංස්කරණය මගින් අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (International Investment Position - IIP) සහ ශේෂපත්‍ර ප්‍රවේශයන් හා සම්බන්ධ වැඩිදියුණුවීම් ඉස්මතු කර දක්වයි. තවද, BPM6 සංස්කරණය මගින් ගෝලීය මූල්‍ය සහ තාක්ෂණික නව්‍යතාවන් සඳහා ඉඩ සලසා දෙන අතර, තෝරාගත් ක්ෂේත්‍ර (උදා. නේවාසිකත්වය, ආර්ථික හිමිකම සහ සෘජු ආයෝජනවල විෂයපථය) පිළිබඳව පැහැදිලි කරමින් විශේෂ තේමාවන් යටතේ කරුණු දක්වයි. BPM6 සංස්කරණය අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (විශේෂ සටහන් අංක 7 බලන්න) අදාළ අංශ සම්බන්ධව වැඩි ප්‍රමුඛත්වයක් ලබා දෙයි. එසේ වුවත්, ගෙවුම් තුලන අත්පොතේ පස්වන සංස්කරණයේ (BPM5) පැවති මූලික රාමුව BPM6 සංස්කරණයේ දී විශාල වශයෙන් වෙනස් වීමට බඳුන් වී නොමැති අතර ජංගම, ප්‍රාග්ධන සහ මූල්‍ය ගිණුම් වශයෙන් ඉදිරිපත් කිරීම තවදුරටත් නොවෙනස්ව පවතී.




රූප සටහන වි.ස. 6.1 අන්තර්ජාතික ගිණුම්

BPM6 සංස්කරණය හඳුන්වා දෙන ලද්දේ 2009 වසරේ දී වුවද, බොහෝ රටවල් තවමත් සිටිනුයේ එය අනුගමනය කිරීමට යොමුවීමේ අවධියේය. BPM6 සංස්කරණයට අනුකූලව ගෙවුම් තුලන සහ අන්තර්ජාතික ආයෝජන තත්ත්වයට අදාල දත්තයන් ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ශ්‍රී ලංකාව BPM6 අනුගමනය කරන ප්‍රථම කලාපීය රටවල් කිහිපය අතරට එක්වේ. BPM6 නිර්දේශ ක්‍රියාවට නැංවීමේ දී ශ්‍රී ලංකාව ක්‍රමයෙන් ඉදිරියට ගෙන යනු ලබන ප්‍රවේශයක් අනුගමනය කරන අතර ශ්‍රී ලංකාවට ගැලපෙන පරිද්දෙන් සහ සමහර අයිතමයන්ට අදාළව තිබෙන දත්ත පරිමාව අනුව හැකිතාක් දුරට BPM6 සංස්කරණයට අනුකූලවීමට උත්සාහ දරයි. BPM6 ක්‍රියාවට නැංවීමත් සමඟම, ගෙවුම් තුලනයේ විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම පෙර ආකෘතියට සාපේක්ෂව පහත සඳහන් ප්‍රධාන වෙනස්කම් පෙන්නුම් කරයි.

### භාණ්ඩ හා සේවා ගිණුම

නිෂ්පාදන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වන භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන් නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන ගනුදෙනු, භාණ්ඩ හා සේවා ගිණුම මගින් පෙන්නුම් කරයි. භාණ්ඩ ගිණුමෙහි සාමාන්‍ය වෙළෙඳ භාණ්ඩ සහ මූල්‍ය නොවන රත්‍රන් ද, සේවා ගිණුමෙහි ප්‍රවාහන, විදේශ ගමන්, ඉදිකිරීම්, රක්ෂණ සහ විශ්‍රාම සේවා, මූල්‍ය සේවා, විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා, අනෙකුත් ව්‍යාපාර සේවා සහ රජයේ භාණ්ඩ හා සේවා (අන් කිසි තැනෙක ඇතුළත් නොවූ) ඇතුළත් වේ.

**භාණ්ඩ** : සංක්‍රමිකයන්ගේ පෞද්ගලික බඩු බාහිරාදිය සාමාන්‍ය වෙළෙඳ භාණ්ඩ යටතේ ඇතුළත් නොකරන අතර ආර්ථික හිමිකමේ වෙනස්වීමක් සිදුනොවන බැවින් ඒවා අන්තර්ජාතික ගිණුම්වල ඇතුළත් නොවේ.

**සේවා** : පැරණි ආකෘතිය යටතේ සේවා ගිණුමේ අන්තර්ගතව පැවැති උප අංශයන්ට අමතරව **නව ආකෘතිය යටතේ මූල්‍ය සේවා වෙනම උප අංශයක් ලෙස දක්වා ඇත.** උදා. : බැංකු ගාස්තු සහ කොමිස්.

**ප්‍රාථමික ආදායම් ගිණුම** : නේවාසිකයන්ට නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ දායකත්වය වෙනුවෙන් හෝ මූල්‍ය වත්කම් හා ස්වභාවික වත්කම් අනේවාසිකයන්ට සැපයීම වෙනුවෙන් වන ලැබීම් ප්‍රාථමික ආදායම් වේ. ඒ අනුව, ප්‍රාථමික ආදායම් ගිණුමේ කෙටිකාලීන සේවක වැටුප් සහ ආයෝජන ආදායම් ඇතුළත් වේ. **පැරණි ආකෘතිය යටතේ ආදායම් ගිණුම, BPM6 සංස්කරණය අනුව නව ආකෘතිය යටතේ ප්‍රාථමික ආදායම් ගිණුම ලෙස හඳුන්වනු ලබයි.**

**ද්විතීයික ආදායම් ගිණුම**

නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදුවන ජංගම සංක්‍රාම ද්විතීයික ආදායම් ගිණුමෙහි සඳහන් වේ. ජංගම සංක්‍රාම, මුදල් හෝ භාණ්ඩ යන දෙආකාරයෙන් ම සිදුවිය හැක. **පැරණි ආකෘතියේ පැවැති 'ජංගම සංක්‍රාම' BPM6 සංස්කරණයෙහි ද්විතීයික ආදායම් ගිණුම යටතේ සටහන් වේ.**

**ප්‍රාග්ධන ගිණුම**

ප්‍රාග්ධන ගිණුමෙහි (අ) නේවාසිකයන් සහ අනේවාසිකයන් අතර ප්‍රාග්ධන සංක්‍රාම ලැබීම් සහ ගෙවීම් ද (ආ) නේවාසිකයන් සහ අනේවාසිකයන් අතර නිෂ්පාදනය නොකළ, මූල්‍ය නොවන වත්කම් අත්පත් කර ගැනීම් සහ බැහැර කිරීම් ද සඳහන් වේ.

- **තම නේවාසිකත්වය වෙනස් කරන පුද්ගලයන්ගේ පෞද්ගලික බඩුබාහිරාදිය සහ මූල්‍ය වත්කම් හා වගකීම් තවදුරටත් ප්‍රාග්ධන සංක්‍රාම යටතේ ආවරණය නොවේ.**
- **ප්‍රාග්ධන ගිණුම තවදුරටත් මූල්‍ය ගිණුම සමඟ කාණ්ඩගත නොකෙරේ.** ඒ වෙනුවට, එය ජංගම ගිණුම සමඟ කාණ්ඩගත කෙරෙන අතර ජංගම සහ ප්‍රාග්ධන ගිණුම්වල ශේෂය මගින් ආර්ථිකයේ ශුද්ධ ණය දීම හෝ ණය ගැනීම නිරූපණය කෙරේ.

**මූල්‍ය ගිණුම**

නේවාසිකයන් සහ අනේවාසිකයන් අතර මූල්‍ය වත්කම් සහ වගකීම් සම්බන්ධයෙන් සිදුවන ගනුදෙනු මූල්‍ය ගිණුම මගින් වාර්තා කරයි.

- ජංගම සහ ප්‍රාග්ධන ගිණුම්වල ශේෂය සංකල්පිත වශයෙන් මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන වන අතර නේවාසිකයන් සහ අනේවාසිකයන් අතර වන ශුද්ධ ණය දීම හෝ ශුද්ධ ණය ලැබීම මූල්‍යයනය වන්නේ කෙසේ දැයි මූල්‍ය ගිණුම මගින් දැක්වේ.
- මූල්‍ය ගිණුමේ පෙර ආකෘතියේ පැවැති **'හර'** සහ **'බැර'** ශීර්ෂයන් වෙනුවට නව ආකෘතිය මගින් **'මූල්‍ය වත්කම්වල ශුද්ධ අත්කර ගැනීම්'** සහ **'මූල්‍ය වගකීම්වල ශුද්ධ වෙනස්වීම්'** යන ශීර්ෂයන් පිළිවෙළින් භාවිතා කරයි.
- මූල්‍ය ගිණුමේ ගනුදෙනු ශුද්ධ අගයයන් වලින් වාර්තා කරන අතර, ඒවා මූල්‍ය වත්කම් හා වගකීම්වලට අදාළව වෙන් වෙන් වශයෙන් වාර්තා කරයි. (එනම් මූල්‍ය වත්කම්වල ශුද්ධ ගනුදෙනු පෙන්නුම් කරනු ලබන්නේ මූල්‍ය වත්කම් අත්කර ගැනීම්වලින් මූල්‍ය වත්කම් අඩුවීම් ගැලපීමෙන් පසු වන අතර, වත්කම්වලට එරෙහිව වගකීම් ගැලපීමෙන් නොවේ).
- මූල්‍ය ගිණුමේ පෙර ආකෘතිය සහ නව ආකෘතිය අතර මූලික වෙනස වනුයේ පෙර ආකෘතිය **'ආයතනික අංශයන්'** මත පදනම්ව 'දිගුකාලීන' සහ 'කෙටිකාලීන' වශයෙන් කල්පිරීම අනුව බෙදා වෙන් කර තිබීමත්, ඊට සාපේක්ෂව නව ආකෘතියේ දී මූල්‍ය ගිණුම **'මූල්‍ය උපකරණ'** මත පදනම්ව එනම් **සෘජු ආයෝජන, විවිධ ආයෝජන, මූල්‍ය ව්‍යුත්පන්න, අනෙකුත් ආයෝජන සහ සංචිත වත්කම්** ලෙස අංශ වෙන්කර තිබීමත්ය. එකී මූල්‍ය උපකරණයන්ට අදාළ උප වර්ගීකරණයක් ලෙස **'ආයතනික අංශයන්'** දක්වා තිබෙන අතර ඒවා තවදුරටත් කල්පිරීම අනුව 'දිගුකාලීන' සහ 'කෙටිකාලීන' වශයෙන් බෙදා වෙන්කර ඇත. ඒ අනුව, පැරණි ආකෘතිය යටතේ බොහෝ දත්ත අයිතමයන් වර්තමාන ආකෘතිය අනුව නැවත බෙදා වෙන් කර විවිධ උප වර්ගීකරණයන් යටතේ ඉදිරිපත් කර ඇත. වි.ස.6.2 රූප සටහන මගින් නිරූපණය වන ප්‍රධාන වෙනස්කම් කිහිපයක් පහත දැක්වේ.

අ. මූල්‍ය ගිණුමේ රජයට ලැබුණු දිගුකාලීන මූල්‍ය ප්‍රවාහය තුළ **'රජයඃ දිගුකාලීන'** අංශය යටතේ පෙර ආකෘතියට අනුව වාර්තා කළ ගනුදෙනුවල රජයට ලැබුණු දිගුකාලීන ව්‍යාපෘති ණය මෙන්ම දිගුකාලීන ණය සුරැකුම්පත්වලට අදාළ මුදල් ප්‍රවාහ ද ඇතුළත් විය. නව ආකෘතිය අනුව සියලුම ණය **සුරැකුම්පත්** ගනුදෙනුවලට අදාළ විදේශ මුදල් ප්‍රවාහ 'විවිධ ආයෝජන' අංශය යටතේ රජයේ

දිගුකාලීන 'ණය සුරැකුම්පත්' ලෙස දැක්වෙන අතර **රජයට ලැබෙන ව්‍යාපෘති ණය** 'අනෙකුත් ආයෝජන' යටතේ රජයේ දිගුකාලීන 'ණය' ලෙස අංශ දෙකක් තුළ වෙන වෙනම සටහන් වේ.

ආ. පෙර ආකෘතියේ '**කෙටිකාලීන විවිධ ආයෝජන**' යටතේ වර්ගීකරණය කර තිබූ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත කළ සමාගම්වලට සම්බන්ධ විදේශීය ආයෝජන, නව ආකෘතිය අනුව, 'සෘජු ආයෝජන' හෝ විවිධ ආයෝජන යටතේ 'හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්' ලෙස ප්‍රතිවර්ගීකරණය කර ඇත. මෙම වර්ගීකරණය සඳහා පාදක වනුයේ දේශීය සමාගමේ ඡන්ද බලය සහිත කොටස් හිමිකම්වලින් සියයට දහයක් හෝ ඊට වැඩි අයිතියක් විදේශීය ආයෝජකයා සතු වන්නේද යන පදනමයි. එකී අයිතිය සියයට දහයකට වඩා වැඩි නම් එබඳු ආයෝජන 'සෘජු ආයෝජන' යටතේ වාර්තාගත වන අතර, කොටස් සඳහා ඇති සෙසු විදේශීය ආයෝජනයන් 'විවිධ ආයෝජන' යටතේ 'හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්' යන අංශය යටතේ වාර්තා වේ.


ඇ. පෙර ආකෘතියේ '**පෞද්ගලික-කෙටිකාලීන**' ලෙසින් වර්ග කෙරුණු ගනුදෙනුවල පෞද්ගලික අංශය විසින් ලබාගත් වෙළෙඳ ණය සහ අත්තිකාරම් ඇතුළත් විය. නව ආකෘතියෙහි මෙම ගනුදෙනු 'වෙනත් ආයෝජන' යටතේ 'වෙළෙඳ ණය සහ අත්තිකාරම්' යන අංශය යටතේ වාර්තා කෙරේ.

ඈ. **වාණිජ බැංකුවල වත්කම් සහ වගකීම්** පෙර ආකෘතියේ දී 'මූල්‍ය උපකරණ' පදනමින් වර්ගීකරණය කර නොතිබුණි. නව ආකෘතිය අනුව, 'වාණිජ බැංකුවල' පමණක් නොව 'බලපත්‍රලාභී විශේෂිත බැංකුවල' සහ 'බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වල' සියලු විදේශීය මූල්‍ය වත්කම් සහ වගකීම් 'තැන්පතු භාරගන්නා ආයතන' ලෙස අදාළ මූල්‍ය උපකරණ යටතේ ඇතුළත් කෙරේ. ඒ අනුව, 'තැන්පතු භාරගන්නා ආයතනවල' විදේශීය මූල්‍ය වත්කම් සහ වගකීම් මූල්‍ය උපකරණ වර්ගීකරණය අනුව 'ණය සුරැකුම්පත්', 'මුදල් සහ තැන්පතු', 'ණය' සහ 'ලැබිය යුතු හෝ ගෙවිය යුතු අනෙකුත් ගිණුම්' යටතේ වාර්තා කරනු ලබයි.

ඉ. '**මූල්‍ය වෙනස්වීම්**' පැරණි ආකෘතියේ වෙනම වර්ග කර තිබූ අතර එහි ඇතුළත් වූයේ මහ බැංකුව මගින් පාලනය කෙරෙන විදේශීය 'සංචිත වත්කම්' සහ 'සංචිත ආශ්‍රිත වගකීම්' ය. නව ආකෘතියත් සමඟ '**මූල්‍ය වෙනස්වීම්**' මූල්‍ය ගිණුමට ඇතුළත් කර ඇති අතර ඒ අනුව මහ බැංකුව මගින් පාලනය වන විදේශීය මූල්‍ය වත්කම් 'සංචිත වත්කම්' ලෙස වෙනම දක්වන අතර, මහ බැංකුවේ විදේශීය මූල්‍ය වගකීම් අදාළ මූල්‍ය උපකරණ යටතේ, එනම්, ජාත්‍යන්තර සංවිධාන සමඟ තැන්පතු වගකීම් 'මුදල් හා තැන්පතු' යටතේ ද, ජා.මූ. අරමුදලේ ණය 'ණය' යටතේ ද, වෙනත් ආකාරයේ ගෙවීම් හෝ ලැබීම් 'ගෙවිය යුතු/ලැබිය යුතු අනෙකුත් ගිණුම්' යටතේ ද (උදා.: ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම් 'ගෙවිය යුතු අනෙකුත් ගිණුම්', යටතේ) වර්ග කෙරේ.

BPM6 සංස්කරණය මගින් මූල්‍ය ගිණුමේ එක් එක් සංරචකයට ඇති කළ වෙනස්කම් 'ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය' යන තේමාව යටතේ අංක 7 දරන විශේෂ සටහනෙහි දීර්ඝ වශයෙන් විස්තර කෙරේ.

**රූප සටහන වි.ස. 6.2** **ගෙවුම් තුලනයේ විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීමේ ප්‍රධාන වෙනස්වීම්**



තවද, විවිධ ආයෝජනයන්හි පොලී ගෙවීම් යටතේ ඇතුළත් වන රාජ්‍ය සුරැකුම්පත් සඳහා කූපන ගෙවීම් ලෙස වූ පොලී ගෙවීම් 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 408 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 576 ක් දක්වා ඉහළ ගිය අතර, රජයේ භාණ්ඩාගාර බැඳුම්කර සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා වූ ඉහළ පොලී ගෙවීම් මේ සඳහා මූලික වශයෙන් හේතු විය. මේ අතර, සෘජු ආයෝජන වෙත සිදුකරන ගෙවීම් නියෝජනය කෙරෙන ශ්‍රී ලාංකික සමාගම් විසින් සෘජු ආයෝජකයින්ට ගෙවූ ලාභාංශ සහ ප්‍රතිආයෝජනය කළ ඉපැයුම්[3] 2013 වසරේ දී පිළිවෙළින් එ.ජ.ඩොලර් මිලියන 422 ක් සහ එ.ජ.ඩොලර් මිලියන 352 ක් විය. 2012 වසර හා සැසඳීමේ දී ලාභාංශ ගෙවීම් සහ ප්‍රතිආයෝජනය කළ ඉපැයුම් ඉහළ යාම, සෘජු ආයෝජන ව්‍යාපාර ඉපැයූ ලාභ වැඩිවීම පිළිබිඹු කරයි. ප්‍රතිආයෝජනය කළ ඉපැයුම් කොටස වැඩිවීම තුළින් ආර්ථිකය පිළිබඳ පවත්නා ධනාත්මක දැක්ම ද නිරූපණය කෙරෙයි.

### 5.4.3 ද්විතීයික ආදායම්

**විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සහ රාජ්‍ය සංක්‍රාමවලින් සමන්විත ද්විතීයික ආදායම් ගිණුමේ[4] ලැබීම් 2012 වසරේ පැවැති එ.ජ.ඩොලර් මිලියන 6,038 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 6,428 ක් දක්වා සියයට 6.5 කින් වර්ධනය විය.** ද්විතීයික ආදායම් ගිණුමේ මුළු ලැබීම්වලින් සියයට 99 කට වඩා වැඩියෙන් පවතින විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2013 වසරේ මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. ඒ අනුව, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2012 වසරේ වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 5,985 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 6,407 ක් දක්වා සියයට 7.0 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වෙමින් රටෙහි ස්ථාවර විදේශ විනිමය ඉපැයුම් මූලයක් බවට පත්ව ඇත. වෘත්තීය සහ පුහුණු අංශයන්ට අයත් ශ්‍රම සංක්‍රමණ වැඩිවීම, විධිමත් මාර්ග ඔස්සේ මුදල් ප්‍රේෂණය කිරීමේ පහසුකම් සහ දැනුවත්භාවය වැඩිවීම මෙන්ම අන්තර්ජාලය පදනම් කරගත් නව මුදල් හුවමාරු පද්ධති හඳුන්වාදීම විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ වර්ධනය වීමට බලපෑ ප්‍රධාන සාධක විය. 2013 වසරේ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය සංඛ්‍යාව, 2012 වසරේ වාර්තා කළ 282,447 සමඟ සැසඳීමේදී 293,105 ක් දක්වා සියයට 3.8 කින් ඉහළ ගිය අතර පුහුණු සහ වෘත්තීයමය අංශයන්ට අයත් ශ්‍රමිකයින් විදේශ රැකියා සඳහා පිටත්ව යාම 2013 වසරේ දී සියයට 24.6 කින් වර්ධනය විය.

[3] ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීමක් ලෙස සලකනු ලබන අතර, මූල්‍ය ගිණුමේ සෘජු ආයෝජන ලැබීමක් ලෙස සලකනු ලබයි.

[4] ද්විතීයික ආදායම්, පෙර ආකෘතියෙහි 'ජංගම සංක්‍රාම ගිණුම' වෙනුවට BPM6 ආකෘතිය මගින් හඳුන්වා දුන් නව නාමකරණයකි.

## 5.5 ජංගම ගිණුමේ ශේෂය

**ප්‍රධාන වශයෙන් වෙළෙඳ හිඟය අඩුවීම, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් සහ සංචාරක ඉපැයුම් සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් ජංගම ගිණුමෙහි හිඟය 2012 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 3,982 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 2,607 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය.** 2013 වසරේ පළමු භාගයේ දී 2012 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වෙළෙඳ ගිණුමේ හිඟය පුළුල් වුවද ප්‍රධාන අපනයන ගමනාන්තයන් ක්‍රමිකව යථාතත්ත්වයට පත්වීම හේතුවෙන් ගෝලීය ඉල්ලුම ඉහළයාම සහ විශේෂයෙන්ම ඛනිජ තෙල් ආනයන අඩුවීම හේතුකොට ගෙන ආනයන වියදම ශීඝ්‍ර ලෙස පහළයාම 2013 වසරේ දෙවන භාගයේ දී වෙළෙඳ ශේෂයෙහි සැලකිය යුතු වර්ධනයක් වාර්තා වීමට හේතුවිය. විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ ලැබීම් සහ සංචාරක ඉපැයුම් වෙළෙඳ ගිණුමෙහි හිඟයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ආවරණය කළ අතර එමගින් 2013 වසරේ ජංගම ගිණුමේ හිඟය අඩු විය. ඒ අනුව, ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ සියයට 6.7 ක් වූ ජංගම ගිණුමේ හිඟය 2013 වසරේ දී සියයට 3.9 ක් දක්වා අඩු වූ අතර, එමගින් ඉතුරුම්-ආයෝජන පරතරය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 42 කින් අඩු විය.

## 5.6 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

**ප්‍රාග්ධන සංක්‍රාම ලැබීම් අඩු වීම හේතුවෙන් ප්‍රාග්ධන ගිණුමේ ශේෂය අඩු විය.** ප්‍රාග්ධන ගිණුමෙහි ශුද්ධ ලැබීම්, 2012 වසරේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 130 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 71 ක් විය. ප්‍රාග්ධන ගිණුමේ ලැබීම්වලින් වැඩි ප්‍රමාණයක් රජයට ලැබුණු ප්‍රාග්ධන ප්‍රදාන විය. ශ්‍රී ලංකාව පහළ-මැදි ආදායම් ලබන රටක් ලෙස ඉදිරියට යාමත් සමඟ ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම් අඩු විය. ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස අඩු වීමත් සමඟ, ප්‍රාග්ධන හා ජංගම ගිණුමේ හිඟය, 2012 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 3,851 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 2,536 ක අඩු අගයක් වාර්තා කළේය.

## 5.7 මූල්‍ය ගිණුම

**2013 වසරේ දී මූල්‍ය ගිණුම වෙත සැලකිය යුතු විදේශ විනිමය ප්‍රවාහයක් වාර්තා විය.** BPM6 ක්‍රමවේදය අනුගමනය කිරීමත් සමඟ සෘජු ආයෝජන, විවිධ ආයෝජන, මූල්‍ය ව්‍යුත්පන්න සහ අනෙකුත් ආයෝජනවලට අමතරව මූල්‍ය ගිණුම තුළ විදේශ


සංචිත වත්කම් ගනුදෙනු ද ඇතුළත් වේ. රජයට ලැබුණු විදේශ විනිමය ලැබීම්, බැංකු සහ පෞද්ගලික අංශයන් ලබාගත් විදේශ ණය, ණය සුරැකුම්පත් නිකුතුවෙන් ලද ලැබීම් සහ සෘජු ආයෝජන සැලකිය යුතු ලෙස වැඩි වීම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ ලැබීම් ස්ථාවර වූ අතර එමගින් ශුද්ධ වගකීම් වෙනස්වීම්, 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 4,081 ක් වූ අතර එය 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 5,440 ට වඩා අඩු මට්ටමකි. මේ අතර, ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,177 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 955 ක් දක්වා සියයට 18.8 කින් අඩු වූ අතර සංචිත වත්කම් ගනුදෙනුවල සිදු වූ සැලකිය යුතු වර්ධනය හමුවේ වුවද බැංකු අංශය සතු මුදල් සහ තැන්පතු පහළ යාම මේ සඳහා මූලිකවම හේතු විය.

### 5.7.1 සෘජු ආයෝජන

**ගෝලීය ආර්ථිකය ක්‍රමිකව යථා තත්ත්වයට පත්වීම සහ රටෙහි සාර්ව ආර්ථික පරිසරය ස්ථාවර වීමෙන් ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිවීම සමග විදේශීය සෘජු ආයෝජන 2013 වසරේ දී ශක්තිමත්ව පැවතුණි.** සමස්ත සෘජු ආයෝජන[5] ප්‍රමාණය, 2012 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 941 සමග සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 916 ක් ලෙස වාර්තා විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ සෘජු ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 887 කින් ද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ සමාගම් වෙත වූ විදේශීය සෘජු ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 22 කින් ද කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත, එහෙත් ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි නොවූ සමාගම් වෙත වූ විදේශීය සෘජු ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 7 කින් ද මෙම සමස්ත සෘජු ආයෝජන සමන්විත විය. 2013 වසරේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ සෘජු ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 887 ට අමතරව එම සමාගම් වෙත එ.ජ.ඩොලර් මිලියන 505 ක විදේශීය ණය ප්‍රමාණයක් ද ලැබුණි. ඒ අනුව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ විදේශීය ණය ඇතුළත් විදේශීය සෘජු ආයෝජන, 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,279 සමග සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,391 ක් දක්වා වැඩි විය. මෙම සමස්ත ලැබීම් තුළ එ.ජ.ඩොලර් මිලියන 16 ක් වූ හිමිකම් ප්‍රාග්ධනය, එ.ජ.ඩොලර් මිලියන 370 ක් වූ කොටස් හිමියන්ගේ ණය සහ අත්තිකාරම්, එ.ජ.ඩොලර් මිලියන 150 ක් වූ අන්තර් සමාගම් ණය, එ.ජ.ඩොලර් මිලියන 350 ක් වූ ප්‍රතිආයෝජනය කළ ඉපැයුම් සහ එ.ජ.ඩොලර් මිලියන 505 ක් වූ විදේශීය ණය ඇතුළත් විය. ඒ අනුව, විදේශීය ණය ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,382 සමග සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,421 ක් විය. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ඇතුළත් වූ විදේශීය සෘජු ආයෝජන ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 2013 වසරේ දී සියයට 2.1 ක් විය.

**යටිතල පහසුකම් සහ නිෂ්පාදන අංශ 2013 වසරේ වැඩිම විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කරගත් අංශ වේ.** විදේශීය සෘජු ආයෝජන ලැබීම්වලින් සියයට 56.5 ක් යටිතල පහසුකම් අංශයට ලැබුණු අතර ඉන් වැඩි ප්‍රමාණයක් දුරකථන හා විදුලි සංදේශ ජාල, නිවාස හා දේපොළ සංවර්ධනය සහ වරාය හා බහලුම් පර්යන්ත යන අංශවලට ලැබුණි. මුළු විදේශීය සෘජු ආයෝජනයන්ගෙන් සියයට 25.9 ක් නිෂ්පාදන අංශය ආකර්ෂණය කරගත් අතර ඉන් වැඩි ප්‍රමාණයක් රෙදිපිළි, නිමි ඇඳුම් සහ සම් භාණ්ඩ, රබර් නිපැයුම් සහ රසායන ද්‍රව්‍ය, ගල් අඟුරු සහ ඛනිජ තෙල් යන කර්මාන්ත වෙත ලැබුණි. මේ අතර, සංචාරක ව්‍යාපාරය අඛණ්ඩව පුළුල් වීම සහ අධ්‍යාපනය, සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ සේවා යන අංශවලට විදේශීය ආයෝජන ලබාගැනීම කෙරෙහි වැඩි අවධානයක් යොමුවීමත් සමග 2013 වසරේ විදේශීය සෘජු ආයෝජනයෙන් සියයට 17.0 ක් සේවා අංශය වෙත යොමු විය. ශ්‍රී ලාංකික සමාගම් විසින් විදේශයන්හි සිදුකළ සෘජු ආයෝජන 2012 වසරේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 64 ට සාපේක්ෂව 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 65 ක් විය. අනාගතයේ දී නව විදේශීය සෘජු ආයෝජන

**5.11 රූප සටහන** **මූල්‍ය ගිණුමේ ලැබීම්**




[5] BPM6 ගණනය කිරීමේ ක්‍රමවේදයට අනුව විදේශීය ආයෝජකයෙකුට ශ්‍රී ලාංකීය ව්‍යාපාරයක සියයට 10 කට වඩා ඡන්දය ප්‍රකාශ කිරීමේ කොටස් ප්‍රමාණයක් හිමි නම් එවැනි විදේශීය ආයෝජන, සෘජු ආයෝජන ලෙස වර්ගීකරණය කෙරේ. තවද, සෘජු ආයෝජන ව්‍යාපාර මගින් ඊට සම්බන්ධ නොමැති මූලාශ්‍රවලින් ලබාගන්නා විදේශීය ණය, විදේශීය සෘජු ආයෝජනවලින් ඉවත් කරන අතර විදේශීය ණය යටතේ වාර්තා කෙරේ.

ලැබීමට ඇති සැලකිය යුතු අවස්ථාවන් පිළිබිඹු කරමින් 2012 වසර සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී ගිවිසගත් ව්‍යාපෘති සඳහා එකඟ වී ඇති ආයෝජන සියයට 15.3 කින් ඉහළ ගියේය. තවද, 2013 වසරේ ආරම්භ වීමට නියමිතව තිබූ ව්‍යාපෘති සමඟ සැසඳීමේ දී 2014 වසරේ ආරම්භ වීමට නියමිතව ඇති ව්‍යාපෘති සංඛ්‍යාව වැඩි විය.

**5.8.අ සංඛ්‍යා සටහන**

**මූල්‍ය ගිණුම**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන

| ශීර්ෂය | 2012 (අ) | | 2013 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| **මූල්‍ය ගිණුම** | **1,177** | **5,440** | **955** | **4,081** |
| **සෘජු ආයෝජන** | **64** | **941** | **65** | **916** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | 64 | 360 | 65 | 373 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම් | 64 | 111 | 65 | 23 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 64 | 111 | 65 | 23 |
| ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් | - | 12 | - | 16 |
| කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලියාපදිංචි සමාගම් (ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි නොවූ) | - | 33 | - | 7 |
| අනෙකුත් සමාගම් | - | 67 | - | - |
| ප්‍රතිආයෝජිත ඉපැයුම් | - | 249 | - | 350 |
| ණය උපකරණ | - | 581 | - | 542 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | - | 581 | - | 542 |
| ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් | - | 581 | - | 518 |
| කොටස් හිමියන්ගේ අත්තිකාරම් | - | 364 | - | 370 |
| අන්තර් සමාගම් ණය | - | 217 | - | 150 |
| කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලියාපදිංචි සමාගම් (ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි නොවූ) | - | - | - | 22 |
| **විවිධ ආයෝජන** | **-10** | **2,116** | **...** | **2,106** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | - | 272 | - | 263 |
| කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලියාපදිංචි සමාගම් (ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි නොවූ) | - | 272 | - | 263 |
| ණය සුරැකුම්පත් | -10 | 1,844 | ... | 1,843 |
| තැන්පතු භාරගන්නා ආයතන | -10 | 500 | ... | 1,350 |
| දිගු කාලීන | -10 | 500 | ... | 1,350 |
| රජය | - | 1,343 | - | 493 |
| කෙටිකාලීන (භාණ්ඩාගාර බිල්පත්) | - | 38 | - | -80 |
| දිගු කාලීන | - | 1,306 | - | 572 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 806 | - | 572 |
| ස්වෛරීත්ව බැඳුම්කර | - | 500 | - | - |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | **-** | **-** | **-** | **-** |
| **අනෙකුත් ආයෝජන** | **363** | **2,384** | **-222** | **1,060** |
| මුදල් සහ තැන්පතු | 162 | 447 | -459 | 108 |
| මහ බැංකුව | - | -24 | - | -199 |
| කෙටිකාලීන | - | - | - | -200 |
| දිගු කාලීන | - | -24 | - | 1 |
| තැන්පතු භාරගන්නා ආයතන | 162 | 471 | -459 | 307 |
| කෙටි කාලීන | 52 | 471 | -221 | 307 |
| දිගු කාලීන | 110 | - | -238 | - |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **කොටස් වෙළෙඳපොළ වෙත වූ මුළු ශුද්ධ ලැබීම්** | | **305** | | **270** |
| සෘජු ආයෝජන | | 33 | | 7 |
| විවිධ ආයෝජන | | 272 | | 263 |
| **භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර වෙත වූ ශුද්ධ ආයෝජන (ස්වෛරීත්ව බැඳුම්කර හැර)** | | **843** | | **493** |
| විදේශීය මිලදී ගැනීම් | | 2,236 | | 2,434 |
| විදේශීය විකුණුම් | | 1,393 | | 1,941 |

පිටු අංක 152 හා සම්බන්ධයි...

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

### 5.7.2 විවිධ ආයෝජන

#### හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්

**හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් වෙත වූ ලැබීම්, 2013 වසර තුළ දී වඩාත් ශක්තිමත් විය.** 2013 වසරේ දී කොළඹ කොටස් වෙළෙඳපොළෙහි මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය වූ එ.ජ.ඩොලර් මිලියන 270 න්, එ.ජ.ඩොලර් මිලියන 263 ක් හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස්[6] ලෙස ලද ආයෝජන වූ අතර එ.ජ.ඩොලර් මිලියන 7 ක් සෘජු ආයෝජන විය. කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් වෙත ලැබුණු ශුද්ධ ලැබීම් ප්‍රමාණය ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු මගින් ලද එ.ජ.ඩොලර් මිලියන 172 කින් සහ ප්‍රාථමික වෙළෙඳපොළ වෙත වූ ලැබීම් වන එ.ජ.ඩොලර් මිලියන 91 කින් සමන්විත විය. ප්‍රාථමික වෙළෙඳපොළ වෙත වූ ලැබීම් ප්‍රධාන වශයෙන් හිමිකම් නිකුතු තුළින් ලද එ.ජ.ඩොලර් මිලියන 83 කින් සමන්විත විය.

#### ණය සුරැකුම්පත්

**රජය සහ බැංකු අංශය විසින් සිදුකළ ණය සුරැකුම්පත් නිකුතු තුළින් මූල්‍ය ගිණුම වෙත සැලකිය යුතු ලැබීම් ප්‍රමාණයක් වාර්තා විය.** ජාත්‍යන්තර සුරැකුම්පත් වෙළෙඳපොළ තුළ ශ්‍රී ලාංකික බැංකු අංශයේ සහභාගිත්වය ශක්තිමත් කරමින්, 2012 වසරේ දී නිකුත් කළ ජාත්‍යන්තර සුරැකුම්පත් ප්‍රමාණය වූ එ.ජ.ඩොලර් මිලියන 500 සමඟ සැසඳීමේ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු දෙකක්, 2013 වසරේ දී එ.ජ.ඩොලර් බිලියන 1.35 ක වටිනාකමකින් යුත් ජාත්‍යන්තර සුරැකුම්පත් නිකුත් කළේය. පස් අවුරුදු ජාත්‍යන්තර බැඳුම්කර වශයෙන් කළ නිකුතු තුළින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව (NSB) ලද එ.ජ.ඩොලර් මිලියන 750, ලංකා බැංකුව (BOC) ලද එ.ජ.ඩොලර් මිලියන 500 සහ ශ්‍රී ලංකා සංවර්ධන මූල්‍ය සමායතනය (DFCC) ලද එ.ජ.ඩොලර් මිලියන 100 මෙයට ඇතුළත් වේ. මේ අතර, භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කරයන්හි ශුද්ධ ආයෝජන 2013 වසරේ දී රාජ්‍ය සුරැකුම්පත්වල විදේශීය ආයෝජන සීමාවට මුළුමනින්ම ළඟාවෙමින් එ.ජ.ඩොලර් මිලියන 493 ක ශුද්ධ ලැබීම් ප්‍රමාණයක් වාර්තා කළේය.

[6] ශ්‍රී ලාංකීය ව්‍යාපාරයක ඡන්දය ප්‍රකාශ කළ හැකි කොටස්වලින්, සියයට 10 කට වඩා අඩු ඒකපුද්ගල විදේශීය ආයෝජන 'හිමිකම් හා ආයෝජන අරමුදල් කොටස්' ලෙස සලකනු ලබන අතර විවිධ ආයෝජන යටතේ වාර්තා කර ඇත.

### 5.7.3 වෙනත් ආයෝජන

#### මුදල් සහ තැන්පතු

**2013 වසර තුළ දී මුදල් සහ තැන්පතුවලට අදාළ ගනුදෙනු මත වූ වත්කම් අඩු වූ අතර එහි වගකීම් ඉහළ ගියේය.** මුදල් සහ තැන්පතු, 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 162 ක ශුද්ධ වත්කම් වැඩිවීම සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 459 ක ශුද්ධ වත්කම් අඩුවීමක් වාර්තා කළ අතර තැන්පතු භාරගන්නා ආයතනයන්හි මුදල් සහ තැන්පතු වත්කම් සැලකිය යුතු ලෙස අඩුවීම ඒ සඳහා මූලිකවම හේතු විය. තවද, අන්තර්ජාතික විනිමය හුවමාරු ගිවිසුම් පියවීම මගින් මහ බැංකුවේ වගකීම් එ.ජ.ඩොලර් මිලියන 199 කින් අඩු වීම සහ වාණිජ බැංකුවල වගකීම් එ.ජ.ඩොලර් මිලියන 307 කින් වැඩිවීම (මූලිකවම අනේවාසික විදේශ ව්‍යවහාර ගිණුම් වගකීම්), 2013 වසරේ දී මුදල් සහ තැන්පතු වගකීම්හි එ.ජ.ඩොලර් මිලියන 108 ක ශුද්ධ වැඩිවීමක් වාර්තා වීමට හේතුවිය.

#### විදේශීය ණය

**2013 වසර තුළ දී තවදුරටත් විදේශීය ණය ලැබීම් වාර්තා විය.** රජය, ශ්‍රී ලංකා මහ බැංකුව, තැන්පතු භාරගන්නා ආයතන සහ පෞද්ගලික අංශය වෙත වූ විදේශීය ණය ලැබීම් 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 4,234 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 2,922 ක් විය. ජා.මූ.අරමුදලෙන් ලද සමීපස්ථ ණය පහසුකමට අදාළ ආපසු ගෙවීම් ඉහළ යාම හා පෞද්ගලික අංශයේ ණය ගෙවීම් ඉහළ යාම හේතුවෙන් මූල්‍ය ගිණුම වෙත වූ සමස්ත ණයෙහි ශුද්ධ වැඩිවීම 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 949 ක් වූ අතර මෙය, 2012 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 3,070 ක ශුද්ධ වැඩිවීම සමඟ සැසඳීමේ දී සැලකිය යුතු ලෙස පහළ යාමකි. සමස්ත විදේශීය ණය ලැබීම්වලින් සියයට 90 ක් දිගුකාලීන ණය විය. රජය ලබාගත් සමස්ත ණය ප්‍රමාණය, 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,854 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,677 ක් විය. රජය වෙත ලැබුණු ශුද්ධ ණය, 2012 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 992 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 821 ක් දක්වා සියයට 17.2 කින් අඩු විය. රජය වෙත ලැබුණු මුළු ණය තුළ සහනදායී කොන්දේසි යටතේ ලද ණය එ.ජ.ඩොලර් මිලියන 1,451 ක් ඇතුළත් වන අතර සහනදායී නොවන ණය, වාණිජ ණය සහ අපනයන ණය ලෙස එ.ජ.ඩොලර් මිලියන 226 ක් ඇතුළත් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වූ ලැබීම් සැලකීමේ දී, 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 780 ක ශුද්ධ ලැබීම්වලට සාපේක්ෂව 2013 වසරේ දී ප්‍රධාන වශයෙන් ජා.මූ.අරමුදලේ සමීපස්ථ ණය පහසුකමට අදාළ ආපසු

**5.8.ආ සංඛ්‍යා සටහන — මූල්‍ය ගිණුම (BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන

| ශීර්ෂය | 2012 (අ) | | 2013 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| අනෙකුත් ආයෝජන (පිටු අංක 151 හා සම්බන්ධයි) | | | | |
| ණය | - | 3,070 | - | 949 |
| මහ බැංකුව | - | 780 | - | -453 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | - | 780 | - | -453 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 579 | - | 124 |
| කෙටි කාලීන | - | - | - | -124 |
| දිගු කාලීන | - | 579 | - | 248 |
| රජය | - | 992 | - | 821 |
| දිගු කාලීන | - | 992 | - | 821 |
| අනෙකුත් අංශ (ඇ) | - | 719 | - | 456 |
| දිගු කාලීන | - | 719 | - | 456 |
| වෙළෙඳ ණය සහ අත්තිකාරම් | 90 | -571 | 195 | -54 |
| තැන්පතු භාරගන්නා ආයතන | -24 | - | 15 | - |
| කෙටි කාලීන | -24 | - | 15 | - |
| අනෙකුත් අංශ (ඈ) | 114 | -571 | 180 | -54 |
| කෙටි කාලීන | 114 | -571 | 180 | -54 |
| අනෙකුත් ගිණුම් ලැබිය යුතු/ ගෙවිය යුතු | 111 | -563 | 42 | 58 |
| මහ බැංකුව | - | -563 | - | 58 |
| කෙටි කාලීන (ඉ) | - | -563 | - | 58 |
| තැන්පතු භාරගන්නා ආයතන | 111 | - | 42 | - |
| කෙටි කාලීන | 111 | - | 42 | - |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි) | - | - | - | - |
| **සංචිත වත්කම්** | **760** | | **1,112** | |
| මූල්‍ය රත්‍රන් | 178 | | 351 | |
| විශේෂ ගැනුම් හිමිකම් | -0.5 | | 12 | |
| ජා. මූ. අරමුදලේ සංචිත මට්ටම | - | | - | |
| අනෙකුත් සංචිත වත්කම් | 583 | | 749 | |
| මුදල් සහ තැන්පතු | -801 | | 1,297 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | -817 | | 1,462 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 15 | | -165 | |
| සුරැකුම්පත් | 1,384 | | -548 | |
| ණය සුරැකුම්පත් | 1,384 | | -548 | |
| දිගු කාලීන | 1,384 | | -548 | |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **4,263** | | **3,126** | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **රජයේ දිගු කාලීන ණය (ශුද්ධ)** | | **992** | | **821** |
| ලැබීම් (ණය මුදා හැරීම්) | | 1,854 | | 1,677 |
| ගෙවීම් | | 862 | | 856 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.
(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළෙඳ ණය ඇතුළත් වේ.
(ඉ) ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගෙවීම් හේතුවෙන් එ.ජ.ඩොලර් මිලියන 453 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.

**තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය ණය ගැනීම් වසර තුළ දී ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.** බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු

සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වලින් යුත් තැන්පතු භාරගන්නා ආයතනයන්හි ශුද්ධ ණය ලැබීම් 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 124 ක් වූ අතර මෙය, 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 579 හා සැසඳීමේ දී සැලකිය යුතු අඩු වීමකි. තැන්පතු භාරගන්නා බොහොමයක් ආයතන ණය උපකරණ නිකුතුව තුළින් දිගුකාලීන මූල්‍යනය කෙරෙහි රුචිකත්වයක් දැක්වීම 2013 වසරේ දී දිගුකාලීන ණය ගැනීමෙහි පහත වැටීමක් සිදු වීමට මූලික වශයෙන් හේතු විය. තැන්පතු භාරගන්නා ආයතනයන්හි ශුද්ධ ණයගැනීම්වලින්, එ.ජ.ඩොලර් මිලියන 225 ක් සහ එ.ජ.ඩොලර් මිලියන 23 ක් පිළිවෙලින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් සිදුකළ දිගුකාලීන ණය ලබාගැනීම් වන අතර බලපත්‍රලාභී වාණිජ සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු ලබාගත් මුළු කෙටිකාලීන ණය 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 124 කින් අඩු විය. පෞද්ගලික අංශය සහ රාජ්‍ය සංස්ථා ලබාගත් දිගුකාලීන ණය 2012 වසරේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 964 සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,120 ක් විය. මෙය, රාජ්‍ය සංස්ථා විසින් ලබාගන්නා ලද එ.ජ.ඩොලර් මිලියන 425 කින් හා පෞද්ගලික අංශය විසින් ලබාගන්නා ලද එ.ජ.ඩොලර් මිලියන 695 කින් සමන්විත විය. පෞද්ගලික අංශය මගින් ලබාගත් මුළු ණය තුළ, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි වූ සමාගම් ලබාගත් එ.ජ.ඩොලර් මිලියන 505 ක් ඇතුළත් විය. පෞද්ගලික අංශය වෙත වූ ණය ලැබීම් මූලිකවම වරාය ආශ්‍රිත සේවා, විදුලි සංදේශ සේවා, මූල්‍ය සහ කල්බදු සේවා සහ නිෂ්පාදන අංශයේ සමාගම් වෙත විය. 2013 වසරේ දී රාජ්‍ය සංස්ථා වෙත වූ ලැබීම්, පුත්තලම ගල්අඟුරු බලාගාර ව්‍යාපෘතිය සඳහා ලංකා කෝල් කම්පැනි ලිමිටඩ් (Lanka Coal Company Limited) වෙත ලැබුණු එ.ජ.ඩොලර් මිලියන 125 කින් ද, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ව්‍යාපෘතිය සඳහා ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම වෙත ලැබුණු එ.ජ.ඩොලර් මිලියන 26 කින් සහ මාගම් රුහුණු පුර මහින්ද රාජපක්ෂ වරායේ II වන අදියර සඳහා ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත ලැබුණු එ.ජ.ඩොලර් මිලියන 275 කින් ද සමන්විත විය. 2013 වසරේ දී පෞද්ගලික අංශයේ සමාගම් 8 කට දිගුකාලීන ණය ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමැතිය ලබාදී තිබේ. 2013 වසරේ දී ලද ඉහළ ලැබීම් හමුවේ වුවද, ආපසු ගෙවීම් සැලකිය යුතු ලෙස ඉහළ යාම, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවල ශුද්ධ දිගුකාලීන ණය ගැනීම් පහත වැටීමට හේතු විය. ඒ අනුව, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවල ශුද්ධ ණය ලැබීම් 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 719 ට සාපේක්ෂව 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 456 ක් විය.

**5.9 සංඛ්‍යා සටහන** — **2013 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන්**

| දායකයා සහ ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ.ඩොලර් මිලියන |
|---|---|
| **චීන අපනයන - ආනයන බැංකුව** | **810** |
| එයින්; | |
| හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය - II අදියර | 236 |
| පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතිය - II අදියර | 110 |
| මාතර කතරගම දුම්රිය මාර්ග ව්‍යාපෘතිය | 85 |
| ශ්‍රී ලංකා දුම්රිය මාර්ග ව්‍යාපෘතිය සඳහා නව බලවේග කට්ටල 13 ක් සැපයීම | 43 |
| **ආසියානු සංවර්ධන බැංකුව** | **279** |
| එයින්; | |
| ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශවල කඩිනම් සංවර්ධන ව්‍යාපෘතිය | 41 |
| උතුරු පළාත් මාර්ග සම්බන්ධීකරණ ව්‍යාපෘතිය | 35 |
| පිවිතුරු බලශක්තිය සඳහා වූ ප්‍රවේශය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 25 |
| ජාතික අධිවේගී මාර්ග පද්ධතිය සඳහා අතිරේක මුදල් සම්පාදනය | 24 |
| අධ්‍යාපන අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 20 |
| **ජපානය** | **265** |
| එයින්; | |
| මහ කොළඹ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය - II අදියර | 93 |
| මහ කොළඹ ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | 26 |
| ප්‍රාදේශීය/ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (මධ්‍යම සහ සබරගමුව පළාත්) | 22 |
| ජල සැපයුම් සංවර්ධන ව්‍යාපෘතිය - II අදියර | 17 |
| ස්වාභාවික ව්‍යසනයන්ගෙන් හානියට පත් ප්‍රදේශය ගොඩනැගීමේ කඩිනම් ව්‍යාපෘතිය | 17 |
| **ඉන්දියාව** | **189** |
| එයින්; | |
| ඕමන්තේ, පලාලි, මඩු-තලෙයිමන්නාරම සහ මැදවච්චිය දුම්රිය මාර්ග ව්‍යාපෘතිය | 130 |
| උතුරු පළාත් දුම්රිය සේවාව ප්‍රතිසංස්කරණය | 50 |
| **ජාත්‍යන්තර සංවර්ධන සංගමය** | **171** |
| එයින්; | |
| මාර්ග සංවර්ධනය සඳහා වූ දෙවන අතිරේක අරමුදල් සම්පාදනය | 35 |
| ප්‍රාදේශීය මහා මාර්ග ව්‍යාපෘතිය | 27 |
| **චීන සංවර්ධන බැංකුව** | **129** |
| ප්‍රමුඛතාගත මාර්ග ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 105 |
| මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය | 24 |
| **රුසියානු සමූහාණ්ඩුව** | **65** |
| රුසියානු ණය අරමුදල | 65 |
| **නෙදර්ලන්ත රබෝ බැංකුව (Rabobank)** | **55** |
| එයින්; | |
| ශ්‍රී ලංකාවේ රුධිර පාරවිලයන සේවාව නගා සිටුවීම | 18 |
| හම්බන්තොට මහ රෝහල් සංවර්ධන ව්‍යාපෘතිය | 16 |
| **කොරියානු සමූහාණ්ඩුව** | **36** |
| එයින්; | |
| රුහුණුපුර ජල සැපයුම් ව්‍යාපෘතිය ප්‍රතිසංස්කරණය | 15 |
| **ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව** | **32** |
| කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය | 32 |

මූලය: මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

**වෙළෙඳ ණය සහ අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්**

**2013 වසර තුළ දී ලැබිය යුතු වෙළෙඳ ණය ප්‍රමාණය ඉහළ ගිය අතර ගෙවිය යුතු වෙළෙඳ ණය ප්‍රමාණය පහත වැටුණි.** 2013 වසරේ දී විදේශීය සමාගම් වෙත ලබාදුන් ශුද්ධ වෙළෙඳ ණයෙහි එ.ජ.ඩොලර් මිලියන 195 ක වැඩිවීමක් වාර්තා කළ අතර ශ්‍රී ලාංකික සමාගම් මගින් ලබාගත් ශුද්ධ වෙළෙඳ ණය එ.ජ.ඩොලර් මිලියන 54 කින් අඩු විය. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව මගින් සිදුකළ ඛනිජ තෙල් ආනයන බිල්පත් පියවීම් ඉහළ යාම ශුද්ධ වෙළෙඳ ණය ලබාගැනීම් අඩුවීමට මූලිකවම හේතු විය. තවද, මූලිකවම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම් ඇතුළත් අනෙකුත් ගෙවිය යුතු ගිණුම් 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 58 ක ශුද්ධ වැඩිවීමක් වාර්තා කළ අතර, අනෙකුත් ලැබිය යුතු ගිණුම් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වෙත වූ ලැබීම් එ.ජ.ඩොලර් මිලියන 42 ක වැඩිවීමක් වාර්තා කළේය.

### 5.7.4 විදේශ සංචිත වත්කම්

**විදේශ සංචිත වත්කම් ගනුදෙනු, 2013 වසරේ දී ශුද්ධ වැඩිවීමක් වාර්තා කළේය.** මුදල් හා තැන්පතු, මූල්‍යමය රත්‍රන් සහ විශේෂ ගැනුම් හිමිකම් පිළිවෙළින් එ.ජ.ඩොලර් මිලියන 1,297 කින්, එ.ජ.ඩොලර් මිලියන 351 කින් සහ එ.ජ.ඩොලර් මිලියන 12 කින් ඉහළ යාම, විදේශ සංචිත වත්කම් ඉහළ යාමට හේතු විය. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව ආයෝජනය කර ඇති ස්ථාවර ආදායම් සුරැකුම්පත් හි 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,384 ක ශුද්ධ මිලදී ගැනීමට සාපේක්ෂව 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 548 ක ශුද්ධ විකුණුම් ප්‍රමාණයක් වාර්තා විය. ශ්‍රී ලංකා මහ බැංකුව සතු මුදල් හා තැන්පතු 2012 වසරේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 801 ක අඩුවීම සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,297 කින් සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කළ අතර මෙයට මූලිකවම හේතු වූයේ ස්ථාවර ආදායම් සුරැකුම්පත්හි ශුද්ධ විකුණුම් ප්‍රමාණය වැඩිවීමයි.

## 5.8 ගෙවුම් තුලනය

**2013 වසරේ දී විදේශීය අංශය ශක්තිමත් වීම හේතුවෙන් ගෙවුම් තුලනයෙහි ඉහළ අතිරික්තයක් වාර්තා කළේය.** ජංගම ගිණුමේ ඇති වූ සැලකිය යුතු වර්ධනය සහ මූල්‍ය ගිණුම වෙත ලද ඉහළ ලැබීම් සමස්ත ශේෂයේ අතිරික්තය වැඩිවීමට ආයක විය. මේ අනුව, ගෙවුම් තුලනය 2012 වසරේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 151 ක අතිරික්තය සමඟ සැසඳීමේ දී 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 985 ක අතිරික්තයක් වාර්තා කළේය.

## 5.9 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

**නිශ්චිත කාලපරිච්ඡේදයක් අවසානයේ දී රටක් ලෝකයේ සෙසු රටවල් සමඟ පවත්වාගෙන ඇති මූල්‍ය වත්කම් හා වගකීම්වල වටිනාකම සහ සංයුතිය අන්තර්ජාතික ආයෝජන තත්ත්වය මගින් පෙන්නුම් කෙරෙයි.** 2012 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 9.2 ක් ලෙස වාර්තා වූ මුළු විදේශීය වත්කම් ප්‍රමාණය සියයට 2.5 කින් වර්ධනය වෙමින් 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 9.4 ක් ලෙස වාර්තා විය. ශ්‍රී ලංකාව සතු විදේශීය වත්කම්වලින් සියයට 80 ක් පමණ මහ බැංකුවේ සංචිත වත්කම් ආකාරයෙන් පවතින අතර, මුළු වත්කම්වලින් සියයට 11 ක් පමණ අනෙකුත් තැන්පතු භාරගන්නා ආයතන සතුව පවතී. මේ අතර, අන්තර්ජාතික ආයෝජන තත්ත්වය තුළ වගකීම් ලෙස සටහන් වන විදේශීය ආයෝජන ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළයාම හේතුවෙන් විදේශීය වගකීම් එ.ජ.ඩොලර් බිලියන 48.7 ක් දක්වා වර්ධනය වූ අතර එය පෙර වසරට සාපේක්ෂව සියයට 6.8 ක වර්ධනයකි. මුළු විදේශීය වගකීම් ප්‍රමාණයෙන් සියයට 50 ක් පමණ ණය වගකීම් ආකාරයෙන් පවතින අතර, විවිධ ආයෝජන සහ සෘජු ආයෝජන පිළිවෙළින් සියයට 22 ක් සහ සියයට 18 ක් ලෙස පැවතුණි. ඒ අනුව, 2012 වසරේ දී එ.ජ.ඩොලර් බිලියන 36.4 ක් වූ ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි ශුද්ධ වගකීම් තත්ත්වය 2013 වසරේ දී එ.ජ.ඩොලර් බිලියන 39.3 ක් විය.

### 5.9.1 සෘජු ආයෝජන තත්ත්වය

**විදේශීය සෘජු ආයෝජන ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ යාම, 2013 වසර අවසානයේ දී විදේශීය සෘජු ආයෝජන තත්ත්වය ඉහළ යාමට හේතුවිය.** විශේෂයෙන්, 2009 වසරේ සිට විදේශීය ආයෝජකයින් විසින් සිදු කරන ලද සෘජු ආයෝජනයන් තුළින් අඛණ්ඩව විදේශ විනිමය ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස විදේශීය සෘජු ආයෝජන වගකීම් ප්‍රමාණය 2012 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 8,087 ක සිට 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් මිලියන 8,987 ක් දක්වා වර්ධනය විය. මුළු සෘජු ආයෝජන වගකීම් ප්‍රමාණයෙන් සියයට 74 ක් කොටස් හිමිකම් ලෙස පවතින අතර, සියයට 26 ක් අන්තර් සමාගම් ණය ගැනීම් හා කොටස්කරුවන්ගේ අත්තිකාරම් ආකාරයෙන් පවතින ණයවලින් සමන්විත වේ. කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත

**5.10 සංඛ්‍යා සටහන**

**අන්තර්ජාතික ආයෝජන තත්ත්වය**
**(BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන
*(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2012 (අ) | | 2013 (ආ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන (ඇ)** | **475** | **8,087** | **540** | **8,987** |
| හිමිකම් සහ ආයෝජන කොටස් | 472 | 6,311 | 537 | 6,670 |
| ණය උපකරණ | 3 | 1,776 | 3 | 2,318 |
| **විවිධ ආයෝජන** | **0.3** | **9,242** | **...** | **10,725** |
| හිමිකම් සහ ආයෝජන කොටස් | - | 2,188 | - | 2,293 |
| අනෙකුත් අංශයන් | - | 2,188 | - | 2,293 |
| ණය සුරැකුම්පත් (ඈ) | 0.3 | 7,055 | ... | 8,432 |
| තැන්පතු භාරගන්නා ආයතන | 0.3 | 542 | ... | 1,954 |
| දිගු කාලීන | - | 542 | - | 1,954 |
| රජය | - | 6,508 | - | 6,479 |
| කෙටි කාලීන | - | 576 | - | 507 |
| දිගු කාලීන | - | 5,932 | - | 5,971 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | **-** | **-** | **-** | **-** |
| **අනෙකුත් ආයෝජන** | **1,611** | **28,273** | **1,390** | **28,991** |
| **මුදල් සහ තැන්පතු** | **741** | **1,778** | **283** | **1,886** |
| මහ බැංකුව | - | 205 | - | 6 |
| කෙටි කාලීන | - | 5 | - | 6 |
| දිගු කාලීන | - | 200 | - | - |
| තැන්පතු භාරගන්නා ආයතන | 741 | 1,574 | 283 | 1,880 |
| කෙටි කාලීන | 467 | 1,574 | 246 | 1,880 |
| දිගු කාලීන | 274 | - | 37 | - |
| **ණය** | **-** | **23,749** | **-** | **24,355** |
| මහ බැංකුව | - | 2,510 | - | 2,056 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය හා බැරකම් | - | 2,510 | - | 2,056 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 2,800 | - | 2,924 |
| කෙටි කාලීන | - | 2,127 | - | 2,003 |
| දිගු කාලීන | - | 673 | - | 921 |
| රජය | - | 15,616 | - | 15,806 |
| දිගු කාලීන | - | 15,616 | - | 15,806 |
| අනෙකුත් අංශයන් (ඉ) | - | 2,823 | - | 3,570 |
| දිගු කාලීන | - | 2,823 | - | 3,570 |
| **වෙළෙඳ ණය සහ අත්තිකාරම්** | **234** | **1,910** | **429** | **1,856** |
| තැන්පතු භාරගන්නා ආයතන | 103 | - | 118 | - |
| කෙටි කාලීන | 103 | - | 118 | - |
| අනෙකුත් අංශයන් (ඊ) | 132 | 1,910 | 312 | 1,856 |
| කෙටි කාලීන | 132 | 1,910 | 312 | 1,856 |
| **අනෙකුත් ගිණුම් ලැබිය යුතු/ගෙවිය යුතු** | **635** | **228** | **678** | **285** |
| මහ බැංකුව (උ) | - | 228 | - | 285 |
| කෙටි කාලීන | - | 228 | - | 285 |
| තැන්පතු භාරගන්නා ආයතන | 635 | - | 678 | - |
| කෙටි කාලීන | 635 | - | 678 | - |
| **විශේෂ ගැනුම් හිමිකම්** | **-** | **608** | **-** | **609** |
| **සංචිත වත්කම්** | **7,106** | | **7,495** | |
| මූල්‍ය රත්‍රන් | 727 | | 884 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 4 | | 16 | |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | 74 | | 74 | |
| අනෙකුත් සංචිත වත්කම් | 6,301 | | 6,522 | |
| මුදල් සහ තැන්පතු | 2,012 | | 3,309 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 1,381 | | 2,843 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 631 | | 465 | |
| සුරැකුම්පත් | 4,290 | | 3,213 | |
| ණය සුරැකුම්පත් | 4,290 | | 3,213 | |
| **මුළු වත්කම්/වගකීම්** | **9,193** | **45,602** | **9,425** | **48,704** |
| **ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය** | | **-36,409** | | **-39,279** |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| පරිණත කාලය අනුව ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය | | | | |
| කෙටි කාලීන | 4,149 | 5,843 | 5,619 | 6,030 |
| දිගු කාලීන | 5,039 | 29,073 | 3,802 | 31,321 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල පැවති සෘජු ආයෝජනද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය එකතුව වෙළෙඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රාජ්‍ය සංස්ථා ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළෙඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති මට්ටම

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සමාගම් තුළ සිදුකර ඇති සෘජු ආයෝජනයන්හි වෙළෙඳ මිල ඉහළ යාමෙන් සැලකිය යුතු ලාභ හිමි වූ අතර, ඒ අනුව, 2013 වසර අවසානයේ දී අනේවාසිකයින්ගේ සෘජු ආයෝජන කොටස් හිමිකම්වල මුළු වටිනාකම එ.ජ.ඩොලර් බිලියන 6.7 ක් විය. මේ අතර, ශ්‍රී ලාංකික නේවාසිකයින් විසින් විදේශයන්හි සිදුකළ සෘජු ආයෝජන හා සම්බන්ධ වත්කම් තත්ත්වය 2013 වසර අවසානයේ දී පෙර වසරේ අවසානයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 540 ක් දක්වා සියයට 13.7 කින් වර්ධනය විය. මෙම ආයෝජනයන්ගෙන් වැඩිප්‍රමාණයක් ලැයිස්තුගත ශ්‍රී ලාංකික සමාගම් විසින් අග්නිදිග ආසියානු රටවලට අයත්, විශේෂයෙන්ම සිංගප්පූරුව සහ මැලේසියාව වැනි රටවල ලැයිස්තුගත කර ඇති පෞද්ගලික සමාගම්වල ආයෝජනය කර ඇත.

### 5.9.2 විවිධ ආයෝජන තත්ත්වය

**විවිධ ආයෝජනයන්ගේ තත්ත්වය 2013 වසර අවසානයේ දී වර්ධනය විය.** හිමිකම් හා ආයෝජන අරමුදල් කොටස් සහ ණය සුරැකුම්පත් වශයෙන් පවතින විවිධ ආයෝජන තත්ත්වයන් 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 10.7 ක් දක්වා සියයට 16 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. අනේවාසික ඒකපුද්ගල කොටස්කරුවකු සතු කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලැයිස්තුගත ශ්‍රී ලාංකික සමාගමක කොටස් වටිනාකමෙන් සියයට 10 කට වඩා අඩු විදේශීය ආයෝජන, හිමිකම් ආයෝජන වශයෙන් සැලකෙන අතර එම ආයෝජන 2012 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් බිලියන 2.2 හා සැසඳීමේ දී 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 2.3 ක් දක්වා වර්ධනය විය. ආයෝජකයින්ගේ විශ්වාසය වර්ධනය වීම පිළිබිඹු කරමින් ගනුදෙනුවල ශුද්ධ වැඩිවීම සහ කොටස්වල වෙළෙඳ මිල වැඩිවීම තුළින් ඇතිවූ තක්සේරු ලාභ මෙම වර්ධනයට මූලිකවම හේතු විය. රජය සහ බැංකු අංශය විසින් නිකුත් කළ ණය සුරැකුම්පත් සඳහා වූ විදේශීය ආයෝජන 2012 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් බිලියන 7.1 ට සාපේක්ෂව 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 8.4 ක් විය. රජය විසින් නිකුත් කළ මුළු ණය සුරැකුම්පත්වලින් සියයට 92 ක් දිගුකාලීන භාණ්ඩාගාර බැඳුම්කර හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වූ අතර සියයට 8 ක් භාණ්ඩාගාර බිල්පත් විය. මේ අතර, තැන්පතු භාරගන්නා ආයතන විසින් නිකුත් කළ ජාත්‍යන්තර ණය සුරැකුම්පත් 2013 වසර අවසානයේ දී මුහුණත වටිනාකම මත එ.ජ.ඩොලර් බිලියන 1.35 ක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස දිගුකාලීන ණය සුරැකුම්පත් කල්පිරීමට ඇති මුළු ප්‍රමාණය 2013 වසර අවසානයේදී වෙළෙඳපොළ මිල මත එ.ජ.ඩොලර් බිලියන 1.95 ක් විය.

**විශේෂ සටහන 7**

## ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

### හැඳින්වීම

යම් කාලපරිච්ඡේදයක් අවසානයේ දී ශ්‍රී ලාංකික නේවාසිකයින් සතු විදේශීය වත්කම් සහ ඔවුන් වෙත ඇති විදේශීය වගකීම්වල වටිනාකම සහ සංයුතිය දැක්වෙන සංඛ්‍යාන ප්‍රකාශනයක් ලෙස අන්තර්ජාතික ආයෝජන තත්ත්වය හැඳින්විය හැක. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් ප්‍රකාශිත 'ගෙවුම් තුලනය සහ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය - අත්පොතෙහි හයවන සංස්කරණය' (BPM6) ට අනුරූප වන පරිදි ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය ගණනය කර ඉදිරිපත් කර ඇත. ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය ප්‍රකාශයට පත්කිරීමත් සමඟ, ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළට වැඩි ප්‍රවේශයක් ලබාගැනීමට ඉවහල් වන පරිදි, රටවල් බොහොමයක් අනුගමනය කරනු ලබන ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් හඳුන්වාදෙන ලද 'විශේෂිත දත්ත ප්‍රකාශන සම්මතය' (SDDS) හි තවත් එක් අවශ්‍යතාවයක් ශ්‍රී ලංකාව විසින් සම්පූර්ණ කරනු ලබයි.

### අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි සංයුතිය

සම්මත ඉදිරිපත් කිරීමේ ආකෘතියට අනුරූප වන පරිදි, මූල්‍ය ක්ෂේත්‍රයේ ශ්‍රිතීය අංශයන් (Functional Categories) පදනම් කරගනිමින් ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය ප්‍රකාශයට පත්කොට ඇත. සෘජු ආයෝජන, විවිධ ආයෝජන, මූල්‍ය ව්‍යුත්පන්න, අනෙකුත් ආයෝජන සහ සංචිත වත්කම් මෙහි මූලික ශ්‍රිතීය අංශයන් වේ. එසේම සෑම ශ්‍රිතීය අංශයක්ම, ප්‍රාග්ධන සහ ආයෝජන කොටස් අරමුදල් (Equity and Investment Fund Shares), ණය උපකරණ (Debt Instruments) සහ අනෙකුත් මූල්‍ය වත්කම් සහ වගකීම් (Other Financial Assets and Liabilities) ලෙස කේවල හෝ බහුවිධ මූල්‍ය උපකරණවලින් (Financial Instruments) සමන්විත වේ. එසේම, සෑම මූල්‍ය උපකරණයක් ම මහ බැංකුව, රජය, ශ්‍රී ලංකා මහ බැංකුව හැර තැන්පතු භාරගන්නා ආයතන (ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත්කළ බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් ඇතුළත් වේ) සහ අනෙකුත් අංශයන් (කුටුම්භ, මූල්‍ය සහ මූල්‍ය නොවන සමාගම් හා ලාභ නොලබන ආයතනවලින් සමන්විත) යනාදිය අයත් වන නේවාසික ආයතන අංශය මත පදනම්ව තවදුරටත් වර්ගීකරණය කර ඇත.

තවද, මූල්‍ය උපකරණයන්හි පරිණත කාලය මත පදනම්ව සියලුම වත්කම් සහ වගකීම් වර්ගීකරණය කර ඇති අතර, වසරකට වඩා අඩු පරිණත කාලයක් සහිත වත්කම් සහ වගකීම් 'කෙටිකාලීන' ලෙසත් වසරකට වඩා වැඩි පරිණත කාලයක් සහිත වත්කම් සහ වගකීම් 'දිගුකාලීන' ලෙසත් වර්ගීකරණය කර ඇත. 2012 සහ 2013 වසර අවසානයේ දී මූල්‍ය ක්ෂේත්‍රයේ ශ්‍රිතීය අංශයන් මත පදනම් වූ ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය සංඛ්‍යා සටහන 5.10 තුළින් දක්වා ඇත.

### ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි මූලික ශ්‍රිතීය අංශ

**සෘජු ආයෝජන :** BPM6 සම්මත නිර්වචනයට අනුව, ශ්‍රී ලාංකීය ආයතනයක ඡන්දය ප්‍රකාශ කිරීමට හැකියාව ඇති මූලික කොටස් එකතුවෙන් (Voting Shares), සියයට 10 ට වඩා වැඩි ආයෝජනයක් අනේවාසික ආයෝජකයෙක් සතු නම් ඔහු සෘජු ආයෝජකයෙක් (Direct Investor) වේ. ජාත්‍යන්තර සම්මතයක් වශයෙන් සියයට 10 මිනුම් දඬුව භාවිතා කර ඇත්තේ, සියයට 10 ට වඩා වැඩි ආයෝජනයක් සහිත අනේවාසික සෘජු ආයෝජකයෙකුට දේශීය සමාගමෙහි කළමනාකරණය තුළ සැලකිය යුතු බලයක් පවතින බැවිනි. BPM6 ආකෘතිය අනුගමනය කිරීමත් සමඟ, සම්මත මිනුම් දඬු නිර්වචනය සෘජු ආයෝජන සහ විවිධ ආයෝජන වර්ගීකරණය කිරීමට යොදාගනු ලබන අතර, සෑම විදේශීය සෘජු ආයෝජකයෙකු සතුව කොළඹ කොටස් වෙළෙඳපොළෙහි ලියාපදිංචි වූ සමාගමක් තුළ පවතින කොටස් හිමිකමෙහි ප්‍රතිශතය මත පදනම්ව, කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ ලැබීම් ප්‍රතිවර්ගීකරණය කර ඇත. තවද, සෘජු ආයෝජනයන්ට අමතරව විදේශීය ණය වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ මුළු ලැබීම් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ විශේෂිත විදේශ විනිමය ලැබීම් ලෙස පවතින වැදගත්කම සැලකිල්ලට ගෙන විශේෂිත අයිතමයක් (Memorandum Items) වශයෙන් ප්‍රකාශ කර ඇත.

**විවිධ ආයෝජන:** හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් සහ ශ්‍රී ලාංකික නේවාසිකයින් විසින් නිකුත් කරන ලද ණය සුරැකුම්පත්වල අනේවාසිකයන් විසින් කරන ලද ආයෝජනයන් විවිධ ආයෝජනයන්ට ඇතුළත් වේ. කොළඹ කොටස් වෙළෙඳපොළ වෙත වූ මුළු විදේශීය ආයෝජන ප්‍රමාණයෙන් සෘජු ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන ප්‍රමාණය අඩුකිරීමෙන් කොටස් වෙළෙඳපොළෙහි විවිධ ආයෝජනවල මුළු වටිනාකම ලබාගෙන ඇත. කොටස් වෙළෙඳපොළෙහි ද්විතීයික වෙළෙඳපොළ කටයුතු, මූලික මහජන නිකුතු තුළ විදේශීය ආයෝජන, හිමිකම් නිකුතු ආයෝජන සහ ඡන්දය ප්‍රකාශ කිරීමට හැකියාව නොමැති අනෙකුත් කොටස්හි විදේශීය ආයෝජනවලින් විවිධ ආයෝජනයන් සමන්විත වේ. ණය සුරැකුම්පත් යටතේ වන වගකීම් සඳහා, රජය විසින් සහ ශ්‍රී ලංකා මහ බැංකුව හැර තැන්පතු භාරගන්නා ආයතන (බලපත්‍රලාභී වාණිජ බැංකු) විසින් නිකුත් කරන ලද ණය සුරැකුම්පත් අයත් වේ. BPM6 නිර්දේශයට අනුව, සියලු ණය සුරැකුම්පත්වල වටිනාකම වෙළෙඳපොළ අගය මත

නිර්ණය කර ඇති අතර, එහි මුහුණත වටිනාකම විශේෂිත අයිතමයන් යටතේ ප්‍රකාශ කර ඇත. ණය සුරැකුම්පත්, නිකුතු දිනයේ සිට කල්පිරීමට ඇති කාලය පදනම් කර ගෙන කෙටිකාලීන සහ දිගුකාලීන ලෙස වර්ගීකරණය කර ඇති අතර, ඒ අනුව, විදේශීය ආයෝජකයින් විසින් භාණ්ඩාගාර බිල්පත්වල කර ඇති ආයෝජන පමණක් 'කෙටිකාලීන' ණය සුරැකුම්පත් යටතේ සටහන් කරනු ලැබේ.

**අනෙකුත් ආයෝජන :** අනෙකුත් කොටස් හිමිකම්, මුදල් සහ තැන්පතු, ණය, වෙළෙඳ ණය සහ අත්තිකාරම්, අනෙකුත් ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් සහ විශේෂ ගැනුම් හිමිකම් යන අයිතමයන් අනෙකුත් ආයෝජන යන පුළුල් වර්ගීකරණයට අයත් වේ. මුදල් සහ තැන්පතු වශයෙන් පවතින වත්කම් සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුව සහ තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතනයන්හි වත්කම් සහ වගකීම් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරනු ලබන 'මුදල් සමීක්ෂණය' (Monetary Survey) මගින් ලියාපදිංචි වාණිජ බැංකුවල මුදල් සහ තැන්පතු වශයෙන් ඇති විදේශීය වත්කම් සහ වගකීම්වල තත්ත්වයන් ලබාගන්නා අතර, 'මූල්‍ය සමීක්ෂණය' (Financial Survey) මගින් බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය ආයතනවල වත්කම් සහ වගකීම්වල තත්ත්වයන් ලබා ගැනෙයි.

ශ්‍රී ලංකාවේ සමස්ත වගකීම් ප්‍රමාණයෙන් සියයට 50 ට වඩා වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා මහ බැංකුව සහ අනෙකුත් තැන්පතු භාරගන්නා ආයතන, රාජ්‍ය අංශය සහ පුද්ගලික අංශය විසින් ලබාගෙන ඇති පියවීමට ඇති ණය කාණ්ඩයට අයත් වේ. ශ්‍රී ලංකා මහ බැංකුව ලබාගෙන ඇති සියලුම ණය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට පියවීමට ඇති ණය වගකීම් වන අතර සහනදායී සහ සහනදායී නොවන කොන්දේසි යටතේ ව්‍යාපෘති සඳහා ලබාගත් විදේශීය ණයවලින් රාජ්‍ය අංශයෙහි ණය සමන්විත වේ. පුද්ගලික අංශය සහ රාජ්‍ය සංස්ථා විසින් මෙතෙක් ලබාගෙන ඇති විදේශීය ණය 'අනෙකුත් අංශ' ගණයට ඇතුළත් වේ.

ශ්‍රී ලාංකීය ව්‍යාපාර විසින් අනේවාසිකයන්ට සපයා ඇති වෙළෙඳ ණය පහසුකම් සහ වාණිජ බැංකු මගින් සපයා ඇති වට්ටම් කරන ලද අපනයන බිල්පත්, වත්කම් වශයෙන් ඇති වෙළෙඳ ණය යටතට අයත්වන අතර, වෙළෙඳ ණය වැඩි කොටසක් පවතින ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ඇතුළු ශ්‍රී ලාංකික නේවාසිකයින් ලබාගත් වෙළෙඳ ණයවල වටිනාකම වෙළෙඳ ණය වශයෙන් පවතින වගකීම් යටතේ වර්ගීකරණය කර ඇත. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට අදාළ වෙළෙඳ ණය දත්ත කාර්තුමය පදනම මත ලබාගන්නා අතර පෞද්ගලික අංශයෙහි ව්‍යාපාරයන්ට ලැබී ඇති සහ ලබාදී ඇති වෙළෙඳ ණය දත්ත, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂිකව සිදුකරනු ලබන අන්තර්ජාතික ආයෝජන පිළිබඳ වාර්ෂික සමීක්ෂණය (Annual International Investment Survey) මගින් ලබා ගැනෙයි.

ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනු මත ශ්‍රී ලාංකීය වාණිජ බැංකු සතු කෙටිකාලීන වත්කම්, මූලිකවම ලැබිය යුතු ගිණුම් (Accounts Receivable) හි වත්කම් ගණයට අයත් වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිශ්කාෂණ සංගමයට (Asian Clearing Union) අයත් පියවීමට ඇති ප්‍රමාණය එහි ගෙවිය යුතු වගකීම් ගණයට අයත් වේ.

'විශේෂ ගැනුම් හිමිකම්' ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් හඳුන්වා දෙනු ලැබූ සංචිත වත්කමක් වන අතර සාමාජික රටවල් සතුව පවතින නිල විදේශීය සංචිත ප්‍රමාණයට අතිරේකව වෙන් කර ඇත. BPM6 අත්පොතට අනුකූලව, රටකට විදේශ ගැනුම් හිමිකම් වෙන්කිරීම, එම සාමාජික රටට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත ඇති වගකීමක් ලෙස සැලකිය යුතු වේ (යම් විශේෂිත අවස්ථාවන්වල දී වෙන් කළ ප්‍රමාණය ආපසු ගෙවීමට සිදුවීමේ අවම සම්භාවිතාවක් සහිත බැවිනි). 2009 වසරේ දී, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සියලුම සාමාජිකයන්ට විශේෂ ගැනුම් හිමිකම් වෙන්කර ඇති අතර, ඒ අනුව, 2013 වසර අවසානය වන විට ශ්‍රී ලංකාව වෙත වෙන්කර ඇති විශේෂ ගැනුම් හිමිකම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 609 ක් විය.

**සංචිත වත්කම්**

ගෙවුම් තුලන අවශ්‍යතාවයන් සපුරාගැනීම සඳහා ද විනිමය අනුපාතිකයෙහි අධික උච්චාවචනයන් වළක්වාලීම තුළින් මුදල් ඒකකය සහ ආර්ථිකය පිළිබඳ විශ්වාසය පවත්වාගෙන යාම සඳහා විදේශ විනිමය වෙළෙඳපොළට මැදිහත්වීමට ද යොදාගතහැකි, එමෙන්ම විදේශීය ණය ලබාගැනීමට ඇති හැකියාවට මූලික පදනමක් සපයනු ලබන, රටක මූල්‍ය අධිකාරිය විසින් පාලනය කරන විදේශ වත්කම් සංචිත වත්කම් ගණයට ගැනෙයි. BPM6 ප්‍රකාශන ආකෘතියත් සමඟ ආසියානු නිශ්කාෂණ සංගමයේ වත්කම් 'සහිතව' සහ 'රහිතව' වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සංචිත වත්කම් ප්‍රකාශ කිරීමේ පෙර පැවති ක්‍රමය, 2014 ජනවාරි මස සිට ක්‍රියාත්මක නොවන අතර ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංචිත වත්කම් නිර්වචනයට අනුකූලවන සියලුම අදාළ මූල්‍ය උපකරණ සංචිත වත්කම් තුළ අන්තර්ගත වේ. තවද, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පාලනය කරනු ලබන සංචිත වත්කම් සහ තැන්පතු භාරගන්නා ආයතනයන්හි විදේශීය මූල්‍ය වත්කම්වල එකතුව 'මුළු විදේශීය සංචිත' ලෙස පෙර හැඳින්වූ අතර, එය 'මුළු විදේශීය වත්කම්' ලෙස ප්‍රතිනිර්වචනය කර ඇත.

පරිශීලනය : ගෙවුම් තුලනය සහ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය අත්පොත - හය වන සංස්කරණය (BPM6), ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2009

## 5.9.3 අනෙකුත් ආයෝජන තත්ත්වය

### මුදල් සහ තැන්පතු

2013 වසර අවසානයේ දී මුදල් සහ තැන්පතුවල වත්කම් තත්ත්වය 2012 වසර අවසානයට සාපේක්ෂව අඩු වූ අතර, එහි වගකීම් තත්ත්වයෙහි ශුද්ධ වැඩිවීමක් වාර්තා විය. බලපත්‍රලාභී වාණිජ බැංකු සතු මුදල් සහ තැන්පතු 2013 වසරේ දී වර්ධනය වූ අතර වසර අවසානයේ පැවති විදේශීය වත්කම් තත්ත්වය එ.ජ.ඩොලර් මිලියන 283 ක් විය. මුදල් හා තැන්පතු ලෙස පවත්නා විදේශීය වගකීම් 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් බිලියන 1.8 ක සිට 2013 අවසාන වන විට එ.ජ.ඩොලර් බිලියන 1.9 ක් දක්වා වර්ධනය විය. ඒ සඳහා මූලික වශයෙන් හේතු වූයේ බැංකු අංශයේ මුදල් හා තැන්පතු වගකීම්වල ඇති වූ වර්ධනය වන අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීම් තත්ත්වය 2013 වසරේ දී ස්ථාවරව පැවතුණි.

### විදේශීය ණය

රජය, තැන්පතු භාරගන්නා ආයතන සහ පෞද්ගලික අංශය වෙත වූ විදේශීය ණය ලැබීම්හි ශුද්ධ වැඩි වීම, 2013 වසර අවසානයේ දී නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය වගකීම් ප්‍රමාණය ඉහළ යාමට හේතු විය. සමස්ත අන්තර්ජාතික වගකීම් තත්ත්වයෙන් සියයට 50 කට වඩා වැඩි ප්‍රමාණයක් විදේශීය ණය වගකීම් ලෙස පවතින අතර එය 2012 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් බිලියන 23.7 ට සාපේක්ෂව සියයට 2.6 කින් වර්ධනය වෙමින් 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 24.4 ක් ලෙස වාර්තා විය. මෙයින්, රජයේ දිගුකාලීන ණය වශයෙන් එ.ජ.ඩොලර් බිලියන 15.8 ක් පවතින අතර එය 2012 වසරට සාපේක්ෂව සියයට 1.2 ක සුළු වර්ධනයකි. මේ අතර ශ්‍රී ලංකා මහ බැංකුව, මහ බැංකුව හැර අනෙකුත් තැන්පතු භාරගන්නා ආයතන සහ පෞද්ගලික අංශය (අනෙකුත් අංශ යටතේ වර්ගීකරණය කර ඇති) සතු නොපියවා ඉතිරිව ඇති ණය වගකීම් පිළිවෙළින් 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 2.1 ක්, එ.ජ.ඩොලර් බිලියන 2.9 ක් සහ එ.ජ.ඩොලර් බිලියන 3.6 ක් විය. මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති මුළු ණය වගකීම් ජා.මූ. අරමුදලට ගෙවීමට ඇති වගකීම් වන අතර, එයින් මූලික වන්නේ 2016 වසරේ දී ආපසු ගෙවා නිමකිරීමට නියමිත ජා.මූ.අරමුදලේ සමීපස්ථ ණය පහසුකම සඳහා වන ගෙවිය යුතු ප්‍රමාණය වේ. මහ බැංකුව විසින් විනිමය පාලන රෙගුලාසි ක්‍රමිකව ලිහිල් කිරීම හේතුවෙන් පෞද්ගලික අංශයේ ආයතන කිහිපයක් 2013 වසරේ දී විදේශීය අරමුදල් සම්පාදන අවස්ථා සෙවීමට දිරිමත් වූ අතර එය අනෙකුත් අංශ යටතේ වර්ගීකරණය කර ඇති පෞද්ගලික අංශය සහ රාජ්‍ය සංස්ථා ලබාගත් විදේශීය ණය වැඩිවීමට යම් තරමකට දායක වී ඇත.

### වෙළෙඳ ණය සහ අත්තිකාරම්

2013 වසර අවසානයේ දී ලබා දුන් වෙළෙඳ ණය සහ අත්තිකාරම්වල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය වැඩි වූ අතර ලබා ගත් වෙළෙඳ ණය සහ අත්තිකාරම් ප්‍රමාණය අඩුවිය. 2013 වසර අවසානයේ දී ශ්‍රී ලාංකික සමාගම් විසින් දෙන ලද වෙළෙඳ ණය සහ අත්තිකාරම්වල නොපියවා ඉතිරිව ඇති ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 429 ක් විය. මේ අතර, ශ්‍රී ලාංකික සමාගම් ලබාගත් වෙළෙඳ ණය සහ අත්තිකාරම් ප්‍රමාණය 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 1.9 ක් දක්වා සියයට 2.8 කින් අඩු විය. මේ සඳහා මූලිකවම හේතු වූයේ වෙළෙඳ ණය සහ අත්තිකාරම්වලින් සැලකිය යුතු කොටසක් වන ඛනිජ තෙල් ආනයනයන්ට අදාළ බිල්පත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පියවීමයි.

### අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්

2013 වසර අවසානයේ දී අනෙකුත් ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්වල වත්කම් සහ වගකීම් තත්ත්වයන් ඉහළ ගියේය. වාණිජ බැංකු වල ජාත්‍යන්තර වෙළෙඳ ගනුදෙනු මත වූ කෙටිකාලීන වත්කම්වලින් මූලිකව සැදුම්ලත් අනෙකුත් ලැබිය යුතු ගිණුම් 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් මිලියන 678 ක් ලෙස වාර්තා විය. 2013 වසර අවසානයේ දී අනෙකුත් ගෙවීමට ඇති ගිණුම්හි වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 285 සඳහා හේතු වූයේ ආසියානු නිශ්කාෂණ සංගමයට අදාළ මහ බැංකුවේ වගකීම්ය.

### විශේෂ ගැනුම් හිමිකම්

2013 වසර අවසානයේ දී විශේෂ ගැනුම් හිමිකම්හි (වි.ගැ.හි.) නොපියවා ඉතිරිව ඇති වගකීම් තත්ත්වය විනිමය අනුපාතික උච්චාවචනයන් හමුවේ සුළු වශයෙන් වෙනස් විය. BPM6 අනුව වි.ගැ.හි. වෙන්කිරීම් ජා.මූ.අරමුදලේ සාමාජික රටක් දැරිය යුතු වගකීමක් ලෙස (යම් අවස්ථාවල දී මෙම වෙන්කිරීම් නැවත ගෙවීම අවශ්‍යවිය හැකි බැවින්) වාර්තා කෙරේ. 2013 වසර අවසානයේ දී ශ්‍රී ලංකාව සතු වි.ගැ.හි. වෙන්කිරීම් එ.ජ.ඩොලර් මිලියන 609 ක් විය.

## 5.9.4 විදේශීය සංචිත වත්කම් තත්ත්වය

මූල්‍ය අධිකාරියට පමාවකින් තොරව භාවිතයට ගත හැකි විදේශීය වත්කම් පිළිබිඹු කෙරෙන රටෙහි විදේශීය සංචිත තත්ත්වය 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 7.5 ක් විය. BPM6 ආකෘතිය හඳුන්වාදීමත් සමඟ ශ්‍රී ලංකා මහ බැංකුව පෙර අනුගමනය කළ ආකාරය වූ සංචිත වත්කම් ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම් 'ඇතුළත්ව' හා 'ඇතුළත් නොවූ' ලෙස වාර්තා කිරීමෙන් ඉවත්ව ජා.මූ. අරමුදලෙහි

සංචිත වත්කම් නිර්වචනයට ඇතුළත් වන සියලුම මූල්‍ය උපකරණයන් සංචිත වත්කම් තුළ ඇතුළත් කර ඇත. මුළු විදේශීය වත්කම්වල ඇතුළත්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන සංචිත වත්කම් සහ තැන්පතු භාරගන්නා ආයතන සතු විදේශීය මූල්‍ය වත්කම් 2013 වසර අවසානයේ දී එ.ජ.ඩොලර් බිලියන 8.6 ක් දක්වා වර්ධනය විය. 2013 වසර අවසානයේ දී ඉහළ ගිය සංචිත වත්කම් තත්ත්වය ජාත්‍යන්තරව පිළිගත් සම්මතය වන ආනයනික මාස 3 හා සැසඳීමේ දී භාණ්ඩ ආනයනික මාස 5.0 කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 4.2 කට සමාන විය. මුළු විදේශීය වත්කම් භාණ්ඩ ආනයනික මාස 5.7 කට සහ භාණ්ඩ හා සේවා ආනයනික මාස 4.8 කට සමාන විය. සංචිත ප්‍රමාණාත්මකභාවය, කෙටිකාලීන ණය සහ වගකීම්වල අනුපාතයක් ලෙස 2012 අවසානයේ දී සියයට 64 ක් වූ අතර බැංකු අංශයේ කෙටිකාලීන වගකීම් ඉහළ යාම හේතුවෙන් 2013 වසර අවසානයේ දී එය සියයට 63 ක් දක්වා පහත වැටුණි. මේ අතර, දළ නිල සංචිත, භාණ්ඩාගාර බැඳුම්කර හැර කෙටිකාලීන ණයෙහි අනුපාතයක් ලෙස 2012 වසර අවසානයේ දී සියයට 83 ක් වූ අතර, එය 2013 වසර අවසානයේ දී සියයට 85 ක් දක්වා වර්ධනය විය.


## 5.10 විදේශීය ණය සහ ණය සේවාකරණය

### 5.10.1 විදේශීය ණය

**පෞද්ගලික අංශයට සහ තැන්පතු භාරගන්නා ආයතනයන් වෙත වූ ලැබීම් ඉහළ යාම නිසා 2013 වසරේ දී සමස්ත විදේශීය ණය මට්ටම ඉහළ ගියේය.** BPM6 නිර්දේශයන්ට අනුව නොපියවා ඉතිරිව ඇති වි.ගැ.හි. තත්ත්වය සහ ඍජු ආයෝජන ව්‍යාපාර වල අන්තර්සමාගම් ණයදීම් විදේශීය ණය තුළ අන්තර්ගත වන අතර, ඒවා පෙර ආකෘතියේ දී විදේශ ණය තුළ අන්තර්ගත නොවුණි. මෙම නව එකතුවීම් සහ ප්‍රතිවර්ගීකරණය කිරීම සමඟ සමස්ත විදේශීය ණය 2012 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් බිලියන 37.1 ක සිට සියයට 7.1 කින් වර්ධනය වෙමින් 2013 වසර අවසානය වන විට එ.ජ.ඩොලර් බිලියන 39.7 ක් ලෙස වාර්තා විය. විදේශීය ණය ලෙස පෞද්ගලික අංශය වෙත වූ ලැබීම් වැඩිවීම සහ තැන්පතු භාරගන්නා ආයතනයන්හි ජාත්‍යන්තර ණය සුරැකුම්පත් නිකුතුවල ලැබීම් මෙම වර්ධනය සඳහා මූලික විය. සමස්ත විදේශීය ණයවල ප්‍රතිශතයක් ලෙස නොපියවා ඉතිරිව ඇති ණය වගකීම් ප්‍රමාණය 2012 වසර අවසානයේ දී වාර්තා වූ

**5.12 රූප සටහන**

**කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්**




**5.11 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්**

*(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)*


| | එ.ජ.ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 | 2013 (අ) | 2009 | 2010 | 2011 | 2012 | 2013 (අ) |
| 1. රජය | 113 | 88 | 615 | 631 | 465 | 12,920 | 9,747 | 70,088 | 80,209 | 60,857 |
| 2. මහ බැංකුව | 5,244 | 7,109 | 6,134 | 6,475 | 7,030 | 599,880 | 788,722 | 698,666 | 823,375 | 919,171 |
| 3. දළ නිල සංචිත වත්කම් (1+2) | 5,357 | 7,196 | 6,749 | 7,106 | 7,495 | 612,799 | 798,469 | 768,754 | 903,584 | 980,028 |
| 4. තැන්පතු භාරගන්නා ආයතන | 1,673 | 1,424 | 1,241 | 1,480 | 1,078 | 191,373 | 158,031 | 141,394 | 188,195 | 141,008 |
| 5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ) | 7,030 | 8,621 | 7,991 | 8,586 | 8,574 | 804,173 | 956,500 | 910,148 | 1,091,779 | 1,121,036 |
| 6. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | | | | | | |
| 6.1 වෙළෙඳ භාණ්ඩ | 6.3 | 6.4 | 4.0 | 4.4 | 5.0 | | | | | |
| 6.2 වෙළෙඳ භාණ්ඩ හා සේවා | 5.5 | 5.7 | 3.6 | 3.9 | 4.2 | | | | | |
| 7. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | | | | | | |
| 7.1 වෙළෙඳ භාණ්ඩ | 8.3 | 7.7 | 4.7 | 5.4 | 5.7 | | | | | |
| 7.2 වෙළෙඳ භාණ්ඩ හා සේවා | 7.2 | 6.8 | 4.3 | 4.7 | 4.8 | | | | | |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) 'විදේශයන්හි සිදුකරන ලද ඍජු ආයෝජන' සහ 'ලබාදුන් වෙළෙඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.

**5.13 රූප සටහන** **විදේශීය ණය**




සියයට 64 සමඟ සැසඳීමේ දී 2013 වසර අවසානය වනවිට සියයට 61 ක් විය. විදේශීය ණය සඳහා නව දත්ත වර්ගීකරණයන් ඇතුළත් කිරීමත් සමඟ 2012 වසර අවසානයේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස සියයට 62.5 ක් වූ සමස්ත විදේශීය ණය, විදේශීය ණය වැඩිවීමට වඩා වැඩි වූ ද.දේ.නි.යේ වැඩිවීම පිළිබිඹු කරමින් 2013 වසර අවසානයේ දී සියයට 59.2 ක් ලෙස වාර්තා විය.

**ශ්‍රී ලංකාවේ සමස්ත විදේශීය ණයවලින් වැඩි ප්‍රමාණයක් දිගුකාලීන ණයවලින් සමන්විත වේ.** ණය කල්පිරීමේ සංයුතිය අනුව, විදේශීය ණයවලින් සියයට 84 ක ප්‍රමාණයක් ණය උපකරණයන්හි මූලික කල්පිරීමේ කාලය මත පදනම්ව වසරකට වඩා වැඩි පරිණත කාලයක් සහිත දිගුකාලීන ණය වශයෙන් වර්ගීකරණය කර ඇත. විදේශීය ණයෙහි ආංශික සංයුතිය සැලකීමේ දී මුළු ණය ප්‍රමාණයෙන් සියයට 56 ක් රාජ්‍ය ණය වූ අතර තැන්පතු භාරගන්නා ආයතනයන්, අනෙකුත් අංශ (පෞද්ගලික අංශය සහ රාජ්‍ය සංස්ථා), ශ්‍රී ලංකා මහ බැංකුව සහ ඍජු ආයෝජන සමාගම්හි විදේශීය ණය ප්‍රමාණය පිළිවෙළින් සියයට 17, සියයට 14, සියයට 7 සහ සියයට 6 මට්ටමේ පැවතුණි. විනිමය පාලන රෙගුලාසි ලිහිල්කිරීම සහ බැංකු හා පෞද්ගලික ආයතනයන්ට සංස්ථාපිත ණය සුරැකුම්පත් නිකුත් කිරීම තුළින් විදේශයන්ගෙන් අරමුදල් රැස්කිරීම සඳහා අවස්ථාවන් වැඩිවශයෙන් ලබාදීම සහ දිගුකාලීන ණය ගැනීම්හි ප්‍රතිඵලයක් ලෙස බැංකු සහ පෞද්ගලික අංශයන්ගේ විදේශීය ණය තත්ත්වය සැලකිය යුතු ලෙස වර්ධනය විය.

### 5.10.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

**සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2013 වසරේ දී වැඩිවිය.** ණය වාරික හා පොලී ගෙවීම්වලින් සමන්විත සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2012 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 2,673 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 3,818 දක්වා

**5.12 සංඛ්‍යා සටහන** **නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය (BPM6 සංස්කරණයට අනුව සම්මත ඉදිරිපත් කිරීම)**

එ.ජ.ඩොලර් මිලියන
*(වසර අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2012(අ) | 2013(ආ) |
|---|---|---|
| **රජය** | **22,123** | **22,284** |
| **කෙටි කාලීන** | **576** | **507** |
| ණය සුරැකුම්පත් | 576 | 507 |
| භාණ්ඩාගාර බිල්පත් (ඇ) | 576 | 507 |
| **දිගු කාලීන** | **21,547** | **21,777** |
| ණය සුරැකුම්පත් | 5,932 | 5,971 |
| භාණ්ඩාගාර බැඳුම්කර (ඇ) | 2,067 | 2,486 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඈ) | 3,864 | 3,485 |
| ණය | 15,616 | 15,806 |
| **මහ බැංකුව** | **3,550** | **2,956** |
| **කෙටි කාලීන** | **232** | **291** |
| අනෙකුත් ගෙවිය යුතු ගෙවීම් | 228 | 285 |
| ආසියානු නිශ්කාෂණ සංගමයේ වගකීම් | 228 | 285 |
| මුදල් සහ තැන්පතු | 5 | 6 |
| **දිගු කාලීන** | **3,318** | **2,665** |
| විශේෂ ගැණුම් හිමිකම් වෙන් කිරීම් | 608 | 609 |
| ණය | 2,510 | 2,056 |
| ජා.මූ. අරමුදලේ ණය හා බැරකම් | 2,510 | 2,056 |
| සමීපස්ථ ණය පහසුකම් | 2,502 | 2,056 |
| PRGF ණය මුදල 2 | 6 | - |
| විස්තීරණ ණය පහසුකම | 3 | - |
| මුදල් හා තැන්පතු | 200 | - |
| ජාත්‍යන්තර විනිමය හුවමාරු ගිවිසුම් (ඇ) | 200 | - |
| **තැන්පතු භාරගන්නා ආයතන** | **4,916** | **6,758** |
| **කෙටි කාලීන** | **3,701** | **3,884** |
| මුදල් හා තැන්පතු (ඉ) | 1,574 | 1,880 |
| වාණිජ බැංකු | 1,574 | 1,880 |
| ණය | 2,127 | 2,003 |
| වාණිජ බැංකු | 2,127 | 2,003 |
| **දිගු කාලීන** | **1,215** | **2,875** |
| ණය සුරැකුම්පත් (ඈ) | 542 | 1,954 |
| වාණිජ බැංකු | 542 | 990 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | - | 964 |
| ණය | 673 | 921 |
| වාණිජ බැංකු | 600 | 825 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 73 | 96 |
| **අනෙකුත් අංශ (ඊ)** | **4,733** | **5,425** |
| **කෙටි කාලීන** | **1,910** | **1,856** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (උ) | 1,910 | 1,856 |
| **දිගු කාලීන** | **2,823** | **3,570** |
| ණය | 2,823 | 3,570 |
| පෞද්ගලික අංශය | 806 | 1,194 |
| රජය සතු ආයතන සහ රාජ්‍ය සංස්ථා | 2,018 | 2,376 |
| **ඍජු ආයෝජන : අන්තර් සමාගම් ණය (ඌ)** | **1,776** | **2,318** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **37,098** | **39,741** |
| ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන් | | |
| දළ විදේශීය ණය | 62.5 | 59.2 |
| කෙටි කාලීන ණය | 10.8 | 9.7 |
| දිගු කාලීන ණය | 51.7 | 49.4 |
| දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන් | | |
| කෙටි කාලීන ණය | 17.3 | 16.4 |
| දිගු කාලීන ණය | 82.7 | 83.6 |
| **විශේෂිත අයිතමයන්** | | |
| **ණය සුරැකුම්පත්හි මුහුණත වටිනාකම - ආංශික වර්ගීකරණය** | **7,131** | **9,001** |
| රජය | 6,631 | 7,151 |
| භාණ්ඩාගාර බිල්පත් | 631 | 565 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 2,500 | 3,086 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 3,500 | 3,500 |
| මහ බැංකුව හැර තැන්පතු භාරගන්නා ආයතන | 500 | 1,850 |
| වාණිජ බැංකු | 500 | 1,000 |
| ලියාපදිංචි විශේෂිත බැංකු | - | 850 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) වෙළෙඳපොළ මිල මත පදනම්ව
(ඉ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(ඊ) පෞද්ගලික අංශය සහ රාජ්‍ය සංස්ථා ඇතුළත් වේ.
(උ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළෙඳ ණය ඇතුළත් වේ.
(ඌ) ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

සියයට 42.8 කින් වර්ධනය විය. 2013 වසරේ දී ණය වාරික ගෙවීම් සියයට 50.2 කින් සහ පොලී ගෙවීම් සියයට 27.8 කින් ඉහළ යාම මේ සඳහා ප්‍රධානතම හේතු විය. ජා.මූ.අරමුදලට අදාළ එ.ජ.ඩොලර් මිලියන 453 ක ආපසු ගෙවීම්, රජයේ දිගුකාලීන ණය හා අදාළ එ.ජ.ඩොලර් මිලියන 856 ක ආපසු ගෙවීම්, පෞද්ගලික අංශයේ ණය වගකීම්වලට අදාළ එ.ජ.ඩොලර් මිලියන 665 ක ආපසු ගෙවීම් සහ එ.ජ.ඩොලර් මිලියන 719 ක රජයේ සුරැකුම්පත් කල්පිරීම් මෙම ණය වාරික ගෙවීම්වලට අයත් වේ. රජයේ සුරැකුම්පත් සඳහා පොලී ගෙවීම් සැලකිය යුතු ලෙස ඉහළ යාම සමස්ත පොලී ගෙවීම් ඉහළ යාම සඳහා ප්‍රධානතම හේතු විය. ඒ අනුව, විදේශීය ණය සේවාකරණ ගෙවීම්, භාණ්ඩ හා සේවා අපනයනයන්හි ප්‍රතිශතයක් ලෙස 2012 වසරේ දී වාර්තා වූ සියයට 19.7 සිට 2013 වසරේ දී සියයට 25.3 ක් දක්වා වර්ධනය විය.

## 5.11 විනිමය අනුපාතිකයේ වෙනස්වීම්

2013 වසරේ දී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය **නම්‍යශීලී විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීම කෙරෙහි තවදුරටත් යොමුවිය.** 2013 වසරේ ජනවාරි මස සිට ජූනි මස මුල්භාගය දක්වා ශ්‍රී ලංකා රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 0.55 කින් සුළු වශයෙන් අධිප්‍රමාණය වූ අතර, ආනයන ඉල්ලුම ඉහළ යාම සහ එක්සත් ජනපදයේ බැඳුම්කර මිල දී ගැනීමේ වැඩසටහන සීමාකිරීමේ ඉඩප්‍රස්ථාව මත රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙන් විදේශීය ආයෝජකයින් ඉවත්ව යනු ඇතැයි යන අපේක්ෂාව මූලිකව හේතුවෙමින් රුපියල ජූනි මස දෙවන සතියේ සිට අගෝස්තු මස අවසානය දක්වා එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 5.01 කින් අවප්‍රමාණය විය. සිය ප්‍රමාණාත්මක ලිහිල් කරන වැඩසටහන නුදුරු අනාගතයේ දී සීමාකිරීමට

**5.13 සංඛ්‍යා සටහන**

**විදේශීය ණය සේවාකරණ ගෙවීම්**

| ශීර්ෂය | එ.ජ.ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2009 | 2010 | 2011 | 2012 (අ) | 2013 (ආ) | 2009 | 2010 | 2011 | 2012 (අ) | 2013 (ආ) |
| **1. ණය සේවාකරණ ගෙවීම්** | **2,009** | **1,853** | **1,799** | **2,673** | **3,818** | **230,616** | **208,984** | **199,305** | **334,733** | **491,888** |
| **1.1 ණය ආපසු ගෙවීම්** | **1,652** | **1,234** | **1,092** | **1,792** | **2,692** | **189,621** | **138,941** | **121,246** | **223,061** | **346,710** |
| (i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට | 95 | 46 | 11 | 57 | 453 | 10,941 | 5,238 | 1,238 | 7,413 | 57,683 |
| (ii) අනෙකුත් | 1,557 | 1,188 | 1,081 | 1,735 | 2,239 | 178,680 | 133,703 | 120,008 | 222,973 | 289,026 |
| රජයේ මැදි සහ දිගුකාලීන | 940 | 665 | 789 | 862 | 856 | 107,880 | 74,932 | 87,754 | 110,412 | 110,437 |
| රාජ්‍ය සුරැකුම්පත් | 307 | 92 | 95 | 628 | 719 | 35,109 | 10,406 | 10,406 | 80,991 | 92,610 |
| රාජ්‍ය සංස්ථා සහ පෞද්ගලික අංශය | 311 | 431 | 197 | 245 | 665 | 35,691 | 48,365 | 21,848 | 31,570 | 85,978 |
| **1.2 පොලී ගෙවීම්** | **357** | **619** | **707** | **881** | **1,126** | **40,995** | **70,043** | **78,059** | **111,671** | **145,178** |
| (i) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට | 6 | 7 | 10 | 36 | 33 | 644 | 803 | 1,081 | 4,639 | 4,298 |
| (ii) අනෙකුත් | 351 | 612 | 697 | 845 | 1,092 | 40,351 | 69,240 | 76,978 | 107,032 | 140,880 |
| හිමිකම් | | | | 437 | 516 | | | | 55,528 | 66,670 |
| ණය සුරැකුම්පත් | | | | 408 | 576 | | | | 51,415 | 74,210 |
| **2. වෙළෙඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්** | **8,977** | **11,100** | **13,643** | **13,573** | **15,079** | **1,031,289** | **1,254,021** | **1,508,565** | **1,730,467** | **1,949,267** |
| **3. වෙළෙඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම** | **12,500** | **15,592** | **19,314** | **19,754** | **21,655** | **1,436,578** | **1,761,613** | **2,135,356** | **2,519,483** | **2,798,774** |
| **4. ණය සේවාකරණ අනුපාතිකය (ඇ)** | | | | | | | | | | |
| 4.1 ඉහත 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 22.4 | 16.7 | 13.2 | 19.7 | 25.3 | 22.4 | 16.7 | 13.2 | 19.3 | 25.2 |
| (ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 21.3 | 16.2 | 13.0 | 19.0 | 22.1 | 21.2 | 16.2 | 13.1 | 19.1 | 22.1 |
| 4.2 ඉහත 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය | 16.1 | 11.9 | 9.3 | 13.5 | 17.6 | 16.1 | 11.9 | 9.3 | 13.3 | 17.6 |
| (ii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 15.3 | 11.5 | 9.2 | 13.1 | 15.4 | 15.2 | 11.5 | 9.2 | 13.1 | 15.4 |
| **5. රජයේ ණය සේවාකරණ ගෙවීම්** | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඈ) | 1,497 | 1,219 | 1,474 | 2,191 | 2,443 | 171,834 | 136,411 | 162,507 | 280,215 | 315,016 |
| 5.2 ඉහත 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 74.5 | 65.8 | 82.0 | 82.0 | 64.0 | 74.5 | 65.3 | 81.5 | 83.7 | 64.0 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) වසර තුළ විනිමය අනුපාතිකයන් හි සිදුවූ වෙනස්වීම් හේතුවෙන් රුපියල් වටිනාකම හා එ.ජ.ඩොලර් වටිනාකම අනුව ණය සේවාකරණ අනුපාතිකයන් වෙනස් වේ.
(ඈ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

මූලයන්: විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ඇති ඉඩප්‍රස්ථාව පිළිබඳ එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව මගින් නිවේදනය කිරීමෙන් අනතුරුව විශාල වශයෙන් අවප්‍රමාණය වූ ඉන්දියානු රුපියල සහ ඉන්දුනීසියානු රුපියා වැනි නැගී එන වෙළෙඳපොළවල මුදල් ඒකක සහ ජපන් යෙන් වැනි ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ග හා සසඳා බැලීමේ දී ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය වීම අවම තත්ත්වයක පැවතීම සැලකිය යුතු වේ. කෙසේ නමුත්, බැංකු ක්ෂේත්‍රය තුළ ඉහළ ගිය ලැබීම් සහ වෙළෙඳපොළ අපේක්ෂාවන් තවදුරටත් ශක්තිමත් කරමින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ DFCC බැංකුව සිදුකළ බැඳුම්කර නිකුතුව හේතුවෙන් ශ්‍රී ලංකා රුපියල 2013 සැප්තැම්බර් මස මුල සිට අධිප්‍රමාණය විය. සමස්තයක් ලෙස 2013 වසර අග වන විට, රුපියල එ.ජ.ඩොලරයට එරෙහිව රු. 130.75 ක් දක්වා සියයට 2.75 කින් අවප්‍රමාණය වූ අතර එ.ජ.ඩොලරයට එරෙහි වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය 2012 වසර සඳහා වූ රු. 127.60 ට සාපේක්ෂව 2013 වසරේ දී රු. 129.11 ක් ලෙස සටහන් විය.

**අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා රුපියල 2013 වසරේ දී අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට එරෙහිව මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් පෙන්වීය.** රුපියල, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 4.69 කින්ද, යූරෝවලට එරෙහිව සියයට 6.83 කින් ද අවප්‍රමාණය වූ අතර ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 10.16 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 18.78 කින් ද සැලකිය යුතු ලෙස අධිප්‍රමාණය විය. ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ එ.ජ.ඩොලරයට එරෙහිව යූරෝ, ජපන් යෙන්, ස්ටර්ලින් පවුම් වැනි ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් 2013 වසර තුළ දී රුපියල වි.ගැ.හි. ඒකකයට එරෙහිව සියයට 3.00 කින් අවප්‍රමාණය විය.

### 5.11.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

**2013 වසර තුළ දී, නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතිකයන් 2012 වසරේ දක්නට ලැබුණු අවප්‍රමාණය වීමට සාපේක්ෂව තරමක අධිප්‍රමාණය වීමක් පෙන්නුම් කළේය.** මුදල් වර්ග 5 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතිකය හැර අනෙකුත් සියලුම දර්ශකයන්, එනම්, මුදල් වර්ග 24 කින් යුත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතිකයත්, මුදල් වර්ග 5 කින් යුත් පැස මත හා මුදල් වර්ග 24 කින් යුත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකත් මධ්‍යස්ථ ප්‍රමාණයකින් අධිප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියල ජපන් යෙන්වලට සහ ඉන්දියානු රුපියලට එරෙහිව සැලකිය යුතු ලෙස නාමිකව අධිප්‍රමාණය වුවද, එ.ජ.ඩොලරය, ස්ටර්ලින් පවුම සහ යූරෝ යන පැසෙහි

**5.14 සංඛ්‍යා සටහන**

**විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 | 2012 | 2013 | 2012 | 2013 |
| යූරෝ | 147.42 | 168.13 | 180.45 | 153.86 | 164.01 | 171.51 | -12.31 | -6.83 | -6.18 | -4.37 |
| ඉන්දියානු රුපියල් | 2.15 | 2.33 | 2.11 | 2.39 | 2.39 | 2.21 | -7.45 | 10.16 | -0.34 | 8.22 |
| ජපන් යෙන් | 1.47 | 1.48 | 1.25 | 1.39 | 1.60 | 1.32 | -0.88 | 18.78 | -13.26 | 20.74 |
| බ්‍රිතාන්‍ය පවුම් | 175.45 | 205.47 | 215.58 | 177.23 | 202.28 | 202.08 | -14.61 | -4.69 | -12.38 | 0.10 |
| එක්සත් ජනපද ඩොලර් | 113.90 | 127.16 | 130.75 | 110.57 | 127.60 | 129.11 | -10.43 | -2.75 | -13.35 | -1.17 |
| විශේෂ ගැනුම් හිමිකම් | 174.87 | 195.31 | 201.36 | 174.54 | 195.38 | 196.19 | -10.47 | -3.00 | -10.67 | -0.42 |
| සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2010 = 100) | වර්ෂය අග දර්ශකය | | | වාර්ෂික සාමාන්‍යය දර්ශකය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම | | | |
| | | | | | | | වර්ෂය අග දර්ශකය | | වාර්ෂික සාමාන්‍යය දර්ශකය | |
| | 2011 | 2012 | 2013 | 2011 | 2012 | 2013 | 2012 | 2013 | 2012 | 2013 |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 101.44 | 90.33 | 90.97 | 99.84 | 90.44 | 91.39 | -10.95 | 0.71 | -9.41 | 1.05 |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 103.83 | 97.85 | 100.31 | 101.84 | 95.80 | 100.61 | -5.76 | 2.51 | -5.93 | 5.02 |


(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. ධන හෝ ඍණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට එරෙහිව පිළිවෙළින් වැඩි හෝ අඩු වීම පෙන්නුම් කරයි.


(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළෙඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24 ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමග සිදු කරන වෙළෙඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. ඍණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම හෝ පහළයාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.14 රූප සටහන** **විනිමය අනුපාතිකයන්ගේ වෙනස්වීම්**





අඩංගු අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වලට එරෙහිව අවප්‍රමාණය වූයෙන් මුදල් වර්ග 5 කින් යුත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතිකය සියයට 0.07 කින් සුළු වශයෙන් අවප්‍රමාණය විය. කෙසේ නමුත්, වෙළෙඳ හවුල්කරුවන්ගේ සහ තරඟකරුවන්ගේ මුදල් වර්ග 24 කින් යුත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතිකය සියයට 0.71 කින් අධිප්‍රමාණය විය. ශ්‍රී ලංකා රුපියල සමහර විදේශ ව්‍යවහාර මුදල්වලට එරෙහිව අධික ලෙස අධිප්‍රමාණය වීම සහ වෙළෙඳ හවුල්කාර සහ තරඟකාරී රටවලට සාපේක්ෂව දේශීය උද්ධමනය වැඩිවීම හේතුවෙන් 2013 වසර තුළ දී මුදල් වර්ග 5 කින් සහ 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතිකයන් පිළිවෙළින් සියයට 1.88 කින් සහ 2.51 කින් අධිප්‍රමාණය විය.

### 5.11.2 දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වර්ධනයන්

දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතු 2012 වසරේ දී නිරීක්ෂණය වූ පහළ යාමට සාපේක්ෂව 2013 වසරේ දී මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය. මූලික වශයෙන් වසරේ මුල් භාගය තුළ ගෝලීය ඉල්ලුම දුර්වල වීමෙහි ප්‍රතිඵලයක් ලෙස විදේශීය වෙළෙඳ කටයුතු මන්දගාමී වීම හේතුවෙන් එතැන් වෙළෙඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2012 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 9,331 හා සැසඳීමේ දී, 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 8,332 ක් (මුළු ගනුදෙනුවලින් සියයට 61 ක්) දක්වා පහත වැටුණි. කෙසේ නමුත්, ඉදිරි වෙළෙඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2012 වසරේ පැවති එ.ජ.ඩොලර් මිලියන 4,089 සිට 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 5,373 ක් දක්වා වර්ධනය විය. සමස්තයක් ලෙස, 2012 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 13,420 ක් වූ මුළු අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු ප්‍රමාණය 2013 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 13,706 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළට ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම, විනිමය අනුපාතිකයේ සැලකිය යුතු උච්චාවචනයන් මැඩපවත්වා ගැනීම සඳහා පමණක් සීමා කෙරුණි. 2012 වසරේ දී එ.ජ.ඩොලර් මිලියන 1,166 ක් ලෙස වාර්තා වූ ශුද්ධ විදේශ විනිමය සැපයීම හා සසඳා බැලීමේ දී 2013 වසර තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීම යටතේ අවශෝෂණය කරගත් ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 436 ක් විය. මෙය, 2013 වසර තුළ දී මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් එ.ජ.ඩොලර් මිලියන 1,139 ක් අවශෝෂණය කරගැනීම සහ එ.ජ.ඩොලර් මිලියන 703 ක් වෙළෙඳපොළට සැපයීමෙහි සමස්ත ප්‍රතිඵලයකි.

2013 වසරේ දී, මාස තුන සහ මාස හය යන කාලපරාසයන් සඳහා වන ඉදිරි විනිමය ගනුදෙනු අධිමිල පොලී අනුපාතික අන්තරයට වඩා තරමක පහළ මට්ටමක පැවතුණි. ජූනි මස මැද සිට එ.ජ.ඩොලරයට

**5.15 රූප සටහන** **කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්**



එරෙහිව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමට අනුරූපව ඉදිරි විනිමය ගනුදෙනු අධිමිල ඉහළ නැගීමට පටන් ගැනුණි. කෙසේ නමුත්, දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළට අනාගතයේ දී මූල්‍ය ප්‍රවාහ ලැබෙනු ඇතැයි යන අපේක්ෂාව සමඟින් 2013 වසරේ අගෝස්තු මස අග භාගයේ සිට මාස තුන හා මාස හය යන කාල පරාසයන් සඳහා වූ ඉදිරි විනිමය ගනුදෙනු අධිමිල පහත වැටුණි. තවද, නුදුරු අනාගතයේ දී රුපියල අධිප්‍රමාණය වනු ඇතැයි යන වෙළෙඳපොළ අපේක්ෂාව පිළිබිඹු කරමින් ඉදිරි විනිමය ගනුදෙනු අධිමිල පොලී අනුපාතික අන්තරයට වඩා පහළින් පැවතුණි. මේ අතර, 2013 වසර තුළ දී, වාණිජ බැංකු තම ශුද්ධ අනාවරණ තත්ත්වය සාමාන්‍යයක් ලෙස ගත්විට අවම එහෙත් ධන මට්ටමක පවත්වාගෙන ඇත. එසේ වුවද, මෑතකාලීනව රුපියල තවදුරටත් අධිප්‍රමාණය වනු ඇතැයි යන වෙළෙඳපොළ අපේක්ෂාවන් නිරූපණය කරමින් සැප්තැම්බර් මස අග සිට 2013 වසරේ අග දක්වා ශුද්ධ අනාවරණ තත්ත්වය සාමාන්‍යයක් ලෙස ගත්විට සෘණ අගයක් වාර්තා කළේය.